1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට* පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, නොච්චියාගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, මාවතකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025 වර්ෂයට පනවා අයකළ යුතු බවත් නොච්චියාගම ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

උපලේඛනය

	රු. ශත
01. බිත්ති, තාප්ප හෝ පුවරුවක් උපයෝගි කර ගන්නා ඕනෑම ප්‍රචාරන දැන්වීමක් සඳහා වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	100 0
02. ස්ථිර දැන්වීම් පුවරු ගාස්තු :	
(i) විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට	75 0
(ii) විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	75 0

	රු. ශත
03. ඉටිරෙදි හෝ රෙදි මගින් දැන්වීම් පුවරු ගාස්තු :	
(i) විනිවිද පෙනෙන දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට	25 0
(ii) විදුලි ආලෝකය කරන ලද දැන්වීම් පුවරුවකට - වර්ග අඩියකට (වසරකින් හෝ ඉන් කොටසක කාලයක් සඳහා)	15 0

12-124/9

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව විවිධ ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඩී. ටී. යූ. ධර්මරාණි වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක NCP/2024/10/23/1006 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදය කරමි.

එස්. ඩී. ටී. යූ. ධර්මරාණි,
ලේකම් හා බලතල, කාර්ය
කර්තව්‍ය ඉටුකරන නිලධාරී,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී ඉටුකරන පහත සඳහන් සේවා සහ වෙනත් ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2025 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත්, නොච්චියාගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශත*
01.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
02.	**කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම :**	
	i. කොන්ත්‍රාත් මුදල රුපියල් ලක්ෂ 5 ට අඩු ව්‍යාපෘති සඳහා	100 0
	ii. කොන්ත්‍රාත් මුදල රුපියල් ලක්ෂ 5-10 අතර ව්‍යාපෘති සඳහා	500 0
	iii. කොන්ත්‍රාත් මුදල රුපියල් ලක්ෂ 10 ට වැඩි ව්‍යාපෘති සඳහා	1,000 0
03.	**අනුබෙදුම් අයදුම්පත්‍රය :**	
	(i) වාණිජ	1,500 0
	(ii) ගෘහස්ථ	100 0
	(iii) අනුබෙදුම් පරීක්ෂණ ගාස්තු	700 0
	(iv) අනුබෙදුම් පෙරසැරි ගාස්තු	500 0
04.	වීථිරේඛා/පවරා නොගැනීමේ සහතික සඳහා පරීක්ෂණ ගාස්තුව	700 0
05.	වීථිරේඛා /පවරා නොගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,000 0
06.	හිමිකම් නිකුත් කිරීමේ ගාස්තු	50 0

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශත*
07.	ගොඩනැගිලි පිළිබඳව සීමාව සහතිකයක් නිකුත් කිරීම	1,000 0
08.	ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු	700 0
09.	ගොඩනැගිලි ඉල්ලුම්පත් ලබා ගැනීම	100 0
10.	දීර්ඝ කාලීන බදු බලපත්‍ර ගාස්තු	1,000 0
11.	(i) පුස්තකාල දඩ අය කිරීම - දිනකට පොත් එකක් සඳහා	5 0
	(ii) පුස්තකාල ඇප තැන්පතු ගාස්තු	150 0
	(iii) **පුස්තකාල සාමාජිකත්වය වාර්ෂිකව අලුත් කිරීම**	
	වැඩිහිටි	100 0
	ළාබාල	75 0
	(iv) පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු	25 0
	(v) **ඡායා පිටපත් ලබා ගැනීම :**	
	• A4 තනි පැත්ත	13 0
	• A4 දෙපැත්ත	16 0
	• Legal තනි පැත්ත	20 0
	• Legal දෙපැත්ත	25 0
	• A3 තනි පැත්ත	15 0
	• A3 දෙපැත්ත	20 0
	(vi) **වෙනත් ගාස්තු :**	
	• අන්තර්ජාල පහසුකම් පැයකට	60 0
	• මාර්ගගත අයදුම් කිරීම්	250 0
	• විභාග ප්‍රතිඵල සහ මුද්‍රණය කිරීම	400 0
	• විද්‍යුත් තැපෑල සඳහා	60 0
	• Scan සඳහා පිටුවක්	60 0
	• වර්ණ පිටපත් A4 තනි පැත්ත	10 0
12.	දේපළ අයිතිය හැරවීමේ අයදුම්පත්‍රය	100 0
13.	**සුසාන භූමි ගාස්තු :**	
	(i) භූමිදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා	50 0
	(ii) තැන්පත් කිරීම සඳහා වර්ග අඩි එකකට	50 0
14.	වරිපනම් තක්සේරු ලේඛනයේ බදු හිමිකම සංශෝධනය කිරීම සඳහා ගාස්තු	1,000 0
15.	වරෙන්තු ගාස්තුව (වරිපනම් බදු/අක්කර බදු) බදු මුදලින්	10%
16.	බොරළු ප්‍රවාහනයේ දී ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් කියුබ් එකක් සඳහා (හානි සිදුවන නිසා) 1 Km	150 0
17.	මාර්ගය දෙපස ඇති අනවසර වෙළෙඳ මැසි සඳහා දෛනික	100 0
18.	මහවැලි ක්‍රීඩාංගනය වෙන් කිරීම එක් දිනයකට	1,500 0
19.	ප්‍රාදේශීය සභාවට අයත් වෙනත් ක්‍රීඩාපිටි දිනකට	500 0
20.	ගලිබවුසරය,	
	(i) වාණිජ	8,500 0
	(ii) ගෘහස්ථ	8,000 0
	(iii) 1 Km	150 0

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශත*
21.	ජල බවුසරය,	5,500 0
22.	JCB යන්ත්‍රය පැයකට	7,000 0
	මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය පැයකට - පැය 01 ක් සඳහා	7,000 0
23.	**ටොන් 08 ගල්රෝල :**	
	(i) දිනකට	40,000 0
	(ii) වරුවකට	20,000 0
24.	**ටොන් 02 ගල්රෝල :**	
	(i) දිනකට	10,000 0
25.	**පානීය ජලය :**	
	(i) ජල සැපයුම් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම	100 0
	(ii) විසන්ධි කළ ජල සම්බන්ධතාවය සන්ධි කිරීමේ ගාස්තු	5,000 0
	(iii) අයථා ජල පරිභෝජනය සඳහා	15,000 0
	(iv) ජල සම්බන්ධතා ගාස්තු	40,799 50
	(v) පරීක්ෂණ මීටරයක් සවි කිරීම	500 0
	(vi) ජල සම්බන්ධතා නාමය වෙනස් කිරීමේ ගාස්තු	1,050 0
26.	සතිපොළ කඩ කාමරයක් සඳහා 8"x10"	150 0
27.	**පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම**	
	(i) 2,50,000.00 හෝ ඊට අඩු පරීක්ෂා කිරීමේ ගාස්තු	3,000 0
	(ii) 2,50,000.00 - 5,00,000.00 පරීක්ෂා කිරීමේ ගාස්තු	3,750 0
	(iii) 5,00,000.00 - 10,00,000.00 පරීක්ෂා කිරීමේ ගාස්තු	5,000 0
	(iv) 10,00,000.00 ට වැඩි	10,000 0
	පරිසර පෝරම ගාස්තු	100 0
	බලපත්‍ර ගාස්තුව	4,500 0

12-124/10

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ගාස්තු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඩී. ටී. යූ. ධර්මරාණි වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක NCP/2024/10/23/1007 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එස්. ඩී. ටී. යූ. ධර්මරාණි,
ලේකම් හා බලතල, කාර්ය
කර්තව්‍ය ඉටුකරන නිලධාරී,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

නොච්චියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 320 කුකුල්කටුව, 322 රනෝරාව අඹගහවැව, 321 ඉට්ටිකුලම, 326 ඇහැටුවාගම, 327 හුණුවිලගම, 329 කටුපත්වැව, 330 පහලමාරගහවැව තල්ගස්වැව, 355 හොරුවිල හැර අනෙකුත් සියලුම ග්‍රාම සේවා වසම් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 වැනි වගන්තිය යටතේ නාගරික අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති හෙයින් (අංක 1197/11-2001 අප්‍රේල් 10 අඟහරුවාදා *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් එම ප්‍රදේශයේ

ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධව අංක 1597/08 දරන 2009 අප්‍රේල් 17 සිකුරාදා *ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි ගාස්තු අයකිරීමට සුදුසු බවට යෝජනා කරමි. තව ද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයට අයත් නොවන ප්‍රදේශ සඳහා ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීමේ දී වර්ග අඩියකට රු. 1.00 ක් ද (නේවාසික) වාණිජ සඳහා රු. 2.00 බැගින් ද, 2025 වර්ෂයේ දී පනවා අයකිරීම සඳහා යෝජනා කරන්නීය.)

12-124/11

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඩී. ටී. යූ. ධර්මරාණි වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 (1) අ, ආ, ඇ උප වගන්තිය යටතේ ඇති විධිවිධාන ප්‍රකාරව 2024 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක NCP/2024/10/23/1008 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එස්. ඩී. ටී. යූ. ධර්මරාණි,
ලේකම් හා බලතල, කාර්ය
කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) අ, ආ, ඇ උපවගන්ති යටතේ නොච්චියාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නොච්චියාගම බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොකළ ඉඩමකින් එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% නොඉක්මවන බද්දක් වාර්ෂිකව එම ඉඩම අයිතිකරුගෙන් අයකර ගැනීමට සුදුසු බව ඉහත සඳහන් කමිටුවෙන් තීරණය විය.

ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය අනුව නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත සඳහන් පරිදි බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

12-124/12

නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඩී. ටී. යූ. ධර්මරාණි වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ සඳහන් පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයේ ඔක්තෝබර් මස 23 වැනි දින තීරණ අංක NCP/2024/10/23/1009 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එස්. ඩී. ටී. යූ. ධර්මරාණි,
ලේකම් හා බලතල, කාර්ය
කර්තව්‍ය ඉටුකරන නිලධාරි,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

267 වන අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙම සභාව විසින් සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම සඳහා අය කර ගනු ලබන ගාස්තුවලින් 20%ක බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

12-124/13

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභාවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 160(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැලියගොඩ නගර සභා බලප්‍රදේශය සඳහා 2025 වර්ෂයට වරිපනම් බදු නියම කිරීම 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1639 යටතේ පහත සඳහන් පරිදි තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

තීරණය

එනම් 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 238 (1) වන වගන්තියෙන් පැලියගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියළුම නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2024 වර්ෂය සඳහා බලාත්මක වූ වාර්ෂික තක්සේරු වටිනාකම 2025 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම ලෙස පිළිගැනීමටත්, එකී තක්සේරුව මත 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වන වගන්තියේ 1 උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වෙළෙඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා එකී දේපළෙහි වාර්ෂික වටිනාකම 7% ක් ද, නේවාසික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා ඇති දේපළෙහි වාර්ෂික වටිනාකම 6%ක වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවත්, එකී බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දිනයන්හි හෝ ඊට ප්‍රථම සමාන කොටස් හතරකින් හෝ සම්පූර්ණයෙන්ම හෝ ගෙවිය යුතු බවටත්, 2025 වර්ෂයට නියමිත සම්පූර්ණ වරිපනම් බදු මුදල් එම වර්ෂයේ ජනවාරි 31 දිනට හෝ ඊට පෙර ගෙවා අවසන් කරන්නේ නම් එම බදු මුදලින් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට නියමිත බදු මුදල අදාළ කාර්තුවේ පළමු මස තුළ ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% වට්ටම සඳහා හිමිකම* *ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2025 මාර්තු මස 31 දිනට පෙර	ජනවාරි 31
දෙවන කාර්තුව	2025 ජූනි මස 30 දිනට පෙර	අප්‍රේල් 30
තෙවන කාර්තුව	2025 සැප්තැම්බර් මස 30 දිනට පෙර	ජූලි 31
හතරවන කාර්තුව	2025 දෙසැම්බර් මස 31 දිනට පෙර	ඔක්තෝබර් 31

12 - 126/1

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභාවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 162(1) වගන්තිය හා 164(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 2015.12.28 දිනැති 1947/7 දරන *ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත්කළ සම්මත

අතුරු ව්‍යවස්ථාව හා 2022.11.17 දිනැති 2306/50 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නිවේදනයේ ප්‍රකාශයට පත් කළ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ප්‍රකාරව පෑලියගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම 2024 සැප්තැම්බර් මස 24 වනි දින තීරණ අංක 1640 යටතේ පහත සඳහන් පරිදි තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පෑලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පෑලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පෑලියගොඩ නගර සභාව,
පෑලියගොඩ.

තීරණය

එනම් 255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සහ 164 වන වගන්තිය යටතේ පෑලියගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පෑලියගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින්, 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට ද, තවද එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටදී ඊට අදාල බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පෙර වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙසත් ඒ හෝටලය, ආපන ශාලාව, නවාතැන්පොල ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව එම ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

I කොටස

අනු අංකය	*I වැනි තීරය* *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6	කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7	ලැගුම් නිවාස පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9	කිරිහලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11	ආහාර විකිණීම	500 0	750 0	1,000 0
12	පිටිවලින් සාදන ආහාර විකිණීම	500 0	750 0	1,000 0
13	රස කැවිලි විකිණීම	500 0	750 0	1,000 0

අනු අංකය	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරය	II වැනි තීරය	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
14	සරුවත් පැණි බීම විකිණීම	500 0	750 0	1,000 0
15	පලතුරු විකිණීම හෝ කල්තබා ගැනීම	500 0	750 0	1,000 0
16	මාළු විකිණීම	500 0	750 0	1,000 0
17	මස් විකිණීම	500 0	750 0	1,000 0
18	අයිස් නිෂ්පාදනය, විකිණීම	500 0	750 0	1,000 0
19	සිසිල් බීම විකිණීම, නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21	කොණ්ඩා සැකසීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22	කොණ්ඩා කැපීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
23	මී කිරි අලෙවිය	500 0	750 0	1,000 0
24	ගවගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
27	එළවළු හා පළතුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

11 කොටස

අනු අංකය	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරය	II වැනි තීරය	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
ජීඩාකාරී ව්‍යාපාර :				
1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	සම්පදම් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	සම් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර) සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ඡායාරූප ශාලාවක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	පශු වෛද්‍ය ගිලන්හලක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*I වැනි තීරය*	*II වැනි තීරය*	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
9.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩා කිරීමේ ස්ථානයක් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව අටකටු ඇඹරීම හෝ තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බන් ද්‍රව්‍ය ගඩබා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	රස කැවිලි වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	පොල් ලෙලි පෙඟවීමේ (හෝ පල් කිරීම) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීමේ (දත් බුරුසු හැර) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	සම්භාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	කපුරු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ලාකඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	පාසල් රටහුණු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	ටයර් නැවත පිරවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු අංකය	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරය	II වැනි තීරය	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
43.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම			

III කොටස

අන්තරාදායක ව්‍යාපාර :

01.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03	මුද්‍රණාලයක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	දර ගබඩාවක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් සිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	අයිස් ක්‍රීම් නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු අංකය	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරය	II වැනි තීරය	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤ, ගබඩා කිරීම හෝ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	දූව ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ආහාර නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

IV කොටස

අනු අංකය	බලය දෙනු ලබන කාර්යය	I වැනි තීරය	II වැනි තීරය	
		පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
පීඩාකාරී අන්තරායදායක ව්‍යාපාර :				
01.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු අංකය	*I වැනි තීරය* *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
04.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	මෝටර් වාහන සේවා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බෙළෙක් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පෙට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගඩබා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ලොන්ඩරි, රෙදි සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 126/2

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභාවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 165 (අ) වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති විධිවිධාන ප්‍රකාරව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට

අදාළව කර්මාන්ත බදු නියම කිරීම 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1641 යටතේ පහත සඳහන් පරිදි තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

තීරණය

එනම් 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 (අ) වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා පැනවීමට මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්ය		*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කපු නූල් නිපදවීමේ කර්මාන්තයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
03.	අත් වැසුම්, මුහුණු ආවරණ නිෂ්පාදනය හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
04.	බෝට්ටු නිෂ්පාදනය කිරීම හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
05.	සයිලන්සර් නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
06.	මෝටර් රථ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	කේබල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	කම්බි ඇණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	අභ්‍යාස පොත් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	පැන්සල්, පෑන්, පැන්සල්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	රබර් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12.	කාඩ්බෝඩ් පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	මදුරු දැල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
15.	බිම්මල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16.	දූන්වීම් පුවරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
17.	පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	චොකලට් වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19.	කිරිපිටි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20.	සුදු යකඩ භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
21.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
22.	කටු කම්බි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
23.	ඉන්ජෙක්ටර් මෝල්ඩ් සෑදීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0

	I වැනි තීරය	*II වැනි තීරය*		
	බලය දෙනු ලබන කාර්ය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
24.	සෙලෝටේප් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
25.	පාවහන් නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
26.	කුෂන් වැඩපල	500 0	750 0	1,000 0
27.	දියමන්ති මැණික් ඔප දැමීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
28.	නූඩ්ල්ස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
29.	සංගීත භාණ්ඩ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
30.	පානීය ජලය බෝතල්ගත කිරීමේ කර්මාන්තය	500 0	750 0	1,000 0
31.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානය	500 0	750 0	1,000 0
32.	ලියුම් කවර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
33.	විසිතුරු භාණ්ඩ හෝ සෙල්ලම් බඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
34.	ජුකී මැෂින් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
35.	ජංගම දුරකථන අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
36.	ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
37.	මස් වර්ග ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
38.	අමානෝ තහඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
39.	ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
40.	ස්ටිකර් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
41.	පොලිතීන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
42.	ටේලර් සාප්පුව	500 0	750 0	1,000 0

12 - 126/3

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභාවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමග කියවිය යුතු නගර සභා ආඥාපනතේ 165 (ආ) (1) වැනි උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1642 යටතේ පහත සඳහන් පරිදි තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

තීරණය

එනම් 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 (ආ) වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ පැලියගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක්

ලබා ගැනීම හෝ එම පනතේ 165 (අ) (1) වන වගන්තිය යටතේ පනවන ලද යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පැනවීමට මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
ව්‍යාපාරයෙන් 2024 වර්ෂයේ ලැබීම්	*ගෙවිය යුතු බද්ද රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු.1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12 - 126/4

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන ගාස්තු නියම කිරීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභාවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 162 වැනි වගන්තියේ විධිවිධාන යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 2015.12.28 දිනැති 1947/7 අංක දරන *ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත්කළ සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව 2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීම සඳහා 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1643 යටතේ පහත සඳහන් පරිදි තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

තීරණය

එනම්, 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 162 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව හා 2015.12.28 දිනැති 1947/7 අංක දරන *ගැසට්* නිවේදනයේ ප්‍රකාශයට පත්කළ සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකළ යුතු බවට තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග මීටර ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණයොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

12 - 126/5

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභාවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමඟ කියවය යුතු නගර සභා අඥාපනතේ 162 වන වගන්තිය හා 163 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1644 යටතේ පහත සඳහන් පරිදි විය යුතු යැයි මම තීරණය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

එනම් 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 162 හා 163 වගන්ති සහ තුන්වන උපලේඛනයේ විධිවිධාන යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පැලියගොඩ නගර සභා බලප්‍රදේශය තුළ 2025 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, ජින් රික්ෂෝවක්, ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුවකට	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
(*අ*) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	10 0
(*ආ*) වෙළෙඳ කාර්යය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	5 0
සෑම කරත්තයක් සඳහාම	20 0
සෑම අත් කරත්තයක් සඳහාම	10 0
සෑම රික්ෂෝවක් සඳහාම	7 50
සෑම අශ්වයකු, පෝනියකු හා කොටළුවකු සඳහාම	15 0
සෑම අලියෙකු සඳහාම	50 0

12 - 126/6

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභාවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම, නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු නගර සභා ආඥාපනතේ 165 (ඇ) (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1646 යටතේ පහත සඳහන් පරිදි විය යුතු යැයි මම තීරණය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

එනම් 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184(අ) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 165 (ඇ)(1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සුදුසු වන විටක හෝ *ස්ථාවර නැනහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය යෝජනා සම්මතයක් මගින් සභාව නියම කරනු ලැබූ නියමිත අනුපාතයට අඩුනම් හෝ *ස්ථාවර නැනහොත්* නිතිපතා කෙරෙන ගොවිතැනකට ඒ ඉඩම යොදවා නැත්නම් ඒ ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකකට (2%) නොවැඩි ප්‍රමාණයක බද්දක් පහත උපලේඛනයේ පරිදි 2025 වර්ෂයට පනවා අය කළ යුතු බව මම තීරණය කරමි.

උපලේඛනය

	I තීරුව	*II තීරුව*
	ඉඩමේ ප්‍රමාණය	ප්‍රාග්ධන අගයෙන් ප්‍රතිශතය (%)
1-1	පර්චස් 10 සිට 20 දක්වා	0.5%
1-2	පර්චස් 21 ට වැඩි සියලුම ඉඩම් සඳහා	1%

12-126/7

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂයට අදාළව ඇතැම් ඉඩම් විකිණීම මත බදු පැනවීම

පැලියගොඩ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටු කරන පැලියගොඩ නගර සභවේ ලේකම් කුෂ්ලානි තරංගා ගම්ලත් වන මම නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු නගර සභා අඥාපනතේ 165 (ඇ) (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පැලියගොඩ නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ඇතැම් ඉඩම් විකිණීම මත බදු නියම කිරීම 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1645 යටතේ පහත සඳහන් පරිදි විය යුතු යැයි මම තීරණය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

තීරණය

එනම් 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 165 (ඇ) (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පැලියගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු *නැතහොත්* වෙනත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැතහොත්* වෙනත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත්, ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් එසේ ඒ ඉඩම් විකුණාලත් මුදලින් 2025 වර්ෂය වෙනුවෙන් පැලියගොඩ නගර සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

12-126/8

පැලියගොඩ නගර සභාව

2025 වර්ෂයට සේවා ගාස්තු පැනවීම

පැලියගොඩ නගර සභාවේ 2025 වර්ෂයට සේවා සඳහා ගාස්තු පනවා අයකිරීමට 2024 සැප්තැම්බර් මස 24 වැනි දින තීරණ අංක 1647 යටතේ පහත සඳහන් පරිදි විය යුතු යැයි මම තීරණය කරමි.

කුෂ්ලානි තරංගා ගම්ලත්,
නගර සභාවේ ලේකම් හා පැලියගොඩ නගර සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
පැලියගොඩ නගර සභාව,
පැලියගොඩ.

අනු. අංකය	*විස්තරය*	*සංශෝධිත ගාස්තුව රු. ශත*
ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම		
01.	වරිපනම් ලේඛනයේ උධෘත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව	200 0
02.	වීථි රේඛා සහතිකය ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව	200 0
03.	නොපරවා ගැනීමේ සහතිකය ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව	250 0
04.	වරිපනම් ලේඛන ප්‍රතිශෝධනය සඳහා ඔප්පු සාරාංශ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	250 0
05.	සංචාරක වෙළඳාමට අවසරපත් ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
06.	ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	500 0
07.	කර්මාන්තශාලා අපද්‍රව්‍ය බැහැරකිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
08.	ගලි රථ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
09.	පරිසර බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ගාස්තුව	250 0
10.	කොඩි කණු ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
11.	ක්‍රීඩා පිටිය වෙන්කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
12.	ප්‍රජාශාලා ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
13.	පා පැදි බලපත්‍රය ඉල්ලුම්පත්‍ර ගාස්තුව	10 0
14.	බැකෝ රථ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
15.	ගොඩනැඟිලි ඉල්ලුම්පත්‍ර ගාස්තුව	1,000 0
16.	බිම් කට්ටි ඉල්ලුම්පත්‍ර ගාස්තුව	1,000 0
17.	පෙර පාසල් ඇතුළත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තුව	1,000 0
18.	තලන යන්ත්‍රය ලබා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍ර ගාස්තුව	200 0
සහතිකපත්‍ර නිකුත් කිරීම		
01.	අමතර තක්සේරු දැන්වීමක් ලබා දීමේ ගාස්තුව	100 0
02.	වරිපනම් උධෘත සහතික ලබාදීමේ ගාස්තුව (එක් වරිපනම් අංකයක් සඳහා එක් අවුරුද්දකට)	100 0
03.	නොවරවා ගැනීමේ සහතිකපත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව	1,000 0
04.	වීථි රේඛා/ ගොඩනැගිලි සහතිකපත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව	1,000 0
05.	හිමිකම් සහතිකපත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව	500 0
06.	වෛද්‍ය සහතිකපත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව	500 0
07.	**අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු :**	
	නේවාසික සඳහා - වර්ග මීටර 300ක් හෝ 300 ට අඩු	3,000 0
	වැඩිවන වර්ග මීටර් 01 හෝ ඉන් කොටසක් සඳහා	10 0 බැගින්
	වාණිජ සඳහා - වර්ග මීටර 300ක් හෝ 300 ට අඩු	3,000 0
	වැඩිවන වර්ග මීටර් 01 හෝ ඉන් කොටසක් සඳහා	20 0 බැගින්
	දුරකථන සම්ප්‍රේෂණ කුළුණු උස මීටර් 05 සිට උස මීටර් 20 දක්වා	2,000 0
	වැඩිවන වර්ග මීටර් 01 හෝ ඉන් කොටසක් සඳහා	100 0 බැගින්
	(නාගරික සංවර්ධන පනත ප්‍රකාරව කලින් කලට පනවනු ලබන ගාස්තු සංශෝධන ඇතුළත් වේ)	
08.	පාපැදි සඳහා බලපත්‍ර ගාස්තුව	5 0

අනු. අංකය	*විස්තරය*	*සංශෝධිත ගාස්තුව රු. ශත*
ගාස්තු අය කිරීම		
01.	අනු පිටපත් ලබා දීමේ ගාස්තු (සහතික කළ එක් පිටපතක් සඳහා)	500 0
02.	පුස්තකාල සාමාජික ගාස්තු	
	අවු. 12 අඩු	50 0
	අවු. 12 වැඩි	100 0
03.	පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තු	50 0
04.	පුස්තකාල පොත් භාරදීමේ ප්‍රමාද ගාස්තු	
	දින 14 පසු එන,	
	දින 01 සිට දින 30 දක්වා	1 0
	දින 31 සිට දින 90 දක්වා	40 0
	දින 91 සිට දින 108 දක්වා	80 0
	දින 108 ට වැඩි දින සඳහා	100 0
	(මෙම ගාස්තු එක් පොතක් සඳහා අදාළ වේ.)	
05.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව	2,000 0
06.	**කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව**	
	01. මාර්ග, කාණු, ගොඩනැගිලි සහ ක්‍රීඩා භූමි සකස් කිරීමේ ආදි සිවිල් ඉංජිනේරු වැඩ සඳහා	
	රු. 2000,000.00 දක්වා	5,000 0
	රු. 1000,000.00	2,500 0
	02. ආදාහනාගාර ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම	3,000 0
	රු. 2000,000.00 දක්වා	1,000 0
	03. ඇලුමිනියම් පාර්ටිෂන් කිරීම හා එහි අළුත්වැඩියාවන් සිදු කිරීම	500 0
	රු. 2000,000.00 දක්වා	500 0
	04. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම (සීමා නොමැත)	
	05. පුහුණු ශ්‍රමිකයන් (පෙදරේරු, වඩු කාර්මිකයන්, කම්බි නැවුම්කරු) සැපයීම, (සීමා පැනවීම් නොමැත)	
07.	**බැකෝ යන්ත්‍රය සඳහා**	
	බැකෝ පැයක් සඳහා අයකරන අවම ගාස්තුව (අවම පැය ගණන 03ක් විය යුතු ය)	5,000 0
	බල ප්‍රදේශයෙන් පිටත ප්‍රවාහන ගාස්තු කි. මී. 01 කට	200 0
08.	<u>ගලි රථය සඳහා</u>	
	බල ප්‍රදේශය තුළ නේවාසික	7,500 0
	බල ප්‍රදේශය තුළ වාණිජ	9,500 0
	<u>ගලි රථය සඳහා</u>	
	බල ප්‍රදේශය පිටත නේවාසික	9,500 0
	බල ප්‍රදේශය පිටත වාණිජ	10,500 0
	බල ප්‍රදේශයෙන් පිටත ප්‍රවාහන ගාස්තු කි. මී. 01 කට	200 0

අනු. අංකය	*විස්තරය*	*සංශෝධිත ගාස්තුව රු. ශත*
09.	**ආදාහනාගාර සඳහා**	
	බල ප්‍රදේශයේ පදිංචි	6,000 0
	බල ප්‍රදේශයෙන් පිටත	8,000 0
10.	**කොඩි කණු සඳහා**	
	එක් කොඩි කණුවකට	100 0
	කොඩියක් සමඟ කණුවකට	150 0
	(ව්‍යාපාරික ස්ථාන සඳහා පමණි)	
	කොඩි කණු 10-50 දක්වා තැන්පත් මුදල්	5,000 0
	කොඩි කණු 50-100 දක්වා තැන්පත් මුදල්	10,000 0
	කොඩි කණු 1-10 අතර	ඇපයක්
11.	**මාර්ග පලුදු කිරීමේ ගාස්තු**	
	කාපට් ස්ථරය සඳහා	4,500 0
	කොන්ක්‍රීට් ස්ථරය සඳහා	3,500 0
	තාර ස්ථරය සඳහා	3,000 0
	(මූලික ගාස්තුවට අමතරව සේවා ගාස්තු ලෙස 20%ක් ද ඇතුළත් වේ)	
	බොරලු මාර්ග සඳහා ගාස්තු අය නොකෙරේ. (අයදුම්කරු විසින් මාර්ගය යථා තත්වයට පත් කළ යුතුය)	
12.	**කැනපි සහ පුටු ලබා දීම**	
	• බල ප්‍රදේශය තුළ උත්සව සඳහා (කැනපි 1)	5,000 0
	• පුටු 50 - එක් පුටුවක්	10 0
	• මළගෙවල් සඳහා (බල ප්‍රදේශය) (කැනපි 1/පුටු 50)	3,500 0
13.	**බිම් කුලී**	
	නගර සභා බල ප්‍රදේශයේ නගර සභාව විසින් පාලනය කරන මං මාවත් සඳහා බිම් කුළී වශයෙන් වර්ග අඩියකට යටත්ව ගාස්තු අය කිරීම.	500 0
14.	**කුණු කසළ ඉවත් කිරීම (කිලෝ 1ක් සඳහා)**	
	1. හෝටල් (දේශීය/ විදේශීය)	20 0/ 25 0
	2. නේවාසිකාගාර/ හෝටල්	22 0
	3. අවන්හල්/ ආහාර ලබාගනු ලබන ස්ථාන/ උත්සවශාලා	25 0
	4. සුපිරි වෙළඳසැල්	25 0
	5. එළවළු/පළතුරු/මාළු/මස් වෙළඳසැල්	15 0
	6. කර්මාන්තශාලා (උපද්‍රවකාරී නොවන) ගබඩා සංකීර්ණය	20 0
	7. පුද්ගලික රෝහල්/ සාත්තු නිවාස හා බෙහෙත් ශාලා (අසාදිත නොවන)	15 0
	8. අනෙකුත් වාණිජ ආයතන (රාජ්‍ය/ පුද්ගලික)	10 0
	9. සේවා සපයනු ලබන ආයතන (රාජ්‍ය/පුද්ගලික)	10 0
	10. ආගමික ස්ථාන	නිදහස්

අනු. අංකය	*විස්තරය*	*සංශෝධිත ගාස්තුව රු. ශත*
15.	**ප්‍රජාශාලාව වෙන් කිරීම**	
	බල ප්‍රදේශය තුළ	25,000 0
	බල ප්‍රදේශයෙන් පිටත	30,000 0
	තැන්පතු මුදල	5,000 0
	වැඩිවෙන පැයකට ගාස්තු	2,000 0
	වැඩිවෙන විදුලි බුබුළු සඳහා	1,000 0
16.	**ක්‍රීඩාපිටිය වෙන් කිරීම**	
	ක්‍රීඩාපිටිය වෙන් කිරීමේ ගාස්තුව	10,000 0
	තැන්පතු මුදල	3,000 0
	සංදර්ශන, සැණකෙලි හා විනෝද ක්‍රීඩා සඳහා වෙන් කිරීමේ ගාස්තු	15,000 0
	වැඩිවෙන පැයකට ගාස්තු	1,000 0
17.	පාරවල් හා මංමාවත්වල සංදර්ශන පැවැත්වීම සඳහා	දිනකට 5,000 0
18.	සංචාරක වෙළඳාමට අවසරපත් ලබාගැනීමේ ගාස්තුව	1,500 0

කේෂත්‍ර ගාස්තු පරීක්ෂණ ගාස්තු අය කිරීම (2022.11.17 දිනැති 2306/50 දරන අති විශේෂ ගැසට් පත්‍රය පරිදි)		*පරීක්ෂණ ගාස්තුව (රු. ශත)*
01.	ලැගුම්හල් හා නවාතැන් ස්ථාන නියාමනය සම්බන්ධයෙන් වන පරීක්ෂණ ගාස්තුව	900 0
02.	භෝජනාගාර කිරීම සම්බන්ධයෙන් වන පරීක්ෂණ ගාස්තුව	500 0
03.	පීඩාකාරී හා අන්තරාදායක වෙළඳාම් සම්බන්ධයෙන් වන පරීක්ෂණ ගාස්තුව	900 0
04.	පෞද්ගලික අධ්‍යාපන ආයතන කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	900 0
05.	කොණ්ඩා කපන ස්ථන කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	900 0
06.	උත්සවශාලා කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	900 0
07.	රූපලාවන්‍යාගාර මධ්‍යස්ථාන කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	900 0
08.	ලොන්ඩරි/රෙදි සේදීමේ ස්ථාන පවත්වාගෙන යාම කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	900 0
09.	ආහාර නිෂ්පාදන ස්ථාන කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	900 0
10.	හෝටල් කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	900 0
11.	එළවළු හා පළතුරු විකුණන ස්ථාන කිරීම පිළිබඳ පරීක්ෂණ ගාස්තුව	750 0

පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 (1) (ඇ) වගන්තිය යටතේ සාදන ලද 1988.08.23 දිනැති අංක 520/07 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කොට ඇති 2011.04.15 දිනැති අංක 1702 දරන *ගැසට් පත්‍රය* මගින් පස්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ව්‍යාපාර ස්ථාන හෝ පරිශ්‍රයන් පවත්වාගෙන යන සෑම තැනැත්තෙකු විසින්ම බලපත්‍රයක් ලබා ගත යුතු බවත්, උපලේඛන අංක 01 ලෙස පහත දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුකූලවන ආකාරයට එකී බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/10/01/07 යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එමෙන්ම 1987 අංක 15 දරන ප්‍රාදේශය සභා පනතේ 122 වන වගන්තිය අනුව සාදන ලද 520/07 දරන 1988 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කොට ඇති එකී නිවේදනයේ 21 වන වගන්තියට අනුව අප්‍රසන්න හා අන්තරායදායක වෙළෙඳාමක් ලෙස හඳුන්වා ඇත්තා වූ සියලුම ව්‍යාපාර ස්ථාන සඳහා පහත උපලේඛන 02 හි සඳහන් පාර්ශවයන් හා ස්ථානයන් සඳහා උපලේඛන අංක 01 හි සඳහන් අනුප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අය කිරීමට තීරණය කොට ඇති බව වැඩිදුරටත් නිවේදනය කරමි.

තව ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147(01) උපවගන්තියේ (ඇ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සියලු ව්‍යාපාර ස්ථාන පවත්වාගෙන යනු ලබන අයවලුන් විසින් ඉහත සඳහන් ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2025.03.31 දිනට පෙර සිදු කළ යුතු බව ද තවදුරටත් නිවේදනය කරමි.

ඉහතින් දක්වා ඇති පරිදි කටයුතු කිරීම පැහැර හරිනු ලබන සෑම තැනැත්තෙකු සම්බන්ධයෙන් ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (04) වගන්තිය ප්‍රකාරව අධිකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සිදු කරනු, ලබන බව ද මෙයින් නිවේදනය කරමි.

ආර්. දිනූෂා ලක්මාලි,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව,
උඟරුබොක්ක.

2024 ඔක්තෝබර් මස 08 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

බලපත්‍ර ගාස්තු

උපලේඛනය - අංක 01

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	ව්‍යාපාරයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 දක්වා*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ලැඟුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 දක්වා	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
03.	බත් කඩයක්/භෝජන ශාලාවක් හා තේ/කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	රස කැවිලි හා පිසින ලද ආහාර නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කිරි පට්ටි හා කිරි නිෂ්පාදන වෙළඳාම් කරන ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	මාළු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	මස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පෞද්ගලික වෙළෙඳපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	බාබර් සාප්පුවක් /කොණ්ඩා සැකසීමේ සැලුන් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සිසිල් බීම/ යෝගට් අයිස් ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
13.	ඖතක මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
15.	සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්/ ආපන ශාලා/ ලැගුම්හල්/ රෙස්ටුරන්ස්	500 0	750 0	1,000 0

12 - 208/1

පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තිය යටතේ කර්මාන්ත ගාස්තු පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 150 වගන්තයේ (01) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන යම් කර්මාන්තයක් වෙනුවෙන් 2025 වර්ෂය සඳහා බද්දක් අය කිරීමට පහත උපලේඛනයේ දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුකූලව කර්මාන්ත බද්දක් පනවා අය කිරීමට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/10/01/09 යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එමෙන්ම පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යම් කර්මාන්තයක් හෝ පරිශ්‍රයන් පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් විසින්ම පහත උපලේඛනයේ I තීරයේ ස්වභාවය සම්බන්ධයෙන් II තීරයේ සඳහන් අනුප්‍රමාණයෙන් යුත් කර්මාන්ත බද්දක් 2025 වර්ෂයේ පනවා අය කිරීමටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (3) උපවගන්තිය යටතේ යම් තැනැත්තෙක් පවත්වාගෙන යනු ලබන කර්මාන්තයක් වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල 2025 වර්ෂයේ ජූනි 30 දිනට පෙර පස්ගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව දැනුම් දෙමි.

තව ද, එකී මුදල ගෙවීම පැහැරහරිනු ලබන්නේ නම් එකී තැනැත්තාට විරුද්ධව අධිකරණයෙන් නඩු පැවරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ 04වන උපවගන්තිය යටතේ සභාවට බලතල පැවරී ඇති බව ද තවදුරටත් දැනුම් දෙමි.

ආර්. දිනූෂා ලක්මාලි,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව,
උහරුබොක්ක.

2024 ඔක්තෝබර් මස 08 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

කර්මාන්ත බදු

අනු. අංකය	*I වැනි තීරුව* *ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750.00 නොඉක්මවන විට	*රු. 750.00 සිට රු. 1,500.00 දක්වා*	*රු. 1,500.00ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	හුණු පිළිස්සීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ප්ලාස්ටික්, ෆයිබර් ග්ලාස් නිෂ්පාදන සිදුකරන කර්මාන්ත	500 0	750 0	1,000 0
03.	පුවක් වේලා සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	පැණි නිපදවීමේ/ හකුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	සාමාන්‍ය කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	විකිණීම සඳහා මිනිස් ශ්‍රමයෙන් ගල් කැඩීම	500 0	750 0	1,000 0
08.	විකිණීම සඳහා බිම් මල් වගා කිරීම	500 0	750 0	1,000 0
09.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	දුම්කොළ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කුකුලු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	කොප්පරා නිපදවන/ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	හඳුන්කුරු/ඉටිපන්දම්/පහන්තිර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	රෙදි මෝස්තර මුද්‍රණ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	විකිණීම සඳහා කුමන වර්ගයක හෝ පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	ව්‍යාපාරයේ ස්වභාවය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750.00 නොඉක්මවන විට	*රු. 750.00 සිට රු. 1,500.00 දක්වා*	*රු. 1,500.00ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
20.	විසිතුරු භාණ්ඩ හෝ අත්කම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ලියුම් කවර නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
22.	ඉදල්/ කොහු/ පාපිසි නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	වෙළෙඳාම සඳහා වැලි ගොඩදැමීම	500 0	750 0	1,000 0
24.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සැණකෙළි භූමිවල තාවකාලික ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	බැටරි චාජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	විද්‍යුත් ලෝහාලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ගඩොල් සකස් කිරීමේ හා පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0

12 - 208/2

පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය යටතේ දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 (1) (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දිනැති අංක 520/07 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කොට ඇති 2011.04.15 දිනැති අංක 1702 දරන *ගැසට්* පත්‍රය මගින් පස්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති ප්‍රචාරක දැන්වීම් දෘශ්‍ය පරිසර අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය යටතේ පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ කිසියම් තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇළකට, දොළකට, වැවකට, අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් උපලේඛනයේ 01 තීරුවේ නිරූපිත යම් ප්‍රචාරක දැන්වීමක් සඳහා 02 තීරුවේ නිරූපිත සීමාවන් තුළ අනුරූප සටහනේ අනුප්‍රමාණ බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/10/01/10 යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එමෙන්ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147(1) (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සියලු ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය කරනු ලබන අයවලුන් විසින් දැන්වීම හෝ ප්‍රචාරක පුවරුව ස්ථාපිත කිරීමට පෙර ඉහත සඳහන් ගාස්තුව ගෙවීමෙන් අනතුරුව බලපත්‍රයක් ලබා ගැනීම සිදු කළ යුතු බව තවදුරටත් නිවේදනය කරමි.

ඉහතින් දක්වා ඇති පරිදි කටයුතු පැහැරහරිනු ලබන සෑම තැනැත්තෙකු සම්බන්ධයෙන් ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (01) වගන්තිය සමඟ කියවිය යුතු 2011.04.15 දිනැති අංක 1702 දරන *ගැසට්* පත්‍රය මගින් 2011.04.15 සිට පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන 1988.08.23 දිනැති අංක 520/07 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කර ඇති 39(1)

අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් බලපත්‍රයක් නොමැතිව දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම එකී *ගැසට්* පත්‍රයේ 39 (15) යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරනු ලබන බැවින් එකී තැනැත්තන්ට එරෙහිව අධිකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමද සිදු කරනු ලබන බව නිවේදනය කරමි.

ආර්. දිනූෂා ලක්මාලි,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව,
උහරුබොක්ක.

2024 ඔක්තෝබර් මස 08 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු අංකය	*01 වැනි තීරුව*	*02 වැනි තීරුව* *වර්ග අඩි එකකට රු. ශත*
01	ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා	100 0
02	ප්‍රදර්ශනය කරනු ලබන බැනර් එකක් හා කටවුටි එකක් සඳහා	65 0
03	බිත්තිවල පින්තාරු කරන ලද දැන්වීම් සඳහා	100 0

04. ඩිජිටල් හෝ එල්. ඊ. ඩී. බල්බවලින් ක්‍රියා කරන දැන්වීම් පුවරු සඳහා එක් දැන්වීමකට දිනකට රු. 20.00

12 - 208/3

පස්ගොඩ ප්‍රාදේශීය සභාව

අක්කර බද්ද අය කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් දක්වා ඇති ආකාරයට පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක ම 2024 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යාක්ෂණය 2025 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමටත්,

134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති *ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයකින් අක්කර බදු නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් 01කට නොඅඩු එහෙත් හෙක්ටයාර් 05ට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (රු. 50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩිවන සෑම ඉඩකටම සෑම හෙක්ටයාරයකට ම රුපියල් දහය (රු. 10.00) බැගින් වූ අක්කර බද්දක් 2025 වර්ෂයේ දී පනවා අයකිරීමට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/10/01/06 යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එසේම 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යටොක්ත බද්ද 2025 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසාන වන කාර්තු 04 තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්ද ගෙවීමට යටත් සෑම තැනැත්තෙකුට ම තවදුරටත් දන්වා සිටිමි.

එමෙන්ම 2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බදු 2025 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලබන බව ද මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

ආර්. දිනූෂා ලක්මාලි,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව,
උරුබොක්ක.

2024 ඔක්තෝබර් මස 08 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

12 - 208/4

පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තිය යටතේ ව්‍යාපාර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 152 වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 147 වැනි වගන්තිය හෝ එකී පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ හා එකී පනතේ 150 (1) වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම 2025 වර්ෂය සඳහා ව්‍යාපාර ගාස්තුවක් පනවා අය කිරීමට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 2024/10/01/08 යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහතින් දක්වා ඇති ව්‍යාපාරයක් වෙනුවෙන් 2024 වර්ෂයේ ලැබීම් පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2025 වර්ෂයේ ජූනි 30 දිනට පෙර පස්ගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව තීරණය කරමි.

තව ද, එකී මුදල පැහැරහරිනු ලබන්නේ නම්, එකී තැනැත්තාට විරුද්ධව අධිකරණයේ නඩු පැවරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (04) වන උපවගන්තිය යටතේ සභාවට බලතල පැවරී ඇති බව ද තවදුරටත් දැනුම් දෙමි.

ආර්. දිනූෂා ලක්මාලි,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව,
උරුබොක්ක.

2024 ඔක්තෝබර් මස 08 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

ව්‍යාපාර බදු

උපලේඛනය අංක 01

අනු. අංකය	*I වැනි තීරුව* *2024 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නොමැත
02	රු. 6,000 ට වැඩි අවස්ථාවල රු. 12,000 දක්වා	90.00

	I වැනි තීරුව	*II වැනි තීරුව*
අනු. අංකය	*2024 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ස්වභාවය*	*ගෙවිය යුතු බද්ද රු. ශත*
03	රු. 12,000 ට වැඩි අවස්ථාවල රු. 18,750 දක්වා	180.00
04	රු. 18,750 ට වැඩි අවස්ථාවල රු. 75,000 දක්වා	360.00
05	රු. 75,000 ට වැඩි අවස්ථාවල රු. 1,50,000 දක්වා	1,200.00
06	රු. 1,50,000 ට වැඩි අවස්ථාවල	3,000.00

උපලේඛනය - අංක 02

01. ගඩොල් විකිණීම සඳහා ගබඩා කිරීම
02. උලු විකිණීම සඳහා ගබඩා කිරීම
03. දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04. විකිණීම සඳහා හුණු/හුණු ගල් ගබඩා කිරීම
05. සිමෙන්ති විකිණීම සඳහා ගබඩා කිරීම
06. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
07. විකිණීම සඳහා තේ කොළ හොන්ඩර් 03 ට වඩා ගබඩා කිරීම
08. පරිගණක හා පරිගණක උපාංග අලෙවිය
09. කොමියුනිකේෂන් එකක් (දුරකථන ඇමතුම් ලබා ගන්නා ස්ථානයක්) පවත්වාගෙන යාම
10. කෙසෙල් කැන් එකතු කිරීමේ/ පුවක් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. පූජා භාණ්ඩ අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
12. ස්නේහක තෙල් අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
13. ශාරීරික ව්‍යායාම කරන ස්ථානයක් පවත්වාගෙන යාම
14. උපදේශන සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
15. සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. විදුලි උපකරණ අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
17. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
18. ගුවන් විදුලි/ රූපවාහිනී/ මහන මැෂින්/ බයිසිකල් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
19. රෙදිපිළි/නිමි ඇඳුම් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
20. සම් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
21. ඇලුමිනියම්/ ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
22. උත්සව භාණ්ඩ කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
23. මහන මැෂින් නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
24. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
25. මෝටර් රථ/ මෝටර් බයිසිකල්/ ට්‍රැක්ටර්/ බයිසිකල්/ ත්‍රීවීල් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. ලිපිද්‍රව්‍ය වෙළඳසලක් පවත්වාගෙන යාම
27. වීදුරු හෝ වීදුරු භාණ්ඩ අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
28. ආයුර්වේද බෙහෙත් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. බටහිර බෙහෙත් බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
30. ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර කරන ස්ථානයක් පවත්වාගෙන යාම
31. බටහිර වෛද්‍ය ප්‍රතිකාර කරන ස්ථානයක් පවත්වාගෙන යාම
32. මැටි භාණ්ඩ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
33. අවමංගල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
34. බුලත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
35. මෝටර් බයිසිකල්/ අත් ට්‍රැක්ටර්/ ත්‍රිරෝද රථ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම

36. ඡායා පිටපත් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වගෙන යාම
39. රෙකෝඩ් බාර් එකක් පැවැත්වීම
40. ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
41. පරිගනක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
42. අමු තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. පුවත්පත් අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
44. පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථනයක් පවත්වාගෙන යාම
45. කුරුඳු/ගම්මිරිස්/ රබර් ආදී දේශීය ද්‍රව්‍ය විකිණීමේ හා මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. පොල් ලී ඇතුලු ඉරන ලද ලී විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. විදුලි උත්පාදන යන්ත්‍ර හෝ විදුලි උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. පිඟන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. කොන්ක්‍රීට් හෝ සිමෙන්ති භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. නාම පුවරු/බැනර් මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම
52. තොග කඩයක් පවත්වාගෙන යාම
53. සුරතල් මසුන්/කුරුල්ලන් හා සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. විකිණීම සඳහා ටයර් ටියුබ් ගබඩා කිරීම
55. ජංගම දුරකථන/අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. වෛද්‍යවරුන් චැනල් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
58. දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. තීන්ත බඩු අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
60. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
61. මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
62. පාවහන් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
63. ස්වර්ණාභරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
64. ගල්, වැලි, ගඩොල් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. රක්ෂණ සේවා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
66. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
67. අරක්කු/ බියර් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
68. පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
70. ඇසිඩ් වර්ග විකිණීම සඳහා ගබඩා කිරීම
71. කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීම සඳහා ගබඩා කිරීම
72. ගිණිකෙළි භාණ්ඩ විකිණීම සඳහා ගබඩා කිරීම
73. ගෑස් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74. විදුලි සම්ප්‍රේෂණ කුළුණු
75. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
76. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
77. සුපිරි වෙළෙඳසලක් පවත්වාගෙන යාම
78. ජ්‍යොතිෂ්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
79. ගෘහ නිර්මාණ සැලසුම් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
80. ලී මෝලක් පවත්වාගෙන යාම
81. ගල් මෝලක් පවත්වාගෙන යාම
82. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම

83. සිසිල් බීම අලෙවිය
84. ටයර් ටියුබ් අලෙවිය
85. ටයර් ටියුබ් අලුත්වැඩියාව
86. පිඟන් ගඩොල් සහ නාන කාමර කට්ටල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. ඉදිකිරීම් කටයුතු කරන ආයතනයක් පවත්වාගෙන යාම
88. විසිතුරු භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
89. විසිතුරු ආභරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
90. තිර රෙදි මැසීම
91. කාන්තා, ළමා/පිරිමි ඇඳුම් මැසීම
92. කුරියර් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
93. ළමා ඇඳුම් හා උපකරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
94. වාහනවලින් පිටවන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
95. මාර්ග තැනීම සඳහා කොන්ක්‍රීට් ගල් කුට්ටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96. මිරිස්, ලුණු හා වෙනත් නරක්වනසුළු ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
97. පානීය ජලය බෝතල්ගත කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98. රථ වාහන පුහුණු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
99. උපකාරක පන්ති පවත්වන ආයතනයක් පවත්වාගෙන යාම
100. විකිණීම සඳහා ආහාර ද්‍රව්‍ය පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
101. වී මෝල්ක් පවත්වාගෙන යාම
102. තේ කොළ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
103. වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
104. සහල්/මිරිස්/තුනපහ පිටි කිරීම සඳහා මෝල්ක් පවත්වාගෙන යාම
105. ශීත කළ මස්/ මාලු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106. පොල් තෙල් මෝල්ක් පවත්වාගෙන යාම
107. බ්ලොක් ගල් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම
108. වඩු වැඩ සඳහා ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
109. දත් බඳින, ගලවන ස්ථානයක් පවත්වාගෙන යාම
110. ත්‍රිරෝද රථ/ යතුරු පැදි/ අනෙකුත් වාහන සේවා සපයන (සර්විස් කිරීමේ) ස්ථානයක් පවත්වාගෙන යාම
111. පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112. ශීත කළ ආහාර ද්‍රව්‍ය (යෝගට්, බීම පැකට්, අයිස්ක්‍රීම්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
113. එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. සංචාරය කරමින් බේකරි නිෂ්පාදන / මාළු / සැකසූ ආහාර විකිණීම
115. බහු කාර්ය යන්ත්‍ර සූත්‍ර භාවිතා කරන වඩු මඩුවක් පවත්වාගෙන යාම
116. බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
117. මාළු වියලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. පරණ පුවත්පත්, පොල්කටු, අබලි යකඩ එකතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
119. අන්තර්ජාලය මගින් දැන්වීම් ප්‍රචාරනය
120. කාන්තා හා පිරිමි මංගල ඇඳුම් කුලියට සැපයීම
121. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
122. නිවාස සහ ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම
123. කොන්ත්‍රාත් පදනමට ගස් හා අතු කැපීම
124. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
125. සංගීත භාණ්ඩ අලෙවිය/ක්‍රීඩා භාණ්ඩ අලෙවිය/ගෙවතු අලංකරණ මෙවලම් අලෙවිය
126. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
127. රූපලාවන්‍ය නිෂ්පාදන ගෙන්වා බෙදාහැරීම
128. දුම්කොළ, සුරුට්ටු ඇසුරුම් කර බෙදා හැරීම
129. වාහන අලංකරණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

130. පොලිතීන් අලෙවිය
131. රථවාහන කුලියට සැපයීම
132. අන්තර් ජාලය මගින් සිදු කරනු ලබන ව්‍යාපාර
133. ස්වර්ණාභරණ උකස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
134. ඔරලෝසු අලෙවිය හා අලුත්වැඩියාව
135. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
136. සහල් තොග/සිල්ලර වශයෙන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම

12 - 208/5

පස්ගොඩ ප්‍රාදේශීය සභාව

වෙනත් ගාස්තු පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් තීරණ අංක 2024/10/01/11 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර පස්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025 වර්ෂය සඳහා පනවා අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ආර්. දිනූෂා ලක්මාලි,
ලේකම් හා ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව,
උෑරුබොක්ක.

2024 ඔක්තෝබර් මස 01 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය අංක 01

අනු අංකය	*විස්තරය*	*අය කරනු ලබන මුදල*
		රු. ශත
01	**ගොඩනැගිලි අයඳුම්පත් ගාස්තු :**	
	(i) නාගරික බල සීමාව තුළ	400 0
	(ii) බල සීමාවෙන් එපිට	300 0
02	**අනතුරුදායක ගස් කැපීමේ අයඳුම්පත් ගාස්තු :**	
	(i) කොස් ගසක්	500 0
	(ii) වෙනත් ගසක්	350 0

අනු අංකය	විස්තරය	අය කරනු ලබන මුදල රු. ශත
03	**ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතිකයක් ලබා ගැනීම :**	
	නේවාසික ඉදිකිරීම්/වානිජ ඉදිකිරීම් මීටර් 400 ක් සඳහා	600 0
	වැඩිවන සෑම මීටරයක් සඳහා	0 5
04	**වීථි රේඛා නොපවරා ගැනීමේ සහතිකය සඳහා ගාස්තු :**	
	(i) අයදුම්පත්‍ර ගාස්තු	50 0
	(ii) වීථි රේඛා, නොපවරා ගැනීමේ සහතිකය සඳහා ගාස්තු	450 0
05	සභා පාරවල් පළුදු කිරීමේ ගාස්තු	1,500 0
06	**පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු :**	
	(i) ප්‍රශ්නාවලි ගාස්තු	300 0
	(ii) අයදුම්පත් ගාස්තු	350 0
07	ඉඩම් අනුබෙදුම් ඉල්ලුම්පත්‍ර ගාස්තු	300 0
08	**ප්‍රාදේශීය සභාව සතු උෆරුබොක්ක මහජන ක්‍රීඩාංගන බදු දීම :**	
	(i) විනෝද සැණකෙළි/සංගීත ප්‍රසංග පැවැත්වීම සඳහා දිනකට	10,000 0
	(ii) ක්‍රීඩා තරග/ක්‍රීඩා උත්සව/වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු/මහජන රැස්වීම් සඳහා - දිනකට	5,000 0
	(iii) වෙනත්	2,000 0
	(iv) සභාව සතු මහජන ඉඩම් බදු දීමේ දී ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු	10,000 0
	(v) පස්ගොඩ සතිපොළ භූමිය සහ පස්ගොඩ එළිමහන් වේදිකා භූමිය ඇප තැන්පතු	3,000 0 5,000 0
09.	සභාව සතු ළමා උද්‍යානය ළමා උත්සව කටයුතු සඳහා බදු දීම - දිනකට	10,000 0
10	**පුස්තකාල ගාස්තු :**	
	(i) අයදුම්පත්‍ර ගාස්තු	50 0
	(ii) ඇප තැන්පත් ගාස්තු	250 0
	(iii) සාමාජිකයා විසින් ලබාගත් පොතක් නැති වූ අවස්ථාවක දී පොතේ වටිනාකම මෙන් දෙගුණයක් ගෙවිය යුතුය	
11	**මායිම් තාප්පයක් ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු :**	
	(i) පළමු දික් මීටර් 100	1000 0
	(ii) ඊට වැඩි වන සෑම මීටරයකටම	10 0

නෙළුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය

යෝජනාව

1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ඇ) කොටසේ පළකරනු ලැබුවා වූ ද, 2010.11.26 දින සිට වලංගු වන බව 2010.10.19 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ දී ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ නෙළුව ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන ව්‍යාපාරය/කර්මාන්තය සම්බන්ධයෙන් වන විට දී එයට ඉදිරියෙන් II වැනි තීරයේ දැක්වෙන එකී ව්‍යාපාරය කර්මාන්තය/කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ හෝ පරිශ්‍රයේ වාර්ෂික වටිනාකමට අදාළව දැක්වෙන බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්, එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය/ව්‍යාපාරය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගන්නා වූ ද වන අවස්ථාවක ඉහත කී උපලේඛනයේ II වැනි තීරයේ කුමක් සඳහන් වුව ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රය සඳහා වන ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පලේ 2024 වර්ෂය තුළ ලැබූ ආදායමින් 1%ක් විය යුතු බවත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඒ. එන්. එන්. ලමාහේවා වන මා විසින් තීරණ අංක 2024/08/21 28(1) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

	I තීරය	*II තීරය*		
අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශත	වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට රු. ශත
01.	මස් විකිණීම	500 0	750 0	1,000 0
02.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
03.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
04.	කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු, සැලුන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන	500 0	750 0	1,000 0
05.	බේකරි	500 0	750 0	1,000 0
06.	කිරි පට්ටි	500 0	750 0	1,000 0

	I තීරය	II තීරය		
අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට	වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
07.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
08.	බත් කඩ, ආපනශාලා සහ තේ, කෝපි කඩ	500 0	750 0	1,000 0
09.	හෝටලයක්	500 0	750 0	1,000 0
10.	නවාතැන්පළක් (ගෙස්ට් හවුස්)	500 0	750 0	1,000 0
11.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
12.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500 0	750 0	1,000 0
13.	ආහාර පාන වෙළෙඳාම	500 0	750 0	1,000 0
14.	වෙළෙඳපොලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන	500 0	750 0	1,000 0

12 - 222/1

නෙළුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ හෝ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් යටතේ හෝ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ පහත උපලේඛනයේ I වන කොටසේ දැක්වෙන යම් ව්‍යාපාරයක් නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ වෙළඳ ව්‍යාපාරයේ ලැබූ ආදායම මෙහි පහත උපලේඛනයේ II වන කොටසේ I තීරයේ සඳහන් සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ ඊට අනුරූපිත අනුප්‍රමාණයට අනුව වූ ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර නෙළුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් විධානය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඒ. එන්. එන්. ලමාහේවා වන මා තීරණ අංක 2024/08/21 28(2) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි කොටස :

1. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම
2. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
3. තොග වෙළඳසැලක් පවත්වාගෙන යාම
4. රෙදිපිළි හෝ නිමි ඇඳුම් වෙළඳසැලක් පවත්වාගෙන යාම
5. පාවහන් අලෙවිසැලක් පවත්වාගෙන යාම
6. තෑගි භාණ්ඩ හෝ සාප්පු බඩු වෙළඳාම
7. විදුලි උපකරණ වෙළඳාම
8. යකඩ භාණ්ඩ හෝ ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම
9. වාහන අමතර කොටස් වෙළෙඳාම
10. පා පැදි/යතුරු පැදි අලෙවි කිරීම
11. ඉඩම් හෝ වෙනත් දේපළ වෙළෙඳාම් කිරීම
12. වාහන හෝ යන්ත්‍ර උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
13. පා පැදි/යතුරු පැදි අලුත්වැඩියාව
14. ලී බඩු/කාර්යාල උපකරණ අලෙවිසලක් පවත්වාගෙන යාම
15. අරක්කු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
17. භාණ්ඩ එක්රැස් කිරීම හා විකිණීම
18. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
19. ඡායාරූප වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම
20. තීන්ත/සායම් ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
22. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
23. බටහිර ඖෂධ අලෙවිසැලක් (ෆාමසියක්) පවත්වාගෙන යාම
24. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
25. පරිගණක හෝ පරිගණක උපාංග වෙළෙඳාම
26. අපනයන බෝග නිෂ්පාදනය එකතු කිරීම හා විකිණීම
27. කුළු බඩු එකතු කිරීම හා විකිණීම
28. බැංකු හෝ මූල්‍ය ආයතන
29. රක්ෂණ ආයතන
30. කුළී රථ සේවා පවත්වාගෙන යාම
31. ස්වර්ණාභරණ අලෙවිය
32. උත්සව/භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
33. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
34. රේස් හා ඔට්ටු ඇල්ලීමේ ආයතනයක් පවත්වාගෙන යාම
35. රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
36. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
37. ලිපිද්‍රව්‍ය පොත් අලෙවිසැලක් පවත්වාගෙන යාම
38. සංස්කෘතික/ක්‍රීඩා උපකරණ විකිණීම
39. ඉරු දැව හෝ සකස් කළ වෙළෙඳාම
40. ජංගම දුරකථන අලෙවිය හෝ අලුත්වැඩියාව
41. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
42. එළවළු, පලතුරු වෙළෙඳාම
43. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
44. දුරකථන සම්ප්‍රේෂණ කුලුණක් පවත්වාගෙන යාම

44. ඉහතින් සඳහන් නොවන හා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන යම් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් තුළින් විකිණීම හෝ කොමිස් පදනමින් ඉපයීමක් සිදු කරනු ලබන වෙනත් ඕනෑම ව්‍යාපාරයක් :-

II වැනි කොටස

I වැනි තීරුව 2024 වසරේ ආදායම	*II* වැනි තීරුව රු. ශත
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
2. රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විටක	90 0
3. රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විටක	180 0
4. රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විටක	360 0
5. රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විටක	1,200 0
6. රු. 1,50,001 ඉක්මවන නමුත් රු. 1,75,000 නොඉක්මවන විටක	2,000 0
7. රු. 1,75,001 ඉක්මවන නමුත් රු. 2,00,000 නොඉක්මවන විටක	2,500 0
8. රු. 2,00,001 ඉක්මවන විට	3,000 0

12 - 222/2

නෙළුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වැනි වගන්තිය

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තිය යටතේ නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ සඳහන් පරිදි අක්කර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, වර්ෂයට නියමිත අක්කර බදු මුදල එම වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට ප්‍රථම ගෙවන විට දී එකී බදු මුදලින් 10%ක වට්ටමක් ද, කාර්තු පදනමින් ගෙවන විට නියමිත කාර්තුවේ පළමු මාසය තුළ දී අක්කර බදු මුදල් ගෙවනු ලබන විටක දී බදු මුදලින් 5%ක වට්ටමක් ලබා දිය යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඒ. එන්. එන්. ලමාහේවා වන මා තීරණ අංක 2024/08/21 28(3) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉඩමේ ප්‍රමාණය	*බදු ප්‍රමාණය වර්ෂයකට* *රු. ශත*
හෙක්ටයාර් 5 කට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩුවන අවස්ථාවක	50 0
හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක	10 0

12 - 222/3

නෙළුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

267 වැනි අධිකාරය වූ 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත

යෝජනාව

267 වැනි අධිකාරය වූ 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව නෙළුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයක (10%) බද්දක් පනවා අයකළ යුතු යැයි ද, එකී යෝජනාව පළාත් පාලන විෂයය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන්, පසු ඒ බව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීමකින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු බවත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඒ. එන්. එන්. ලමාහේවා වන මා තීරණ අංක 2024/08/21 28(4) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

12 - 222/4

නෙළුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (1) වැනි වගන්තිය

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (1) වගන්තිය යටතේ නෙළුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයේ වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඒ. එන්. එන්. ලමාහේවා වන මා තීරණ අංක 2024/08/21 28(5) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

රු. ශත

1. (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා :	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
(iii) සෑම කරත්තයක් සඳහා	18 0
(iv) සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v) සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi) සෑම අශ්වයෙකු හෝ පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii) සෑම ඇතෙකු සඳහා	50 0

2. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොගෙවා ඇති කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් වේ.

3. මෙම උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 222/5

නෙළුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සම්මත අතුරු ව්‍යවස්ථා අංක 39 යටතේ
ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ බදු පැනවීම

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 7/520 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක 39 ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයෙන් ගණනය කරනු ලබන ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඒ. එන්. එන්. ලමාහේවා වන මා තීරණ අංක 2024/08/21 28(6) යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

දැන්වීම් පුවරුවේ ස්වභාවය	*වර්ග අඩියක් සඳහා රු. ශත*
බිත්තියක් මත හෝ වෙනත් නිර්මිත පුවරුවක් මත කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා (වාර්ෂික හෝ කොටසක් සඳහා)	100 0
ප්‍රචාරක බැනර් ප්‍රදර්ශනය සඳහා (මසක් හෝ ඉන් කොටසක් සඳහා)	50 0

12 - 222/6

නෙළුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව නෙළුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ඒ. එන්. එන්. ලමාහේවා වන මා තීරණ අංක 2024/08/21 28(7) යටතේ පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එන්. එන්. ලමාහේවා,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව,
නෙළුව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*කාරණය*	*අයකරන ගාස්තුව රු. ශත*
01.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	1,000 0
02.	අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු	1,000 0
03.	ගොඩනැගිලි අයදුම්පත් මත අනුකූලතා සහතිකයක් සඳහා - ව්‍යාපාරික ස්ථානයක් සඳහා	1,000 0
	පදිංචි ස්ථානයකට	1,000 0
04.	ගොඩනැගිලි අයදුම්පතක් කාලය දීර්ඝ කරගැනීම සඳහා (වසරකට)	1,000 0
05.	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු	1.000 0
06.	කැබලි සැලසුම් අනුමත කිරීමේ පෝරම ගාස්තු	1,000 0
07.	කැබලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු - එක් කැබැල්ලකට (එකකට වැඩි සෑම කැබැල්ලකටම රු. 1000ට අමතරව රු. 500 බැගින් ගෙවිය යුතු ය.)	1,000 0
09.	පැරණි සතිපොළ භූමිය එක් දිනකට ලබාදීමේ ගාස්තු	2,000 0
10.	නෙළුව පොදු වෙළඳපොල ඉදිරිපිට භූමිය එක් දිනකට ලබාදීමේ ගාස්තු	2,000 0
11.	බැකෝ ලෝඩර් යන්ත්‍රය කුළියට ලබාදීමේ ගාස්තුව - පැයක් සඳහා	5,000 0

අනු. අංකය	කාරණය	අයකරන ගාස්තුව රු. ශත
12.	ජල බවුසරය දිනකට ලබාදීමේ ගාස්තුව (ට්‍රැක්ටර් බවුසරය පැය 8 ක් සඳහා)	3,000 0
13.	ජල බවුසරය දිනකට ලබාදීමේ ගාස්තුව (ට්‍රක් බවුසරය පැය 8 ක් සඳහා)	10,000 0
14.	විදුලි උත්පාදන යන්ත්‍රය දිනකට ලබාදීමේ ගාස්තුව	5,000 0
15.	කොන්ක්‍රීට් මිශ්‍රණය දිනකට ලබාදීමේ ගාස්තුව	8,000 0
16.	පස් තලන යන්ත්‍රය දිනකට ලබාදීමේ ගාස්තුව	3,000 0
17.	ෆෝටෝන් ටිපර් රථය දිනකට ලබාදීමේ ගාස්තුව (පැය 8 ක් සඳහා)	20,000 0
18.	ශ්‍රවනාගාරය දිනකට ලබාදීමේ ගාස්තු	10,000 0
19.	2” ජල මෝටරය දිනකට ලබාදීමේ ගාස්තුව (ජල ගිල්වන)	2,500 0
20.	පුස්තකාලය සඳහා සාමාජික තැන්පත් ගාස්තු	150 0
21.	පුස්තකාල පොත් සඳහා දිනකට ප්‍රමාද ගාස්තු (වැඩිහිටි)	5 0
	(ළමා - අඩු 6 ත් 12 ත් අතර)	1 0
22.	පුස්තකාල සාමාජික ගාස්තුව (වර්ෂයකට අලුත් කිරීම)	50 0
23.	කොන්ක්‍රීට් අච්චු දිනකට ලබා දීමේ (කර්මාන්ත සඳහා සාම්පල් ලබාගැනීම සඳහා) ගාස්තුව	750 0
24.	අනුමත කරන ලද ගොඩනැගිලි අයදුම්පත් ලිපිගොණුවක පිටපතක් ලබාගැනීම	1,500 0
25.	අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුමක පිටපතක් ලබාගැනීම	1,500 0
26.	විදුලි සන්දේශන සම්ප්‍රේෂණ කුළුණු හා ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා ගාස්තු අය කිරීම	
	i. බිම් පාදම ඉදි කිරීම	150,000 0
	ii. වල මුදුන ඉදි කිරීම	100,000 0

විධිමත් බලපත්‍රයක් නොමැතිව කරනු ලබන ඉදිකිරීමක් හා භාවිතය වෙනස් කිරීමක් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු (2025)

ඉදිකිරීමේ අදියර	බිම් මහලේ වර්ග මීටර් එකක් සඳහා ගෙවිය යුතු ගාස්තුව (රු. ශත)	එක් එක් උඩු මහලක වර්ග මීටර් එකක් සඳහා ගාස්තුව (රු. ශත)
අත්තිවාරම් මට්ටම	65 0	
වහල මට්ටම සඳහා ඉදිකොට ඇති විට	85 0	165 0
වහල ඇතුළුව ඉදිකොට ඇති විට	115 0	215 0
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	165 0	315 0

මායිම් තාප්පයක් සඳහා දික් මීටරයකට රු. 900 0

ගලි බවුසර් සේවය ලබාදීමේදී අයකරනු ලබන ගාස්තු (2025)

අනු අංකය	කාරණය	අයකරනු ලබන ගාස්තුව (රු. ශත)
01	නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත	8,000 0
02	නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත	10,000 0
03	1kg ක් සඳහා අය කරනු ලබන ප්‍රවාහන ගාස්තුව	100 0

සංශෝධනය කිරීමට යෝජිත ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු

ගොඩනැගිලි විශාලත්වය	*පදිංචිය සඳහා රු. ශත*	*වාණිජ්‍ය හෝ වෙනත් කටයුත්තක් සඳහා රු. ශත*
වර්ග මීටර් 45 ට අඩු	750 0	2,000 0
වර්ග මීටර් 45 - 90	2,000 0	3,000 0
වර්ග මීටර් 91 - 180	3,000 0	4,000 0
වර්ග මීටර් 181 - 270	4,000 0	5.000 0
වර්ග මීටර් 270 ට වැඩි වන සෑම වර්ග මීටර් 10 කට අමතරව එක් විය යුතු මුදල	500 0	1.000 0
මායිම් තාප්පය සඳහා	500 0	1,000 0

ආදාහනාගාර ගාස්තු - 2025 :

	රු. ශත
නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ	10,000 0
නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත	12,000 0

නෙළුව කොස්මුල්ල දූලි ඇල්ල සංචාරක පරිශ්‍රයේ නිවාඩු නිකේතනය එක් දිනක් සඳහා ලබාදීමේ ගාස්තු - 2025 :

	රු. ශත
නිකේතනය (ලොකු)	8,000 0
නිකේතනය (කුඩා)	5,000 0

නෙළුව ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය ලබාදීමේ ගාස්තු - 2025 :

	රු. ශත
මුදල් අයකර පෙන්වන සංගීත සංදර්ශන සඳහා (දිනකට)	7,000 0
ක්‍රීඩා තරග සඳහා (දිනකට)	3,000 0
සැණකෙළි/රැස්වීම්/ප්‍රදර්ශන/වෙළඳ කාර්ය කටයුතු/ අධ්‍යාපන කටයුතු සඳහා (දිනකට)	5,000 0

සැ. යු. -

01. සංගීත සංදර්ශණ සඳහා ක්‍රීඩාංගනය වෙන් කිරීමේ දී ආරක්ෂිත ඇප තැන්පතු වශයෙන් රු. 10,000 ක් අය කරනු ලැබේ.

02. යම් කාර්යයක් සඳහා මුදල් ගෙවා අදාළ දින නියමිත කාර්යය සිදු නොකරන්නේ නම් දින තුනක් (03) ඇතුළත දැනුම් දීමක දී අදාළ ගාස්තුවෙන් 50% ක් නිදහස් කිරීමට කටයුතු කරන අතර, එසේ නොවන අවස්ථාවල තැන්පතුව නිදහස් නොකරනු ලැබේ.

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

වරිපනම් ප්‍රතිශතය පිළිගැනීම සහ වරිපනම් බදු පැනවීම - 2025

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) සහ 146 වගන්ති යටතේ ඇති විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශ සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින මා තීරණය කරන ලද බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

එනම්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 453/6 හා 1987.05.12 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* යටතේ දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ නිවාස වල, ගොඩනැගිලිවල ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා වේයන්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයට 2016 වර්ෂයේ තක්සේරුව ද, බෙම්මුල්ල උපකාර්යාලය සඳහා 2019 තක්සේරුව ද, ඔයබඩපේරුව උපකාර්යාලය සඳහා 2023 තක්සේරුව ද, අනෙකුත් උපකාර්යාල වන එගොඩපොත උපකාර්යාලය / මෙගොඩපොත උපකාර්යාලය සඳහා 2009 තක්සේරුවේ සත්‍යක්ෂණය 2025 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙහි බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හතක් (7%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතුය.

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2025 මාර්තු 31 ට පෙර	2025 ජනවාරි 31	-
දෙවන කාර්තුව	2025 ජුනි 30 ට පෙර	-	2025 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2025 සැප්තැම්බර් 30 ට පෙර	-	2025 ජූලි 31
හතරවන කාර්තුව	2025 දෙසැම්බර් 31 ට පෙර	-	2025 ඔක්තෝබර් 31

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2025

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිති පතා වගා කළ යුතු තත්ත්වයන් යටතේ පවත්වාගෙන යනු ලබන ඉඩම් සම්බන්ධයෙන් 2025 වර්ෂය සඳහා වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින මා තීරණය කරන ලද බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

ඉහත කී පනතේ 134 (3) වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂිත ප්‍රදේශයක් වශයෙන් සළකනු ලබන බව අංක 450/6 හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයන්ට ඇතුළත් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු ස්ථිර හෝ නිතිපතා වගාකළයුතු තත්ත්වයන් යටතේ පවත්වාගෙන යනු ලබන සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ හෙක්ටයාර එකක් සඳහා 2025 වර්ෂයට රුපියල් පනහක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු අතර,

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර, එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බව තීරණය කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*10% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*	*5% වට්ටම සඳහා නිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2025 මාර්තු 31 ට පෙර	2025 ජනවාරි 31	-
දෙවන කාර්තුව	2025 ජුනි 30 ට පෙර	-	2025 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2025 සැප්තැම්බර් 30 ට පෙර	-	2025 ජූලි 31
හතරවන කාර්තුව	2025 දෙසැම්බර් 31 ට පෙර	-	2025 ඔක්තෝබර් 31

12 - 161/2

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 155, 159 (1) හා 161 වගන්ති අනුව වරෙන්තු ගාස්තු පැනවීම - 2025

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 159(1) හා 161 වගන්තිවල විධිවිධාන

ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රකාශිත වරිපනම් බදු හා කුලී ගාස්තු අය කිරීමේ දී නිශ්චිත කාල සීමාව තුළ ගෙවීම පැහැර හරින්නන් වෙත වරෙන්තු ගාස්තුව පහත සඳහන් ආකාරයට විය යුතු බවට, තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින මා තීරණය කරන ලද බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 159(1) හා 161 වගන්ති වල විධි විධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රකාශිත වරිපනම් බදු හා කුලී ගාස්තු අය කිරීමේ දී නිශ්චිත කාල සීමාව තුළ ගෙවීම පැහැර හරින්නන් වෙත වරෙන්තු ගාස්තුව පහත සඳහන් ආකාරයට විය යුතු බව තීරණය කරමි.

1. අයවිය යුතු බද්දේ හෝ කුළියේ ප්‍රමාණයෙන් 10%ක් ද,
2. හිස්බිම හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අය විය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15%ක් ද,
3. හිස්බිම හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 20% ක් ද, අය කළ යුතු වේ.

12 - 161/3

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා පැනවෙන බදු - 2025

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වන බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, ඒ පහත සඳහන් ආකාරයට විය යුතු බවට, තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින මා තීරණය කරන ලද බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 13 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්යය සඳහා සුදුසු යම් ඉඩමක

අ) සැබවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූත් ඒ ඉඩමේ බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 5:1 ට වඩා අඩු වන්නේ නම් හෝ

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2 (2%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, 2025 මාර්තු 31 දිනට පෙර අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

12 - 161/4

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම - 2025

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාල ව නියම කර අය කළ යුතු බවට තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින මා තීරණය කරන ලද බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාල ව නියම කර අය කළ යුතු බවට පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි.

උපලේඛනය

	I වැනි තීරය	*II වැනි තීරය* *රු. ශත*
1.	මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, ජින් රික්ෂෝවක් හෝ බයිසිකලයක් හෝ මුයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව	25 0
	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
2.	සෑම කරත්තයක් සඳහා	20 0
3.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
4.	සෑම රික්ෂෝවක් සඳහා	7 00
5.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
6.	සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්න, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍යයක් හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 161/5

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු, ආකෘති පත්‍ර ගාස්තු සහ අයදුම්පත්‍ර ගාස්තු පැනවීම - 2025

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 108 වැනි වගන්තිය හා 126 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සේවා ගාස්තු, ආකෘති පත්‍ර ගාස්තු සහ අයදුම්පත්‍ර ගාස්තු නියම කර අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින තීරණය කරන ලද බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015 දෙසැම්බර් 28 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ පල කරන්නට යෙදී ඇති හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.10.14 දිනැති අංක 1989 දරන *ගැසට් පත්‍රයේ* iv (ආ) වැනි කොටස - පළාත් පාලන යටතේ සඳහන් නිවේදනය ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභාව සඳහා වැළඳ ගන්නට යෙදී ඇති සේවා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් පරිදි පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2025 වර්ෂය සඳහා අය කළ යුතු බවට තීරණය කරමි.

උපලේඛනය

		රු. ශත
01.	සුසාන භූමිවල ස්මාරක ඉදි කිරීම - වර්ග අඩියකට (අවුරුදු 05 ක උපරිමයකට යටත්ව)	500 0
02.	සුසාන භූමිවල භූමදානය කිරීම සඳහා - වර්ග අඩියකට	500 0
03.	*ආදාහනාගාර වෙන් කිරීම :*	
	- බල ප්‍රදේශය තුළ සිදුවන එක් ආදාහනයක් සඳහා (වෙන් කිරීම 9,700 + සේවා ගාස්තු 300 0)	10,000 0
	- බල ප්‍රදේශයෙන් පිටත සිදුවන එක් ආදාහනයක් සඳහා (වෙන් කිරීම 11,700 + සේවා ගාස්තු 300 0)	12,000 0
04.	*ගලි බවුසරය වෙන් කිරීම :*	
	- බල ප්‍රදේශය තුළ - නිවාස	5,000 0
	- ව්‍යාපාරික ස්ථාන	8,000 0
	- ආගමික	4,700 0
	- රාජ්‍ය	5,500 0
	(කලින් කළ රජය විසින් පනවන බදු මුදල් අදළ වේ.)	

	රු. ශත
- බල ප්‍රදේශයෙන් පිටත - නිවාස	6,000 0
- ව්‍යාපාරික ස්ථාන	9,000 0
- ආගමික	5,000 0
- රාජ්‍ය	6,500 0

(කලින් කලට රජය විසින් පනවන ලද බදු මුදල් එකතු විය යුතු අතර ප්‍රවාහන ගාස්තු ලෙස කි. මී. 01ක් සඳහා රු. 90 0 ක් එකතු වේ. අදළ වේ.)

05.	*ශාලා ගාස්තු* - ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාව (දිනකට)	
	- බල ප්‍රදේශය තුළ	6,000 0
	- බල ප්‍රදේශයෙන් පිටත	7,500 0
	ඔයබඩපේරුව උපකාර්යාලයේ රැස්වීම් ශාලාව (දිනකට)	
	- ආසන සමග ශාලාව	7,500 0
	වේයන්ගොඩ රංග ශාලාව :	
	- දිනක් (පැය 12ක් සඳහා)	100,000 0
	- දින 1/2ක් (පැය 6ක් සඳහා)	60,000 0
	- නැවත ගෙවනු ලබන තැන්පත් මුදල්	25,000 0
06.	**(i) මාර්ග පළුදු කිරීම හේතුවෙන් අය කිරීම (වර්ග මීටර් 1ක් සඳහා) :**	
	1. බොරළු	940 0
	2. තාර	2,860 0
	3. කොන්ක්‍රීට්	7,815 0
	4. කාපට්	9,250 0
	5. අන්තර් සම්බන්ධිත කුට්ටිගල්	9,250 0
	(ii) මාර්ග භාවිතයට විශේෂ අවස්ථාවල අවසර ගැනීම කිලෝමීටරයක් සඳහා (පස්/ගල්/ වැලි/දූව ප්‍රවාහනය)	
	1. බොරළු	25,000 0
	2. තාර	50,000 0
	3. කොන්ක්‍රීට්	75,000 0
	4. කාපට්	100,000 0
	5. අන්තර් සම්බන්ධිත කුට්ටිගල්	75,000 0
07.	**ප්‍රාදේශීය සභා භූමියේ රථ ගාල් සඳහා වාහන නැවතුම් ගාස්තු අයකිරීම (පැයකට) :**	
	1. මෝටර් සයිකලයක් සඳහා	50 0
	2. ත්‍රීවීල් රථයක් සඳහා	50 0
	3. කාර්/වෑන් සඳහා	100 0
	4. ලොරි/බස් සඳහා	100 0
	(වැඩි වන සෑම පැයකටම රු. 10 0 බැගින් අයකළ යුතුය.)	

08. කොම්පෝස්ට් පොහොර :

ප්‍රමාණය (Kg)	*මිල* *රු. ශත*
01 - 100	20 0
101 - 499	18 0
500 - 999	16 0
1000 ට වැඩි	12 0

09. (i) **ජල බවුසරය (6000L) ධාරිතාව සඳහා ප්‍රවාහන ගාස්තුව :**

	රු. ශත
නිවසක් සඳහා	6,000 0
ව්‍යාපාරික ස්ථානයක් සඳහා	8,000 0
ජල ගාස්තුව	960 0

(මෙම ජල බවුසරය ලබා දෙනු ලබන්නේ පානීය ජලය ලබා ගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් පමණයි.)

(ii) ජල බවුසරය (3000*L*) ධාරිතාව සඳහා ප්‍රවාහන ගාස්තුව :

නිවසක් සඳහා	4,000 0
ජල ගාස්තුව	300 0

බවුසරය රඳවාගෙන ජලය ලබා ගැනීමේ කටයුතු වෙනුවෙන් (3000L ධාරිතාව) ජල බවුසරය පමණක් ලබා දෙයි. ඒ සඳහා,

රඳවා ගැනීමේ ගාස්තුව දිනකට	රු. 500
රඳවා ගැනීමේ පළමු පැය	නිදහස්
දෙවන පැයේ සිට සෑම පැයකටම	රු. 500 බැගින්

(කළින් කළට රජය විසින් පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාළ වේ.)

		රු. ශත
10.	පෙර පාසල් ගාස්තු එක් දරුවෙකු සඳහා මසකට	300 0
11.	පුස්තකාල සාමාජික ගාස්තු	100 0
12.	ඡායා පිටපත් ගාස්තු - A4 තනි පැත්ත	10 0
	A4 දෙපැත්ත	15 0
13.	නිට්ටඹුව හා වේයන්ගොඩ නාගරික ප්‍රදේශය තුළ පිහිටි සභාවට අයත් විවෘත බිම් කුලියට දීමට වර්ග අඩියක් සඳහා වැට් බදු රහිතව එක් දිනක් සඳහා සභාව තීරණය කරනු ලබන වෙළඳ කාර්යයන් සඳහා පමණයි (උපරිම දින 14)	100 0
14.	1. ගොඩනැගිලි අයදුම්පත්‍රයක් / බිම්කට්ටි/ පෝරම ගාස්තු	750 0
	2. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	500 0
	3. පෙර පාසල්වල ඇතුළත් වීමේ අයදුම්පත්‍ර ගාස්තු	200 0
	4. පුස්තකාල අයදුම්පත් ගාස්තු	50 0
	5. පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තු	150 0
	6. ඔප්පු සාරාංශ අයදුම්පත්‍ර ගාස්තු	500 0
15.	1. වීථි රේඛා සහතික ගාස්තු	500 0
	2. නොපවරා ගැනීමේ සහතික ගාස්තු	500 0
	3. චරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් සහතික ගාස්තු	500 0
	4. නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික ගාස්තු	500 0
16.	1. සභාව සතු රන්පොකුණගම/ වේයන්ගොඩ මහජන ක්‍රීඩා පිටිය මුදල් අයකරන කාර්යයන් සඳහා යොදවා ගැනීමේ දී කුලී අයකිරීම වැට් බදු රහිතව එක් දිනක් සඳහා	10,000 0
	2. සභාව සතු නිට්ටඹුව, රන්පොකුණගම/ වේයන්ගොඩ මහජන ක්‍රීඩා පිටිය මුදල් අය නොකරන කාර්යයක් සඳහා යොදවා ගැනීමේ දී කුලී අය කිරීම වැට් බදු රහිතව එක් දිනක් සඳහා	5,000 0

		රු. ශත
17.	රන්පොකුණගම හා වේයන්ගොඩ ක්‍රීඩා භූමිය සංගීත සංදර්ශන, සැණකෙළි සඳහා එක් දිනකට වෙන් කිරීමේ දී කොන්දේසි මත ආපසු ගෙවන තැන්පත් ගාස්තුව	25,000 0
18.	ඉහත ස්ථාන හැර ප්‍රාදේශීය සභාව සතු සියලුම ක්‍රීඩා පිටි සඳහා කුලී අයකිරීම වැට් බදු රහිතව එක් දිනක් සඳහා	2,500 0
19.	ලියාපදිංචි ත්‍රිරෝද රථ සංගමයක එක් ත්‍රිරෝද රථයක් සඳහා මසකට (කලින් කළ රජය විසින් පනවන බදු මුදල් අදාළ වේ)	100 0

12 - 161/6

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාල ව්‍යාපාර බදු නියම කිරීමට අදාල තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින පහත සඳහන් තීරණ ගන්නට යෙදුණු බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන යම් ව්‍යාපාරයක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බව තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *2024 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු වාර්ෂික බද්ද* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අය කිරීමක් නැත
රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන විට	90 0

I වැනි තීරුව *2024 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු වාර්ෂික බද්ද* *රු. ශත*
රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,001 ඉක්මවන විට	3,000 0

12 - 161/7

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2025

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාල කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණ අංක 614 යටතේ 2024 සැප්තැම්බර් මස 12 වැනි දින මා තීරණය කරන ලද බව නිවේදනය කරමි.

කේ. ඒ. උපුල් රංජිත්,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ සභාවේ
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව,
නිට්ටඹුව.

තීරණය

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන කටුගම්පල ආරච්චිලාගේ උපුල් රංජිත් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බව තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* *රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන* *රු. ශත*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

(1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව,

(I) හාලිඇල සහ ඇටම්පිටිය යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළකට ම සියයට හතරක (4%) වරිපනම් බද්දක් ද,

(II) ස්ප්‍රිංවැලි නගරය සහ උඩුවර 5 කණුව සිට උඩුවර 06 කණුව දක්වා යන කොට්ඨාසවල පිහිටි සෑම නිශ්චල දේපළකම සියයට තුනක (03%) වරිපනම් බද්දක් ද පනවා අය කළ යුතු බවටත් තීරණය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

12 - 123/4

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024.10.23 වැනි දින අංක 1066 යටතේ පහත උප ලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර් මස 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ හාලි ඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වගන්තිය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූද ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ

(අ) හෙක්ටයාර 05 ක් වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2025 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 (111) වන උප වගන්තියේ අතුරු විධි විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් හාලිඇල බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ඇ) වන කොටසේ 1989.04.28 දිනැති ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර් 05ට අඩු සෑම ඉඩමක් මත ම 2025 වර්ෂය සඳහා රු. 50.00 බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කිරීමට; සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (IV) වන උප වගන්තියේ විධි විධාන යටතේ 2025 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දින වලට පෙර සමාන වාරික 04කින් හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවීමට විධානය කළ යුතු යැයි තීරණය කරන්නේය. එකී තීරණය සඳහා 1989 අංක 12 දරන පළාත් සභා අනුෂාංගික විධි විධාන පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 111 වන උප වගන්තිය ප්‍රකාර උඟව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් 2025 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 04කින් හාලිඇල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2025 වර්ෂයේ ජනවාරි වසර 31 වැනි දිනට පෙර ගෙවනු ලැබුවහොත් මෙම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයට සියයට දහයක (10%) වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

උපලේඛනය

	ඉඩම් ප්‍රමාණය	*බදු අනු ප්‍රමාණය වර්ෂයකට රු. ශත*
01.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 කට අඩු නමුත් හෙක්ටයාර් 01ට නොඅඩු අවස්ථාවක හෙක්ටයාර් එකකට	50 0
02.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක හෙක්ටයාර් එකකට	10 0

12 - 123/5

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 වැනි වගන්තිය යටතේ කියවිය යුතු එම පනතේ 148 වැනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024.10.23 දින අංක 1067 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර් මස 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් පරිදි කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම බද්දක් අයකළ යුතු යැයි තීරණය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

උපලේඛනය

		රු. ශත
I.	මෝටර් රථයක් - මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක නොවන සෑම වාහනයක් සඳහාම	25 0

		රු. ශත
II.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	25 0
(අ)	වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නනේ නම්	18 0
(ආ)	වෙළඳ කාර්යය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	04 0
	*සෑම කරත්තයක් සඳහා	20 0
	*සෑම අත් කරත්තයක් සඳහා	10 0
	*සෑම රික්ෂෝවක් සඳහා	7 50
	*සෑම අශ්වයකු හෝ පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
	*සෑම අලියෙකු හෝ ඇතෙකු සඳහා	50 0

2. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 123/6

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වසර සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 (1) වැනි වගන්තිය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත එකී පනතට සිදුකර ඇති සංශෝධන අනුව සහ ඒ යටතේ සකස් කරන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1534/18 දරන වර්ෂ 2008 ක් වූ පෙබරවාරි මස 01 දිනැති *ගැසට් පත්‍රයේ* හා අංක 1533/16 දරන 2008.01.25 දිනැති *ගැසට් පත්‍රයේ* හා 2264/18 හා 2022.02.27 දිනැති *ගැසට් පත්‍රයේ* "ඇ" ලේඛනයේ හා මෙහි "අ" උපලේඛනයේ සඳහන් කර්මාන්තයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අවලංගු කිරීම හා අත්හිටුවීම සඳහා හාලිඇල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව හා එකී පනතේ 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024 වර්ෂයේ 10.23 දින අංක 1068 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර් මස 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත එකී පනතට සිදුකර ඇති සංශෝධන අනුව සහ ඒ යටතේ සකස් කරන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1534/18 දරන වර්ෂ 2008 ක් වූ පෙබරවාරි මස 01 දිනැති *ගැසට් පත්‍රයේ* හා අංක 1533/16 දරන 2008.01.25 දිනැති *ගැසට් පත්‍රයේ* "ඇ" ලේඛනයේ හා මෙහි "අ" උපලේඛනයේ සඳහන් කර්මාන්තයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අවලංගු කිරීම හා අත්හිටුවීම මෙම අධිකාරි බලය යටතේ සිදු කරනු ලැබේ. හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ ඉහත කී පනත් හා අදාළ සංශෝධන යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුව ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව වසර 03ක් හෝ ඊට අඩු කාලයක් සඳහා රු. 4000.00 ක බලපත්‍ර ගාස්තුවක් ද රු. 500.00 ක අයදුම්පත්‍ර ගාස්තුවක් ද "ආ" උපලේඛනයේ සඳහන් පරීක්ෂණ ගාස්තුවක් පනවා අය කිරීමට යෝජනා කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

"අ" උපලේඛනය

1. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදිත කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි සෝදන යන්ත්‍ර/මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණට කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මද්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බොතල්ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත සල්ෆර් දුම ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුමු ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුල් ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන

* මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය - පක්ෂීන් සංඛ්‍යාව + [50x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) + 10x (එළුවන් සංඛ්‍යාව)]

20. ගබඩා ධාරිතාව ඝන මීටර් 100ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ''ප්ලාස්ටර් ඔෆ් පැරිස්'' අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලි කටු ඇඹරීමේ/ පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිත වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉරුම් ධාරිතාවක් ඇති ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහු කාර්යය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයින් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ

36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ ''ඈ'' කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක් /කර්මාන්තයක්

2008.01.25 දිනැති අංක 1533/16 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබුවාවූ ද පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු වූද, නියම කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ *ගැසට් පත්‍රය* පරිච්ඡින්න කරනු ලැබේ.

පරිසර කටයුතු

		රු. ශත
1.	පාරිසරික බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පතක්	500 0
2.	පාරිසරික බලපත්‍ර ඉල්ලුම් පත්‍රයක්	
	* සුළු පරිමාණ	50 0
	* මධ්‍යම පරිමාණ	200 0
	* මහා පරිමාණ	1,000 0
3.	පරීක්ෂණ ගාස්තු:	
	මුදල් ආයෝජන 2,50,000 හෝ ඊට අඩු	3,000 0
	2,50,000 සිට 5,00,000 දක්වා	3,750 0
	5,00,000 සිට 10,00,000 දක්වා	5,000 0
	10000000 හෝ ඊට වැඩි	10,000 0
4.	පරිසර බලපත්‍ර ගාස්තු	4,000 0
5.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු	4,500 0

12 -123/7

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ගොඩනැගිලි හා දේපළ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වගන්ති වගන්ති යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ඇ) කොටසේ 8 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්ව කරන ලදුව (260 වන අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හා එකී පනතේ 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024.10.23 වන දින අංක 1069 යටතේ පහතඋප ලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර් මස, 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21, 49, 78 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව හා 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ඇ) කොටසේ 8 වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව (260 වන අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව හාලිඇල

ප්‍රාදේශීය සභා බලප්‍රදේශ සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා පහත සඳහන් ගාස්තු 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම යෝජනා කරමි.

ගොඩනැගිලි හා දේපළ : *රු. ශත*

1. අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි වන සේ සිදු කරන වෙනස් කිරීම් හා එකතු කිරීම් - මුළු පෙරසැරි ගාස්තුවෙන් 25% + වැඩි වන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව

2. අනුමත ගොඩනැගිලි සැලසුම අස්ථාන ගත වී හෝ විනාශ වී හෝ කුමන හේතුවක් මත නැවත එහි සහතික කරන ලද පිටපතක් ලබා ගැනීම - (එක් පිටපතක් සඳහා) 250 0

3. ඉදිකර අවසන් කළ නිවසක් සඳහා ගොඩනැගිලි සැලසුම අනුමත කර ගැනීමේදී පෙරසැරි ගාස්තු සමඟ දඩ මුදලක් අය කර ගැනීම - පෙරසැරි ගාස්තුවට අමතරව නාගරික සංවර්ධන අධිකාරියේ අංක 2235/54 හා 2021.07.08 වන දින නිකුත් කරන ලද අති විශේෂ *ගැසට් පත්‍රය* අනුව එම මුදලින් අඩක් ලබා ගත යුතුය.

4. ගොඩනැගිලි සැලසුම අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව 5 0
(වර්ග අඩියක් සඳහා)

5. අනුබෙදුම් සැලසුම් අනුමත කිරීම

ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)		පෙරසැරි ගාස්තු රු.
150 - 300	කැබලි 01ක් සඳහා	1,000.00
301 - 600	කැබලි 01ක් සඳහා	800.00
601 - 900	කැබලි 01ක් සඳහා	600.00
900ට වැඩි	කැබලි 01ක් සඳහා	500.00

6. මායිම් තාප්ප/ රැඳවුම් බැමි ඉදිකිරීම් දික් මීටර් 1ක් සඳහා 100 0

7. අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු 3,000 0
8. සංවර්ධන බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීමේ ගාස්තු 3,000 0
9. සන්නිවේදන කුළුණු සඳහා වර්ග මීටර් 1ට ගාස්තු 30,000 0
10. සන්නිවේදන ජාලා සංවර්ධනය කිරීමේ කේබල් එලීම (එක් කණුවක් සඳහා) 5,000 0
11. ගොඩනැගිලි අයදුම්පතක් නිකුත් කිරීම 2,000 0
12. විටිරේඛා සහ නොපවරා ගැනීමේ සහතිකය සඳහා වූ අයදුම්පත් ගාස්තු 2,000 0
විටිරේඛා සහ නොපවරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු 500 0

12-123/8

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම/ වෙන්දේසිකරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154 වනි වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර හා එකී පනතේ 9.3 උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024.10.23 වන දින අංක 1070 යටතේ පහත උප ලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර්, 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

12-123/9

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් වෙනුවෙන් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ ගාස්තු පැනවීම සම්බන්ධව එකී පනතේ 9 (3) උප වගන්තිය සහා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024.10.23 වන දින අංක 1071 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර්, 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බල ප්‍රදේශය ඇතුළත ප්‍රචාරණය කරන ලද සෑම ප්‍රචාරක දැන්වීමක් සඳහාම 2025 වර්ෂය සඳහා ගාස්තු පනවා අය කල යුතු යැයි මම තීරණය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

දැන්වීම් පුවරු ගාස්තු :

තාවකාලික දැන්වීම් පුවරු හා බැනර් :		*රු. ශත*
1. තාවකාලික ප්‍රචාරක දැන්වීම් පුවරු (බැනර්) වර්ග අඩියකට (සතියකට)		200 0
	(මාසයකට)	175 0
	(අවුරුද්දකට)	150 0

■ **ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු :**

1.	ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු ඉදිකිරීම සඳහා වර්ග අඩියකට	150 0
2.	ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට (වර්ෂයක් සඳහා ප්‍රදර්ශනයට අනුමැතිය ඇතිව)	150 0
3.	ආලෝක සංඥා නාම පුවරු සඳහා වර්ග අඩියකට (වර්ෂයක් සඳහා පමණි)	100 0

		රු. ශත
4.	අදාළ ව්‍යාපාරික ස්ථානයේ නමට අමතරව එම නාම පුවරුවේ වෙනත් වෙළෙඳ නාමයක් ප්‍රදර්ශනය කර ඇත්නම් වර්ග අඩියකට (වර්ෂයක් සඳහා පමණි)	100 0
5.	ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ඇප තැන්පත්	
	1. වර්ග අඩි 50ට අඩු නම්	500 0
	2. වර්ග අඩි 1,000 ට අඩු නම්	1,000 0
	3. වර්ග අඩි 1,000 ට වැඩි නම්	1,500 0
6.	ඩිජිටල් දැන්වීම් පුවරු (වර්ග මීටර් 1 කට)	2,500 0
■	ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (වර්ග මීටර් 1කට)	1,500 0
■	නාම පුවරු (වර්ග මීටර් 1කට)	500 0
■	මාර්ගයට ඉහලින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (වර්ග මීටර් 1කට)	1,000 0

12 - 123/10

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වසර සඳහා ජල සේවා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 118 වැනි වගන්තිය සහ 1988.08.23 දිනැති *ගැසට් පත්‍රයේ* 17 වැනි කොටසේ අතුරු ව්‍යවස්ථා වගන්ති ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024.10.23 වන දින අංක 1072 යටතේ පහත උප ලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර්, 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

හාලිඇල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කර ඇති ජල ව්‍යාපෘතිවලට අදාළව ජල ගාස්තු 2025 වර්ෂය සඳහා පහත උප ලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

ජල සේවා :		*රු. ශත*
1.	ජල අයදුම්පතක්	1,000 0
2.	දෙපාර්තමේන්තු ගාස්තු ඇස්තමේන්තුගත මුදලින්	33 %
3.	ජලනළ සන්ධි කිරීමේ ගාස්තු (විසන්ධි කරන ලද)	2,850 0
4.	ජල සේවා තැන්පත් ගාස්තු	1,000 0
5.	පරීක්ෂණ ගාස්තු	3,000 0
6.	කම්කරු ගාස්තු	2,000 0

සියලුම ගෘහස්ථ ජල ගාස්තු ජල මනු සහිතව ආරම්භ කරන ලද ජල යෝජනා ක්‍රම :

1.	ස්ථාවර ගාස්තු	300 0
2.	ඒකක 01 සිට 15 දක්වා (ඒකකයක්)	15 0
3.	ඒකක 16 සිට 20 දක්වා ඒකකයක් සඳහා	20 0

		රු. ශත
4.	ඒකක 21 සිට 25 දක්වා ඒකකයක් සඳහා	30 0
5.	ඒකක 26 සිට 40 දක්වා ඒකකයක් සඳහා	40 0
6.	ඒකක 40ට වැඩි ඒකකයක් සඳහා	50 0
7.	ජලමනු නොමැති හා අක්‍රීය මනු සඳහා මාසිකව (මනු තාවකාලිකව ඉවත්කර ඇති විට)	500 0

වාණිජ ආයතන : (ජලමනු සහිතව ආරම්භ කරන ලද ජල යෝජනා ක්‍රම) මාසික :

1.	ස්ථාවර ගාස්තු	500 0
2.	පළමු ඒකක 1-5	50 0
3.	වැඩිවන සෑම ඒකකයක් සඳහා ම	60 0
4.	ජල මනු නොමැති හා අක්‍රීය මනු සඳහා මාසිකව	1,000 0

12-123/11

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

1987 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024.10.23 වන දින අංක 1073 යටතේ පහත උප ලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර්, 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව විනෝද බදු නියම කිරීම පහත උපලේඛනයෙ හි සඳහන් ආකාරයට විය යුතු යැයි මම යෝජනා කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

උපලේඛනය

අනු අංකය	*ඇතුල්වීමට ගෙවන ලද ප්‍රවේශ පත්‍රයක ගාස්තුව*	*විනෝද බදු ප්‍රතිශතය*
01.	ප්‍රවේශ පත්‍රයක වටිනාකම රු. 10.00 ට වැඩි නමුත් රු. 25.00 නොඉක්මවන අවස්ථාවක	15%
02.	ප්‍රවේශ පත්‍රයක වටිනාකම රු. 25.00 ට වැඩි නමුත් රු. 50.00 නොඉක්මවන අවස්ථාවක	20%
03.	ප්‍රවේශ පත්‍රයක වටිනාකම රු. 50.00 ට වැඩි වන අවස්ථාවක	25%
04.	ප්‍රවේශ පත්‍රයක වටිනාකම චිත්‍රපටයක් නැරඹීම සඳහා ගෙවනු ලබන ඕනෑම ප්‍රවේශ පත්‍රයක් සඳහා	25%

හාලිඇල ප්‍රාදේශීය සභාව

2025 වසර සඳහා සේවා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හා ඒ යටතේ සාදන අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ හාලිඇල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ 9 (3) උප වගන්තියෙන් සභා ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2024.10.23 වන දින අංක 1074 යටතේ පහත උප ලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

2024 නොවැම්බර්, 14 වැනි දින,
හාලිඇල ප්‍රාදේශීය සභාව,
හාලිඇල.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හා ඒ යටතේ සාදන අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන ප්‍රකාරව හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු යැයි මම යෝජනා කරමි.

ඒ. ජේ. බැද්දෙවිතානගේ,
සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව, හාලිඇල.

		රු. ශත
01.	**පුස්තකාල :**	
1.	**පුස්තකාල සාමාජික ගාස්තු:**	
	* පාසල් සිසුන්	50 0
	* වැඩිහිටියන්	50 0
2.	**පුස්තකාලීය සාමාජික තැන්පත් මුදල:**	
	* පාසල් සිසුන්	100 0
	* වැඩිහිටියන්	100 0
3.	**පුස්තකාල දඩ :**	
	* පොතක් අස්ථානගත වූ විට පොතේ වටිනාකම සමග	25%
	* ප්‍රමාද දඩ මුදල් (දිනකට)	5 0
4.	**පුස්තකාල සාමාජිකත්වය වාර්ෂිකව අලුත් කිරීමේ ගාස්තු :**	
	• පාසල් සිසුන්	50 0
	• වැඩිහිටියන්	50 0
5.	පරිගනක අංශය සඳහා සාමාජික ගාස්තු	500 0
02.	**පෙර පාසල් :**	
1.	පෙර පාසල් සේවා ගාස්තු වාර්ෂික	1,500 0
2.	පෙර පාසල් ඇතුළත් වීමේ ගාස්තු වාර්ෂික	750 0
03.	**වාහන**	
1.	ට්‍රැක්ටර් රථ කුලියට දීම බල ප්‍රදේශය තුළ දිනකට (පැය 08 ඉන්ධන සහිතව)	15,000 0

		රු. ශත
2.	ඇප තැන්පත්	2,000 0
3.	ට්‍රැක්ටර් රථ කුළියට දීම බල ප්‍රදේශයෙන් පිට දිනකට (පැය 08 ඉන්ධන සහිතව)	20,000 0
4.	ඩෝසරය කුළී (J. C. B.) පැයකට (ඉන්ධන සහිතව)	6,000 0
5.	ඇප තැන්පත්	5,000 0
6.	ලොරි රථ කුළී (ලොකු) කියුබ් 2 1/2 පැය 8 ට (ඉන්ධන රහිතව)	25,000 0
7.	අවම වරුවකට (උපරිම පැය 4)	15,000 0
8.	ඇප තැන්පත්	5,000 0
9.	ප්‍රමාද පැයකට	3,500 0
10.	මෝටර් ග්‍රේඩරය දිනකට (පැය 1 සඳහා ඉන්ධන සහිතව)	6,000 0
11.	ඇප තැන්පත්	5,000 0
12.	ප්‍රමාද පැයකට	3,500 0
13.	ජල බවුසරය (ට්‍රැක්ටර් බවුසරය)	5,000 0
14.	ලොකු ජල බවුසරය (බල ප්‍රදේශය තුළ)	15,000 0
15.	ජල සම්පාදනයේ සිට ගෙන යන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 75.00 බැගින් ඉල්ලුම්කරු දැරිය යුතුය.	
16.	බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ ලියාපදිංචි ගාස්තු	2,500 0
17.	මාසිකව අයකරනු ලබන ගාස්තු	300 0
	අනෙකුත් සියලුම වාහන සඳහා - අතුරු ව්‍යවස්ථාව අනුව අය කරනු ලැබේ.	
18.	ලොරි රථ හා වෑන් රථ සඳහා ලියාපදිංචි ගාස්තු	5,000 0
19.	මාසිකව අයකරනු ලබන ගාස්තු	500 0
20.	ගලි බවුසරය (සෑම කිලෝමීටරයක් සඳහාම රු. 200.00)	6,000 0

04. ශ්‍රවණාගාරය සඳහා ගාස්තු අය කිරීම

10.	*හාලිඇල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය වෙන් කිරීම*	
	පරිගණක හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මල්ටි මීඩියා සහිතව වරුවකට හා දිනකට	6,000 0
	පරිගණක හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මල්ටි මීඩියා සහිතව වරුවකට	2,000 0
	දිනකට	3,500 0
	● ආපසු ගෙවන තැන්පත් (පැය 8ක් සඳහා)	5,000 0
11.	හාලිඇල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය වෙන් කිරීම (පැය 1) බල ප්‍රදේශ සීමාවෙන් පිට	3,000 0
	● ආපසු ගෙවන තැන්පත්	5,000 0
12.	රාජ්‍ය ආයතන සඳහා	5,000 0
	● ආපසු ගෙවන තැන්පත්	2,000 0

05. පොදු ක්‍රීඩාංගනය සඳහා ගාස්තු අය කිරීම

1.	වෙළඳ ප්‍රචාරක අනුග්‍රහය සහිතව ක්‍රීඩා පිටිය වෙන් කිරීම සඳහා (හාලිඇල පොදු	20,000 0
	● ආපසු ගෙවන තැන්පත්	5,000 0
2.	රාජ්‍ය ආයතන සඳහා	5,000 0
	● ආපසු ගෙවන තැන්පත්	5,000 0
3.	පොදු ක්‍රීඩාංගනය වෙන් කිරීම (දිනකට) රාජ්‍ය නොවන ආයතන සඳහා	10,000 0
	● ආපසු ගෙවන තැන්පත්	5,000 0
4.	පොදු ක්‍රීඩාපිටිය ක්‍රිකට් ක්‍රීඩාව සඳහා වෙන්කර දීම (දිනකට)	10,000 0
5.	වෙනත් කටයුතු සඳහා	10,000 0
	සංගීත සංදර්ශන/වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන්/දේශපාලන රැස්වීම්/සැණකෙළි සඳහා පොදු ක්‍රීඩාංගනය වෙන් කිරීම සිදු නොකෙරේ.	
06.	හාලිඇල ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිලි, ජලය හා විදුලිය සපයා පැය 24 ක කාල සීමාවකට වෙන් කිරීම	5,000 0
07.	පොළ ගොඩනැගිල්ල වෙන් කිරීම (පොළ නොමැති දිනවලදී පමණි)	
	■ පෞද්ගලික අධ්‍යාපන ආයතන හා පෞද්ගලික ගුරුවරුන්ගේ සම්මන්ත්‍රණ සඳහා	3,500 0
	■ ජල/ විදුලි ගාස්තුව	1,000 0
	■ ඇප තැන්පත්	2,000 0

■ ක්‍රීඩා පුහුණු කඳවුරු/ අධ්‍යාපන වැඩසටහන් සඳහා	3,500	0
■ ජල/ විදුලි ගාස්තුව	1,000	0
■ ඇප තැන්පත්	2,000	0
■ පෞද්ගලික ආයතනවල වැඩ සටහන් සඳහා	9,500	0
■ ජල/ විදුලි ගාස්තුව	1,000	0
■ ඇප තැන්පත්	2,000	0
■ රූපලාවන්‍ය කටයුතු හා වෙනත්	7,500	0
■ Food Festival සඳහා	7,500	0
■ වෙළෙඳ කුටි 10කට	2,000	0
■ වෙළෙඳ කුටි 10කට වැඩි නම්	5,000	0
■ ජල/ විදුලි ගාස්තුව	1,000	0
■ ඇප තැන්පත්	2,000	0
■ රැස්වීම් සඳහා	10,000	0
■ ජල/ විදුලි ගාස්තුව	1,000	0
■ ඇප තැන්පත්	2,000	0
■ කුඩා ව්‍යාපාරිකයින් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා	5,000	0
■ ජල/ විදුලි ගාස්තු	1,000	0
■ ඇප තැන්පත්	2,000	0
■ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා	10,000	0
■ ජල/ විදුලි ගාස්තුව	1,000	0
■ ඇප තැන්පත්	2,000	0
■ සංගීත සංදර්ශන සඳහා (පැයකට)	10,000	0
■ ජල/ විදුලි ගාස්තුව	2,500	0
■ වෙනත් (ඉහත සඳහන් කරුණු හැර)	10,000	0
■ ජල/ විදුලි ගාස්තුව	1,000	0
■ ඇප තැන්පත්	2,000	0

පොළ භූමිය තුළ - බිම් කොටස් විස්තර හා දිනකට අය කළ යුතු ගාස්තු විස්තර

01. සංවර්ධනය කරන ලද පොළ ගොඩනැගිලිවල දෙකෙළවරේ පොළව මත සලකුණු කොට ඇති එක් කොටසකින් යුත් බිම් කොටසකට දිනකට	300	0
02. සංවර්ධනය කරන ලද පොළ ගොඩනැගිලි වල දෙකෙළවරේ කොටු හැර අනෙකුත් එක් කොටුවක් සඳහා දිනකට	150	0

එළිමහන් බිම් කොටස් සඳහා

03.	වර්ග අඩි 25ක් හෝ ඊට අඩු බිම් කොටසකට වර්ග අඩියකට	25	0
04.	වර්ග අඩි 50ක බිම් කොටසකට	100	0
05.	වර්ග අඩි 75ක බිම් කොටසකට	150	0
06.	වර්ග අඩි 100ක බිම් කොටසකට	200	0
07.	වර්ග අඩි 100ට වැඩි සෑම වර්ග අඩියකටම	10.00	බැගින්

වෙනත්

08.	මාළු තට්ටුවක් සඳහා	500	0
09.	හාලිඇල, රිල්පොල, උඩුවර හා ඇටම්පිටිය කැටවල උප කාර්යාලය සීමා තුළ සභාව සතු අනෙකුත් භූමි තාවකාලිකව වෙන් කිරීම (දිනකට)	5,000	0
දෛනික ජංගම අලෙවිකුටි (තාවකාලික) සඳහා බිම්කුළිය (දිනකට) වර්ග අඩියකට		25	0
10.	මාර්ග පළුදු කිරීමේ පරීක්ෂණ ගාස්තු	3,000	0

		රු. ශත.
11.	වරිපනම් හිමිකම් සහතික - පළමු වර්ෂ 2කටම	1,000 0
	වැඩිවන සෑම වර්ෂයක් සඳහා	100 0
12.	පොදු සේවාවන් සඳහා වරිපනම් සහතිකයක් නිකුත් කිරීම	1,000 0
13.	නගරයේ රාජ්‍ය ස්ථාන ඉදිරිපස රථ වාහන නැවැත්වීම සඳහා (වෙන්කර දෙන විශේෂ ස්ථානවල) වර්ග අඩියක් සඳහා (වර්ෂයකට)	500 0
14.	ඔප්පු සාරාංශ පෝරම ගාස්තු	1,500 0
15.	එක් තාවකාලික ගව ඝාතන පෝරම ගාස්තු	10,000 0
16.	එක් තාවකාලික ගව ඝාතන බලපත්‍ර ගාස්තු	25 0

		ප්‍රතිශතය
17.	**කර්මාන්ත ගිවිසුම් ගැන්වීමේදී අය කරනු ලබන පෝරම ගාස්තු**	
1.	පොදු අරමුදල් කර්මාන්ත හා අනෙකුත් සෑම කර්මාන්තයක් සඳහාම ගිවිසුම්ගත මුදලින්	1%
2.	ටෙන්ඩර් මගින් පිරිනමනු ලබන කර්මාන්ත සඳහා ගිවිසුම් ගත මුදලින් රු. 1000 සිට රු. 99,999 දක්වා	1%
3.	වැඩි වන සෑම 100,000 ට ම හෝ ඉන් කොටසකට	1%
4.	හාලිඇල ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් කරුවෙකු, බ්‍රෝකර්වරයෙකු, වෙන්දේසි සැපයුම්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමේ ගාස්තු (රු. 50,000/- ට වැඩි)	5,000 0
5.	වාර්ෂික සැපයුම්කරුවන් හා රු. 100,000/- ක වටිනාකම ඉක්මවා යන කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි ගාස්තු	10,000.00

18.	**රථ වාහන නවතා තැබීම ගාස්තු**	
1.	ත්‍රි රෝද රථ සඳහා පැයකට	30 0
2.	වෑන් රථ සඳහා පැයකට	50 0
3.	ලොරි රථ සඳහා පැයකට	100 0
4.	ලොකු ලොරි රථ සඳහා පැයකට	100 0

19.	**කොම්පෝස්ට් පොහොර විකිණීම (25Kg)**	400 0
	බෑග් රහිත පොහොර ඇණවුම් සඳහා (25Kg)	300 0
	(10Kg)	175 0
	(5Kg)	100 0

- කොම්පෝස්ට් පොහොර 2000Kg - 5000Kg ඇණවුම් සඳහා 10%ක වට්ටමක් ලබා දෙනු ලැබේ.
- කොම්පෝස්ට් පොහොර 5000Kg වැඩි ඇණවුම් සඳහා 15%ක වට්ටමක් ලබා දෙනු ලැබේ.

20.	**ප්‍රසම්පාදන**	
1.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	1,000 0

21.	**කොඩි කණු කුළියට දීම**	
1.	එක් කොඩි කණුවක් සඳහා දිනකට ගාස්තුව	30 0
2.	එක් කොඩි කණුවකට තැන්පත් මුදල	200 0

22.	1. ආදාහනාගාරය (ආදාහනයක් සඳහා) බල ප්‍රදේශ සීමාව තුළ	13,000 0
	2. ආදාහනාගාරය (ආදාහනයක් සඳහා) බල ප්‍රදේශ සීමාවෙන් පිට	14,000 0
	3. හාලිඇල බල ප්‍රදේශයේ භෂ්මාවශේෂ තැන්පත් කිරීමේ කුටියක් සඳහා	25,000 0

23.	1. පොදු වැසිකිළි පහසුකම්	30 0

24.	කැනපි කුළියට දීම	
	1. එක් කැනපියක් සඳහා දිනකට කුලිය	1,500 0
	■ රාජ්‍ය ආයතන සඳහා	1,000 0

සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම දැන්වීමේ එක් එක් භාෂාවලින් පළ කිරීමේ යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

12-123/13

වැලිකන්ද ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2024 ඔක්තෝබර් මස 15 වැනි දින පවත්වන ලද මාසික පරිපාලන කමිටු රැස්වීමේ දී පහත යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, 2025 මැයි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. අයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය
කාර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිපාලන කමිටු යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් ම මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයේ බද්දක්, 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2025 වර්ෂයේ මැයි මස 31 වැනි දිනට පෙර වැලිකන්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් වැලිකන්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේය.

උපලේඛනය

I වැනි තීරුව *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 751 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
පාවහන් නිෂ්පාදනය සහ අලෙවිය	500 0	750 0	1,000 0
ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
රබර් වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
ඖෂධීය බෙහෙත් වර්ග හා තෙල් වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
ඉදල්, පාපිසි හා කොහු ආශ්‍රිත නිෂ්පාදනය	500 0	750 0	1,000 0
පැණි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
කුළු බඩු නිෂ්පාදන සහ අලෙවිය	500 0	750 0	1,000 0
හස්ත කර්මාන්ත	500 0	750 0	1,000 0
වාහන සේවාකරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
විදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
බිම්මල් නිෂ්පාදනය සහ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
සිංහල බෙහෙත් බඩු අලෙවිය	500 0	750 0	1,000 0
ධාන්‍ය සහ තේ කුඩු පැකට්කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 751 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
පොහොර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
පොහොර බහාලුම් මලු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
විදුලි උපකරණ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
විදුලි උපකරණ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
සත්ත්ව ආහාර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිදීම	500 0	750 0	1,000 0
වැල්ඩින් වැඩ පලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ජලය පිරිසිදු කර අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-114/1

වැලිකන්ද ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2024 ඔක්තෝබර් මස 15 වැනි දින පවත්වන ලද මාසික පරිපාලන කමිටු රැස්වීමේ දී පහත යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද, 2025 මැයි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. අයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය
කාර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිපාලන කමිටු යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වැලිකන්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක්, 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් යම් තැනැත්තෙකු 2025 වර්ෂයේ මැයි මස 31 වැනි දිනට පෙර වැලිකන්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් වැලිකන්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේය.

උපලේඛනය

I වැනි තීරුව *2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*		*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* රු. ශත
1.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අය කිරීමක් නැත
2.	රු. 6,001 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මන අවස්ථාවක	90 0
3.	රු. 12,001 ඉක්මවන එහෙත් රු 18,750 නොඉක්මන අවස්ථාවක	180 0
4.	රු. 18,751 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මන අවස්ථාවක	360 0
5.	රු. 75,001 ඉක්මවන එහෙත් රු. 150,000 නොඉක්මන අවස්ථාවක	1,200 0
6.	රු. 150,001 ඉක්මවන අවස්ථාවක	3,000 0

වෘත්තීය හා ව්‍යාපාර බදු මුදල් අය කිරීම සඳහා ව්‍යාපාර :

1. කොමිස් ඒජන්තවරුන්
2. වෙන්දේසි හා තැරැව්කරුවන් ලෙස ක්‍රියා කිරීම
3. බඩු උකස් ගන්නෙකු ලෙස ක්‍රියා කිරීම
4. කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම
5. ගණන් පරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කිරීම
6. ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස ක්‍රියා කිරීම
7. රක්ෂණ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කිරීම
8. මුදල් ණයට දෙන්නෙකු ලෙස ක්‍රියා කිරීම
9. ප්‍රධාන සේවා අයිතිකරුවෙකු හෝ ඒජන්තවරයෙකු ලෙස ක්‍රියා කිරීම
10. ආදායම් බදු හෝ කම්කරු නීති උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම
11. මිනින්දෝරු කාර්යාලයක් පවත්වාගෙන යාම
12. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම
13. නීතීඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
14. බටහිර වෛද්‍ය විශේෂඥ සේවාවක් පවත්වාගෙන යාම
15. දේශීය වෛද්‍ය විශේෂඥ සේවාවක් පවත්වාගෙන යාම
16. දන්ත වෛද්‍ය ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
17. ලොතරැයි ඒජන්තවරයෙකු ලෙස ක්‍රියා කිරීම
18. රේස් ඔට්ටු භාරගන්නා තැනැත්තවුන් ලෙස ක්‍රියා කිරීම
19. වාණිජ බැංකු, ග්‍රාමීය බැංකු පවත්වාගෙන යාම
20. විදේශ රැකියා ඒජන්තවරයෙකු ලෙස ක්‍රියා කිරීම
21. භාණ්ඩ ආනයනකරුවෙකු ලෙස ක්‍රියා කිරීම
22. භාණ්ඩ අපනයනකරුවෙකු ලෙස ක්‍රියා කිරීම
23. පුද්ගලික ආරෝග්‍යශාලා පැවැත්වීම
24. පුද්ගලික අධ්‍යාපන පන්ති පැවැත්වීම
25. විදුලි සංදේශ කුළුණු
26. ලී බඩු අලෙවිය සහ ගෘහ භාණ්ඩ අලෙවිය
27. දැව සහ ලී අලෙවිය
28. යතුරු පැදි අලෙවිය
29. ත්‍රිරෝද රථ අලෙවිය
30. වාහන උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
31. වී ගබඩා කිරීම සහ අලෙවිය
32. කොන්ක්‍රීට් වැඩපලක් පවත්වාගෙන යාම
33. වාහන කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම

34. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම
35. තොග වෙළඳසැලක් පවත්වාගෙන යාම
36. ජංගම අලෙවිසැලක් හෝ ජංගම වෙළඳාම
37. කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම
38. ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
39. පුද්ගලික අධ්‍යාපන සේවා ආයතනයක් පවත්වාගෙන යාම
40. රියදුරු පුහුණු සේවා ආයතනයක් පවත්වාගෙන යාම
41. දුරකථන අලෙවිය
42. නිමි ඇඳුම් අලෙවිය
43. විසිතුරු භාණ්ඩ හා තෑගි භාණ්ඩ අලෙවිය
44. වාහන දුම් පරීක්ෂා කිරීම
45. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම
46. ස්වර්ණාභරණ අලෙවිය
47. සහල් අලෙවිය
48. ඉදිකිරීම් ද්‍රව්‍ය අලෙවිය හා කුළියට දීම
49 ද්‍රව්‍ය සහ වැලි, පස් සහ ගල් ප්‍රවාහන ආයතනයක් පවත්වාගෙන යාම
50. හාඩ්වෙයාර් එකක් පවත්වාගෙන යාම
51. ගොඩනැගිලි සැලසුම් පිළියෙළ කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
52. සංචාරක වෙළඳාම

12-114/2

වැලිකන්ද ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2024 ඔක්තෝබර් මස 16 වැනි දින පවත්වන ලද මාසික පරිපාලන කමිටු රැස්වීමේ දී පහත යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු ම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් (30) සම්පූර්ණ වූ වහාම 2025 වර්ෂය සඳහා වන බද්ද, වැලිකන්ද ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. අයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය
කාර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිපාලන කමිටු යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේදී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට වැලිකන්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේය.

උපලේඛනය

		1 වැනි තීරුව	*11 වැනි තීරුව*
			රු. ශත
(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා		25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා		
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්		18 0
	(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්		04 0
(iii)	සෑම කරත්තයක් සඳහා		20 0
(iv)	සෑම අත්කරත්තයක් සඳහා		10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා		7 50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවකු සඳහා		15 0
(vii)	සෑම ඇතෙකු සඳහා		50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ. මේ උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-114/3

වැලිකන්ද ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කසළ බදු පැනවීම

වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2024 ඔක්තෝබර් මස 15 වැනි දින පවත්වන ලද මාසික පරිපාලන කමිටු රැස්වීමේ දී පහත යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා පනවන ලද කසළ බද්ද, එකී බද්දට යටත් මහජනතාව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. අයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය
කාර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිපාලන කමිටු යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේ දී පහත උපලේඛන I හි සඳහන් ප්‍රදේශයන්ගෙන් අනුරූපිත වූ බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට වැලිකන්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේය.

උපලේඛන i

වැලිකන්ද ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ඇති වැලිකන්ද, මොණරතැන්න, බෝඅත්ත, සුසිරිගම, සෙවනපිටිය, මහවැව, කටුවන්විල ඇතුගල සහ කඩවතමඩුව යන ප්‍රදේශයන්හි පිහිටි,

- සිල්ලර වෙළඳ සැල්, බාබර් සාප්පුවලින් මසකට - රු. 700 0 බැගින් වර්ෂයකට රු. 8,400 0 ක් ද,
- හෝටල්, හාඩ්වෙයාර් වලින් මසකට - රු. 800 0 බැගින් වර්ෂයකට රු. 9,600 0 ක් ද,
- ඕනෑම ව්‍යාපාරික ස්ථානයකට මසකට - රු. 500 0 බැගින් වර්ෂයකට රු. 6,000 0 ක් ද,
- පදිංචි නිවසකට මාසයකට - රු. 500 0 බැගින් වර්ෂයකට රු. 6,000 0 ක් ද,
- තානායම් වලින් මාසයකට - රු. 1,000 0 බැගින් වර්ෂයකට රු. 12,000 0 ක් ද,
- රජයේ හෝ අර්ධ රජයේ ආයතනවල - මාසයකට - රු. 1,000 0 බැගින් වර්ෂයකට රු. 12,000 0 ක් ද,
- ව්‍යාපාරික ස්ථාන සහ ගෘහස්ථව එක්රැස්කරනු ලබන කසළවලට අමතරව බැහැරකරනු ලබන ගස් කපා ඉවත් කරනු ලබන අතුකොළ කැබිලිති ආදිය, පස්, ගල්, ගොඩනැගිලි සුන්බුන් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ලෝඩ් එකකට රු. 2,000 0
- සතිපොළ සඳහා සතියකට රු. 1,000 0 වශයෙන් කසළ බද්දක් 2025 වර්ෂයේ අය කිරීම.

12-114/4

වැලිකන්ද ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය - බලපත්‍ර ගාස්තු පැනවීම

වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2024 ඔක්තෝබර් මස 15 වැනි දින පවත්වන ලද මාසික පරිපාලන කමිටු රැස්වීමේ දී පහත යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2025 වර්ෂයේ දී වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. අයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය
කාර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිපාලන කමිටු යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවසථාවක් යටතේ හෝ වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ i වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ ii වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත් වැලිකන්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේය.

උපලේඛනය

I වැනි තීරුව — *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යය*

II වැනි තීරුව — *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*

	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
කිරි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
මාළු විකිණීම	500 0	750 0	1,000 0
මස් විකිණීම	500 0	750 0	1,000 0
අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
සිසිල්බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කොණ්ඩා සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කළුගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0

එසේ වුවද යම් පරිශ්‍රයක, හෝටලයක ආපන ශාලාවක හෝ නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද අනුමත කර හෝ පිළිගන්නා වූ ද අවස්ථාවක බලපාන ගාස්තු 2024 වර්ෂයේ ඒ හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පොළෙහි ආදායමෙන් 1% ක් විය යුතුය.

12-114/5

වැලිකන්ද ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීම් සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම - 2025 වර්ෂය

වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින පවත්වන ලද මාසික පරිපාලන කමිටු රැස්වීමේදී යෝජනා සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ රඟුම් ආඥාපනත යටතේ වැලිකන්ද ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව සහා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන සෑම චිත්‍රපට සංදර්ශනයක් නාට්‍යයක්, සර්කස් සංදර්ශනයක්, චිත්‍රපටයක් සඳහා බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. අයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය
කාර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිපාලන කමිටු යෝජනාව

ප්‍රසිද්ධ රැඟුම් ආඥාපනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව වැලිකන්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ පවත්වාගෙන යන සෑම චිත්‍රපට සංදර්ශනයක්, නාට්‍යයක්, සර්කස් සංදර්ශනයක්, චිත්‍රපටයක් සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට පනවා අයකිරීමට වැලිකන්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේය.

උපලේඛනය

ප්‍රසිද්ධ රඟ දැක්වීම සඳහා බලපත්‍ර ගාස්තු

කාලය	*ගාස්තුව* *රු. ශත*
1. දිනකට	250 0
2. සතියකට	500 0
3. සතියකට වැඩි, මාසයකට අඩු	750 0
4. මසකට වැඩි, වසරකට අඩු	1,000 0
5. චිත්‍රපට සංස්ථාව විසින් අනුමත කර ඇති චිත්‍රපට පෙන්වන ශාලා හැර ඉන් පරිබාහිරව පෙන්වනු ලබන චිත්‍රපට දර්ශන, ආධාර චිත්‍රපට දර්ශන, මැජික් සංදර්ශන, නැටුම් සංදර්ශන, සර්කස් සංදර්ශන හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම අලෙවි කරනු ලබන සෑම ප්‍රවේශ පත්‍රයෙන්ම 15% ක බදු මුදලක් ගෙවිය යුතු ය.	
6. ප්‍රසිද්ධ සංදර්ශන බලපත්‍ර ගාස්තුව (එක් දිනක් සඳහා)	1,000 0

12-114/6

වැලිකන්ද ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සේවා ගාස්තු සහ කුළියට දීම් වෙනුවෙන් ගාස්තු අය කිරීම

වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ ඔක්තෝබර් මස 15 වැනි දින පවත්වන ලද මාසික පරිපාලන කමිටු රැස්වීමේ දී යෝජනා සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2025 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා කුලියට දීම් වෙනුවෙන් වන ගාස්තුව සහා බල ප්‍රදේශය එකී ගාස්තුවට යටත් මහජනතාව වැලිකන්ද ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. අයි. විජේසුන්දර,
ලේකම් හා බලතල කාර්ය
කාර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
වැලිකන්ද ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින
වැලිකන්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිපාලන කමිටු යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට හා 2025 ජනවාරි මස සිට ගෙවිය යුතු බවටත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේය.

උපලේඛනය

2025 වර්ෂයට අයදුම්පත්/සහතික ගාස්තු සහ වෙනත් සේවා ගාස්තු

අනු. අංකය		*2025 වර්ෂයට ගාස්තු* *රු. ශත*
01.	පරිසර අයදුම්පත්	200 0
02.	වීථි රේඛා අයදුම්පත්	400 0
03.	ගොඩනැගිලි අයදුම්පත්	600 0
04.	අනුබෙදුම් සහතික අයදුම්පත්	100 0

05. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම :

(අ) ස්ථිර ගොඩනැගිලි සඳහා - ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය යොදා ගනිමින් ස්ථිර ලෙස ඉදිකර ඇති ගොඩනැගිලි (බිම් මහල, පළමු මහල, දෙවන මහල සඳහා ගාස්තු අය කිරීම)

	වාණිජ *රු. ශත*	*නේවාසික* *රු. ශත*
0 m^2 - 45 m^2	1,200 0	500 0
46 m^2 - 90 m^2	2,400 0	1,500 0
91 m^2 - 180 m^2	3,600 0	2,500 0
181 m^2 - 270 m^2	4,800 0	3,500 0
271 m^2 - 450 m^2	7,200 0	4,500 0
451 m^2 - 675 m^2	9,600 0	5,500 0
676 m^2 - 900 m^2	12,000 0	6,500 0
901 m^2 - 1225 m^2	14,400 0	7,500 0
	1226 m^2 කට වඩා වැඩි වන සෑම වර්ග මීටර් 90 කට වරක් රු. 1,500.00	1226 m^2 කට වඩා වැඩි වන සෑම වර්ග මීටර් 90කට වරක් රු. 1,000.00
ප්‍රාදේශීය සභා ගාස්තු	සෑම වර්ග මීටර් 1 ක් රු. 10.00 බැගින්	සෑම වර්ග මීටර් 1 ක් රු. 2.50 බැගින්

(ආ) අර්ධ ස්ථිර ගොඩනැගිලි සඳහා - අත්තිවාරම සහිතව ස්ථිර සහ තාවකාලික ගොඩනැගිලි (අමානෝ ෂීට්, ලෑලි, යකඩ ආදී ඉදිකිරීම් ද්‍රව්‍ය යොදා ගනිමින් ඉදිකර ඇති ගොඩනැගිලි
(බිම් මහල, පළමු මහල, දෙවන මහල සඳහා ගාස්තු අය කිරීම)

	වාණිජ *රු. ශත*
0 m^2 - 45 m^2	900 0
46 m^2 - 90 m^2	2,100 0
91 m^2 - 180 m^2	3,300 0
181 m^2 - 270 m^2	4,500 0
271 m^2 - 450 m^2	5,700 0
451 m^2 - 675 m^2	6,900 0
676 m^2 - 900 m^2	8,100 0
901 m^2 - 1225 m^2	9,300 0
	1226 m^2 කට වඩා වැඩි වන සෑම වර්ග මීටර් 90 කට වරක් රු. 1,500 0
ප්‍රාදේශීය සභා ගාස්තු	සෑම වර්ග මීටර් 1 ක් රු. 10 0 බැගින්

(ඇ) කමත් සඳහා අය කරන ලද ගාස්තු

	වර්ග මීටරයක් සඳහා අයකරන ගාස්තුව
* පරීක්ෂණ/පෙරසරි ගාස්තු	රු. 10 0
* අනුමත කිරීමේ ගාස්තු	රු. 30 0
* දඩ ගාස්තු	රු. 2 0

(ඈ) සත්ව ගොවිපලවල් සඳහා අය කරන ලද ගාස්තු

	වර්ග අඩියක් සඳහා අයකරන ගාස්තුව
* පරීක්ෂණ/පෙරසරි ගාස්තු	රු. 5.00
* අනුමත කිරීමේ ගාස්තු	රු. 36.00
* දඩ ගාස්තු	රු. 3.00

(ඉ) දුරකථන කුළුණු සැලසුම් අනුමත කිරීමේ ගාස්තු

උස මීටර් 0-20 දක්වා රු. 25,000 0
උස මීටර් 20ට වැඩිවන සෑම මීටර් 01 ක් සඳහාම රු. 2,500 0 බැගින්
දුරකථන කුළුණු සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තු රු. 5,000 0

(6) විධිමත් බලපත්‍රයක් නොමැතිව කරනු ලබන අනවසර ඉදිකිරීම් වෙනුවෙන් අයකරනු ලබන දඩ ගාස්තු :

	ඉදිකිරීම්වල ප්‍රමාණය	*වර්ග මීටරයක් සඳහා අයකරන ගාස්තුව* *වාණිජ* *රු. ශත*	 *නේවාසික* *රු. ශත*
I.	අත්තිවාරම සඳහා වැඩ නිම කිරීම	20 0	10 0
II.	වහල මට්ටම දක්වා නිම කිරීම	30 0	15 0
III.	වහලේ වැඩ නිම කිරීම	40 0	20 0
IV.	සම්පූර්ණයෙන්ම වැඩ නිම කිරීම	50 0	25 0
V.	මායිම් බිත්තියක මීටරයකට රු. 20.00 බැගින් වේ.		
VI.	විධිමත් බලපත්‍රයක් රහිතව ඉදිකරන ලද දුරකථන කුළුණු සඳහා අය කරනු ලබන පරීක්ෂණ ගාස්තුව රු. 5,000.00		
VII.	දුරකථන කුළුණු අනුමත කිරීම සඳහා වන දඩ ගාස්තුව - අදාළ අනුමත කිරීමේ ගාස්තුවෙන් 10%ක ප්‍රමාණයක්		

	රු. ශත
07. වීථි රේඛා සහතික ගාස්තු	600 0
08. වීථි රේඛා පෙරසැරි ගාස්තු	600 0
(සභා ගාස්තු 300.00 + පෙරසැරි/පරීක්ෂණ ගාස්තු 300.00)	
09. අනුකූලතා සහතික ගාස්තු	2,000 0
10. පරිසර බලපත්‍ර ගාස්තු	4,500 0
11. පුස්තකාල සාමාජික ගාස්තු :	
* වැඩිහිටි	200 0
* පාසල් ළමුන්	100 0
12. පුස්තකාල දඩ මුදල් (දිනකට)	10 0
13. ස්ථිර දැන්වීම් පුවරු (වර්ග අඩියකට)	150 0
14. තාවකාලික (මාස 03කට අඩු) දැන්වීම් පුවරු (වර්ග අඩියකට)	100 0
15. බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට දීම (මීටර් පැයකට)	7,500 0
16. ටිපර් රථය කුලියට ලබාදීම සාමාන්‍ය (කි. මී. 01 ට)	250 0
17. ටිපර් රථය කුළියට ලබා දීම (දිනකට) කි.මී. 200 ට අඩුවෙන්)	35,000 0
ටිපර් රථය කුළියට ලබා දීම (දිනකට) කි.මී. 100 ට අඩුවෙන්)	25,000 0
18. පිරිපහදු කරන ලද පානීය ජල ලීටරයක් (RO Plant)	2.50
19. ජල සේවා :	
• ට්‍රැක්ටර් බවුසරයක් (ලීටර 3000) සඳහා (කිලෝමීටර 1 කට රු. 150.00 අමතර ගාස්තුවක්)	4,500 0
• ලොරි බවුසරයක් (ලීටර 6000) සඳහා (කිලෝමීටර 1 කට රු. 250.00 අමතර ගාස්තුවක්)	9,000 0
• ට්‍රැක්ටර් බවුසරයක් (ලීටර 3000) කුලියට ලබා දීම (දිනකට)	15,000 0
• ට්‍රැකටර් බවුසරය (ලීටර 3,000) දිනක් ගාල් කර තැබීමට (කිලෝමීටර් 1කට රු. 150.00 අමතර ගාස්තුවක්)	2,500 0
• ට්‍රැක්ටර් රථයේ ට්‍රෙලරය පමණක් ගාල් කර තැබීමට (කිලෝමීටර් 1කට රු. 150.00 අමතර ගාස්තුවක්)	2,500 0
• ලොරි බවුසරයක් (ලීටර 6000) කුළියට ලබා දීම (දිනකට) (කි. මී. 200 ට අඩුවෙන්)	35,000 0
• ලොරි බවුසරයක් (ලීටර 6000) කුළියට ලබා දීම (දිනකට) (කි. මී. 150 ට අඩුවෙන්)	25,000 0
• ගලි බවුසර් සේවාව (එක් වරකට මළ අපද්‍රව්‍ය ඉවත්කිරීමට (කිලෝමීටර 1කට රු. 150.00 අමතර ගාස්තුවක්	6,000 0
• තණකොළ කපන යන්ත්‍රය කුලියට ලබා දීම මී. පැය 01 ක් සඳහා	3,000 0

20. පරිසර පරීක්ෂා කිරීමේ ගාස්තු :

ආයෝජනය (රු.)		*පරීක්ෂා කිරීමේ ගාස්තුව රු. ශත*
01.	250,000 හෝ ඊට අඩු	3,000 0
02.	250,001 - 500,000	3,750 0
03.	500,001 - 1,000,000	5,000 0
04.	1,000,000 ට වැඩි	10,000 0

21. මිනින්දෝරු සැලසුම් අනුමත කිරීම :

පර්චස්	*රු. ශත*
0 - 39	500 0
40- 59	1,000 0
60- 79	2,000 0
80ට වැඩි	3,000 0

22. ක්‍රීඩා භූමි කුළියට දීම :

සංගීත සංදර්ශන සඳහා (ආපසු ලබාදෙනු ලබන තැන්පත් මුදල)

01.	බෝ අත්ත ක්‍රීඩාංගනය සඳහා බල ප්‍රදේශයෙන් පිට	රු. 35,000 0
02.	බෝ අත්ත ක්‍රීඩාංගනය සඳහා බල ප්‍රදේශයන්ට	රු. 30,000 0
03.	අනිකුත් ක්‍රීඩාංගන සඳහා	රු. 20,000 0

සංගීත සංදර්ශන සඳහා (ආපසු ලබානොදෙන තැන්පත් මුදල)

01.	බෝ අත්ත ක්‍රීඩාංගනය සඳහා බල ප්‍රදේශයෙන් පිට	රු. 20,000 0
02.	බෝ අත්ත ක්‍රීඩාංගනය සඳහා බල ප්‍රදේශයන්ට	රු. 15,000 0
03.	අනිකුත් ක්‍රීඩාංගන සඳහා	රු. 10,000 0

වෙළෙඳ සංදර්ශනය සහ සැණකෙලි සඳහා දිනකට

01.	බල ප්‍රදේශයෙන් පිට	රු. 15,000 0
02.	බල ප්‍රදේශයන්ට	රු. 10,000 0

උත්සව හා රැස්වීම් පැවැත්වීම් සඳහා දිනකට

01.	බල ප්‍රදේශයෙන් පිට	රු. 5,000 0
02.	බල ප්‍රදේශයන්ට	රු. 2,500 0

ක්‍රීඩා තරග සඳහා දිනකට රු. 1,000 0

23. රථ ගාල් ගාස්තු (දිනකට) :

රථය	*රු. ශත*
යතුරු පැදි -	20 0
ත්‍රිරෝද රථ -	30 0
වෑන්/ ලොරි -	50 0

24. පැරකුම්යාය හා සූරියවැව පානීය ජල යෝජනා ක්‍රමයේ ගාස්තු හා අය කිරීම් :

අනු. අංකය		*2025 වර්ෂයට ගාස්තු රු. ශත*
01.	මාසික අනිවාර්ය ගාස්තුව - (ගෘහස්ත, ව්‍යාපාර/ කර්මාන්ත, ආගමික ස්ථාන හා රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන)	200 0
02.	නව සම්බන්ධතා ගාස්තු - (ගෘහස්ත, ව්‍යාපාර/ කර්මාන්ත හා රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන)	16,600 0
03.	ආගමික ස්ථාන හා පෙර පාසල් සම්බන්ධතා ගාස්තු	8,000 0
04.	විසන්ධි කරන ලද ජල සම්බන්ධතා සඳහා යළි සම්බන්ධතා ලබා දීමේ ගාස්තු	5,000 0
05.	පාරිභෝගිකයාගේ නම වෙනස් කිරීමේ ගාස්තු	1,000 0

06. මාසික අය කිරීම් :

(i) ගෘහස්ත

ඒකක	*ගාස්තු රු. ශත*
0 - 10	35 0
11 - 15	40 0
16 - 20	45 0
21 - 25	50 0
26 - 30	55 0
31 - 35	60 0
36ට වැඩි සෑම ඒකකයක් සඳහාම	70 0

(ii) ව්‍යාපාර / කර්මාන්ත :

ඒකක	*ගාස්තු රු. ශ.*
සෑම ඒකකයක් සඳහාම	70 0

(iii) ආගමික සහ සුභසාධක ස්ථාන :

සෑම ඒකකයක් සඳහාම	35 0

(iv) රාජ්‍ය /අර්ධ රාජ්‍ය ආයතන

සෑම ඒකකයක් සඳහා ම	40 0

25. රුහුණුකෙත සහ සෙවනපිටිය පානීය ජල යෝජනා ක්‍රමයේ ගාස්තු හා අය කිරීම් :

අනු. අංකය		*2025 වර්ෂයට ගාස්තු රු. ශත*
01.	මාසික අනිවාර්ය ගාස්තුව - (ගෘහස්ත, ව්‍යාපාර/ කර්මාන්ත, ආගමික ස්ථාන හා රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන)	200 0
02.	නව සම්බන්ධතා ගාස්තු - රුහුණුකෙත (ගෘහස්ත, ව්‍යාපාර/ කර්මාන්ත හා රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන)	16,600 0
03.	නව සම්බන්ධතා ගාස්තු - සෙවනපිටිය (ගෘහස්ත, ව්‍යාපාර/ කර්මාන්ත හා රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතන)	20,000 0
04.	ආගමික ස්ථාන හා පෙර පාසල් සම්බන්ධතා ගාස්තු	8,000 0
05.	විසන්ධි කරන ලද ජල සම්බන්ධතා සඳහා යළි සම්බන්ධතා ලබා දීමේ ගාස්තු	5,000 0
06.	පාරිභෝගිකයාගේ නම වෙනස් කිරීමේ ගාස්තු	1,000 0

07. මාසික අය කිරීම් :

(i) ගෘහස්ත

ඒකක	*ගාස්තු* *රු. ශත*
0 - 10	45 0
11 - 15	50 0
16 - 20	55 0
21 - 25	60 0
26 - 30	65 0
31 - 35	70 0
36ට වැඩි සෑම ඒකකයක් සඳහාම	80 0

(ii) ව්‍යාපාර / කර්මාන්ත :

ඒකක	*ගාස්තු* *රු. ශ.*
සෑම ඒකකයක් සඳහාම	80 0

(iii) ආගමික සහ සුභසාධක ස්ථාන :

සෑම ඒකකයක් සඳහාම	45 0

(iv) රාජ්‍ය /අර්ධ *රාජ්‍ය ආයතන*

සෑම ඒකකයක් සඳහාම	50 0
ජල බවුසර් සඳහා (පිටත) ලීටර් 01ක්	1.50

26. වැලිකන්ද බල ප්‍රදේශයේ මාර්ග භාවිතා කරමින් වැලි, බොරළු, පස් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම.

01. ට්‍රැක්ටර් රථයක් සඳහා (කියුබ් 01 සහිත)	රු. 200 0
02. ටිපර් රථයක් සඳහා (කියුබ් 03 සහිත)	රු. 600 0
* කියුබ් 01ක් සඳහා රු. 200.00 යි	

27. වැලිකන්ද බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නැවතුම්පල ලියාපදිංචි කිරීම වෙනුවෙන් සහ ත්‍රීරෝද රථගාලෙහි ත්‍රීරෝද රථ නවතා තැබීමේ වාර්ෂික ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු අය කිරීම.

		රු. ශත
1.	ත්‍රීරෝද රථ සමාගම් ලියාපදිංචි කිරීම :	
	ත්‍රීරෝද රථ ප්‍රමාණය 1ත් 10ත් අතර	5,000 0
	ත්‍රීරෝද රථ ප්‍රමාණය 11ත් 25ත් අතර	10,000 0
	ත්‍රීරෝද රථ ප්‍රමාණය 26 ට වැඩි	15,000 0
2	ත්‍රීරෝද රථයක් සඳහා ලියාපදිංචි ගාස්තුව	500 0

28. ගවයෙක් ඝාතනය කිරීම සඳහා ගාස්තුව 500 0

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආකාරයට අක්කර බදු පැනවීමට 2024.11.18 දින තීරණ අංක 989 යටතේ මම තීරණය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 03 වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2025 වර්ෂය සඳහා රුපියල් 10 0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ තුන්වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* IV(ආ) වන කොටසේ 1989 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් 05කට අඩු වූ සෑම ඉඩමක් මත 2025 වර්ෂය සඳහා රු. 50.0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 6 වන උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික 04කින් ගෙවීමට විධාන කිරීමටත්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

2025 වර්ෂය සඳහා පනවන ලද අක්කර බද්ද සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04කින් ගෙවීමටත්, 2025 වර්ෂය සඳහා සම්පූර්ණ අක්කර බද්ද 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද,

එක් එක් කාර්තුවට අදාළ අක්කර බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (05%) වට්ටමක් ලබා දීමට ද වලල්ලාවිට ප්‍රාදේශීය සභාව තීරණය කරමි.

12-122/1

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ එසේම ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 01 වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් ගනු ලැබූ සභා සම්මුතියට කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගෙන් ලද අනුමැතිය අනුව සහ එකී පනතේ 146 වන වගන්තියේ 01 වන උප වගන්තියෙන් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු ගම් කලාපය තුළ ඇති සියළුම නිවාස, ගොඩනැගිලි, ඉඩම්වල සහ ගෙපත්වල 2017 වර්ෂයේ දී පළාත් පාලන විෂය භාර අමාත්‍ය තුමාගේ අනුමැතිය මත 2024 වර්ෂයේ දී කරන ලද තක්සේරු වාර්ෂික වටිනාකම් 2025 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ 1 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් කළාපය තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමෙන් සියයට හයක (6%) වරිපනමක් 2025 වර්ෂය සඳහා පවා අය කිරීමටත්, සහ

2025 වර්ෂය සඳහා පනවන ලද එම බදු මුදල සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් මුදල 2025 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට ප්‍රථම ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ වරිපනම් බදු වටිනාකමෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 දිනෙන් වන එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුව හොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවීමට විධාන කිරීමටත් 2024.11.18 දින තීරණ අංක 990 යටතේ මම තීරණය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 01 වන උපවගන්තියේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් ගනු ලැබූ සභා සම්මුතියට කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගෙන් ලද අනුමැතිය අනුව සහ එකී පනතේ 146 වන වගන්තියේ 01 වන උප වගන්තියෙන් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු ගම් කලාපය තුළ ඇති සියළුම නිවාස, ගොඩනැගිලි, ඉඩම්වල සහ ගෙපත්වල 2017 වර්ෂයේදී පළාත් පාලන විෂය භාර අමාත්‍ය තුමාගේ අනුමැතිය මත 2024 වර්ෂයේදී කරන ලද තක්සේරු වාර්ෂික වටිනාකම් 2025 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ 1 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් කළාපය තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමෙන් සියයට හයක (6%) වරිපනමක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

2025 වර්ෂය සඳහා පනවන ලද එම වරිපනම් බදු මුදල සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු මුදල 2025 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට ප්‍රථම ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ වරිපනම් බදු වටිනාකමෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුව හොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවීමට ද මම තීරණය කරමි.

12-122/2

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම 2024.11.18 දින තීරණ අංක 991 යටතේ පහත සඳහන් ආකාරයට විය යුතු බවට, මම තීරණය කරමි.

එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත සෑම කර්මාන්තයක්ම සම්බන්ධයෙන්ම එම උපලේඛනයෙහි II වන තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවෙහි නිරූපිත සෑම කර්මාන්තයක් ම සම්බන්ධයෙන්ම එම උපලේඛනයෙහි II වන තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

I වැනි තීරුව	*II තීරුව*		
	ස්ථානයේ වාර්ෂික වටිනාකම		
කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*රු. 750.0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.0 ට වඩා වැඩි අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. ගඩොල් හෝ උළු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. අත්යන්ත්‍ර මගින් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. පපඩම් නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
4. මැටි භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
5. බීඩි එතීම හා විකිණීම	500 0	750 0	1,000 0
6. මෙට්ට නිෂ්පාදන ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7. ඔරලෝසු අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
8. හඳුන්කුරු නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
9. පාවහන් නිෂ්පාදනය හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
10. ටයර් ටියුබ් අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
11. බීරළු කැපීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12. මිරිස්කුඩු, සිල්ලර කුඩු, ආදිය පැකට්කර විකිණීම	500 0	750 0	1,000 0
13. බිම්මල් වගා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
14. බෑග් මැසීම	500 0	750 0	1,000 0
15. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. කුළු බඩු, පහන් තිර ආදිය පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
17. දන්වීම් පුවරු සෑදීම හා ඇඳීම	500 0	750 0	1,000 0
18. විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
19. සංගීත භාණ්ඩ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
20. කුෂන් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
21. මල් පැල තවානක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22. රූපවාහිනී, ඇන්ටනා, බෆල්ස් ආදිය නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
23. අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
24. ඇඳුම් මැසීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25. රබර් දුම් ගැසීමේ මධ්‍යස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
26. පැණි, හකුරු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
27. ද්‍රව්‍ය ඇසුරුම් කර විකිණීම	500 0	750 0	1,000 0
28. කෘතිම මාළු ඇම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
29. කොප්පරා සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30. මැණික් ගල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31. තේ පෙට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32. රබර් මුද්‍රා සහ අංක තහඩු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33. නාම පුවරු ස්ටිකර් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34. විදුලි රැහැන් ඇඳීම සහ ඒ ආශ්‍රිත සේවාවන් සැපයීම	500 0	750 0	1,000 0

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම 2024.11.18 දින තීරණ අංක 992 යටතේ පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එවැනි යම් ස්ථානයක හෝ පරිශ්‍රයක 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ලැබ ඇත්තා වූ ද, අනුමත කර පිළිගත්තා වූ ද අවස්ථාවක හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍රය ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පෙර වර්ෂයේ ආදායමෙන්, සියයට එකක (1%) මුදලක් බලපත්‍ර ගාස්තුව ලෙස 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් ඒ හෝටලය, ආපනශාලාව, නවාතැන්පළ 2025 වර්ෂයේ ක්‍රියාත්මක වන පළමුවන අවුරුද්ද වන අවස්ථාවක ඒ ගාස්තු ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය විය යුතු බවත් මම තීරණය කරමි.

උපලේඛනය

අනු අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750.0 නොඉක්මවන අවස්ථාවක	*රු. 751.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.0 ට වඩා වැඩි අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
02.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03.	සම් විකිණීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
05.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
08.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
09.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
10.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ඇටකටු අඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
12.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
13.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
14.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	පපඩම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16.	වඩු කර්මාන්තශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.0 ට වඩා වැඩි අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
17.	සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
18.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
19.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
20.	මිනිරන් කැණීම සහ විකිණීම	500 0	750 0	1,000 0
21.	හඳුන්කුරු නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
22.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
23.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
27.	වී, මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ බෝග, කුළු බඩු ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	රබර් ආශ්‍රිත කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
29.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
30.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
31.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
32.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
33.	ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
34.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
35.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
36.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පානීය ජලය බෝතල් කර විකිණීම	500 0	750 0	1,000 0
38.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති, බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
39.	වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
41.	කුකුළන් 100 කට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
42.	එළුවන්, ඌරන් 10කට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
43.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
44.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	කළුගල් කැණීම කැඩීම හෝ කුට්ටිගල් නිෂ්පාදනය යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
46.	සිසිල් බීම නිෂ්පාදනය හෝ 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
47.	අයිස්ක්‍රීම් බීම පැකට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
48.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
49.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
50.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
51.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
52.	යන්ත්‍ර උපකරණ කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
53.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
54.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751.0 ඉක්මවන එහෙත් රු. 1,500.0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501.0ට වඩා වැඩි අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
55.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
56.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
57.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
58.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
59.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
60.	ඩ්‍රයි ක්ලීනින් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
61.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
62.	විද්‍යුත් ලෝහ අලේප කිරීම	500 0	750 0	1,000 0
63.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
64.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
65.	බෙලෙක් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
66.	ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
68.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
69.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
70.	කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
71.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	ලියවන පට්ටලයක් භාවිත කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
73.	පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් බනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
75.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
76.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	හෝටල් හා ලැගුම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	මිනිරන් පතලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	ක්‍රේප් රබර් නිෂ්පාදන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
88.	රබර් කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
89.	මිරිස්ගල් වංගෙඩි ගල්වලින් නිපදවීම	500 0	750 0	1,000 0
90.	පානීය ජලය බොතල් කර විකිණීම	500 0	750 0	1,000 0
91.	වාහන බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	වැලි ගොඩදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම 2024.11.18 දින තීරණ අංක 993 යටතේ පහත සඳහන් ආකාරයට විය යුතු බවට, මම තීරණය කරමි.

එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත i තීරුවේ දක්වෙන අනුපාතයන් නොඉක්මවන්නා වූ අනුප්‍රමාණයන්ට අනුකූලව මෙහි ii තීරුවේ සඳහන් බද්දක් 2025 වර්ෂයට පනවා අයකළ යුතු බවට මම තීරණය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම එම ව්‍යාපාරයේ පෙර වර්ෂයේ ආදායම මෙහි පහත I තීරුවේ දක්වෙන අනුපාතයන් නොඉක්මවන්නා වූ අනුප්‍රමාණයන්ට අනුකූලව මෙහි II තීරුවේ සඳහන් බද්දක් 2025 වර්ෂයට පනවා අයකළ යුතු බවට මම තීරණය කරමි.

I වැනි තීරුව		*II* වැනි තීරුව
	2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	රු. ශත
01.	රු. 6,000 0 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
02.	රු. 6,000 0 ඉක්මවන එහෙත් රු. 12,000 0 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,000 0 ඉක්මවන එහෙත් රු. 18,750 0 නොඉක්මවන අවස්ථාවක	180 0
04.	රු. 18,750 0 ඉක්මවන එහෙත් රු. 75,000 0 නොඉක්මවන අවස්ථාවක	360 0
05.	රු. 75,000 0 ඉක්මවන එහෙත් රු. 1,50,000 0 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06.	රු. 1,50,000 0 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-122/5

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

ආදාහනාගාර ගාස්තු අයකිරීම - 2025

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ඉත්තපාන සහ මීගහතැන්න ආදාහනාගාර සඳහා ආදාහනාගාර ගාස්තු පහත සඳහන් ලෙස අයකළ යුතු බවට 2024.11.18 දින තීරණ අංක 994 යටතේ මම තීරණය කරමි.

තීරණය

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

ආදාහනාගාර ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ඉත්තපාන සහ මීගහතැන්න ආදාහනාගාර සඳහා ආදාහනාගාර ගාස්තු පහත සඳහන් ලෙස අයකළ යුතු බවට මම තීරණය කරමි.

බල ප්‍රදේශය තුළ රු. 12,500 0
බල ප්‍රදේශයෙන් පිටත රු. 21,000 0

12-122/6

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

අයදුම්පත්‍ර ගාස්තු 2025

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභාවෙන් ලබා ගන්නා පහත සඳහන් සේවාවන් වෙනුවෙන් අයදුම් පත්‍ර ගාස්තු පහත පරිදි අයකිරීමට 2024.11.18 දින තීරණ අංක 995 යටතේ මම තීරණය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභාවෙන් ලබාගන්නා පහත සඳහන් සේවාවන් වෙනුවෙන් අයදුම්පත්‍ර ගාස්තු පහත පරිදි අයකිරීමට මම තීරණය කරමි.

අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	රු.	1,500 0
නොපවරා ගැනීමේ හිමිකම් සහතික, වීථි රේඛා සහතික පත්‍ර ගාස්තු	රු.	500 0
බිම් කට්ටි ඉල්ලුම්පත්‍ර ගාස්තු	රු.	1,000 0
ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	රු.	1,500 0
පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තු	රු.	200 0
පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුතින් ලබා ගැනීමේ අයදුම්පත් ගාස්තු	රු.	500 0

12-122/7

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් සහ නාමපුවරු සඳහා ගාස්තු අයකිරීම - 2025

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව 1947 අංක 07 අතිවිශේෂ *ගැසට් පත්‍රය* මගින් පලකළ

හා 2015 සැප්තැම්බර් 22 දින බස්නාහිර පළාත් සභාව මගින් සම්මත කළ අතුරු ව්‍යවස්ථාවට අනුව වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ප්‍රචාරක දැන්වීම් සහ නාම පුවරු සඳහා පහත සඳහන් ලෙස අය කළ යුතු බවට 2024.11.18 දින තීරණ අංක 996 යටතේ මම තීරණය කරමි.

තීරණය

ප්‍රචාරක දැන්වීම් සහ නාමපුවරු සඳහා ගාස්තු අයකිරීම - 2025

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව 1947 අංක 07 අතිවිශේෂ *ගැසට් පත්‍රය* මගින් පලකළ හා 2015 සැප්තැම්බර් 22 දින බස්නාහිර පළාත් සභාව මගින් සම්මත කළ අතුරු ව්‍යවස්ථාවට අනුව වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ප්‍රචාරක දැන්වීම් සහ නාම පුවරු සඳහා පහත උපලේඛනයට අනුව ගාස්තු අය කළ යුතු බවට මම තීරණය කරමි.

අනු අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250 0	350 0	500 0
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 0 බැගින්		

අනු අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 0 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	750 0	850 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 0 බැගින්		

12-122/8

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

සහිතක නිකුත් කිරීමේ ගාස්තු අය කිරීම - 2025

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභාවෙන් ලබාගන්නා පහත සඳහන් සහතික වෙනුවෙන් පහත පරිදි ගාස්තු අයකළ යුතු බවට 2024.11.18 දින තීරණ අංක 997 යටතේ මම තීරණය කරමි.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභාවෙන් සහතික නිකුත් කිරීමේදී ගාස්තු පහත පරිදි අයකිරීමට මම තීරණය කරමි.

වරිපනම්, ජල බිල්පත්, ව්‍යාපාර සම්බන්ධ සහතික	රු. 200.0
වීථි රේඛා සහතික ගාස්තු	රු. 500.0
නොපවරා ගැනීමේ සහතික ගාස්තු	රු. 500.0
හිමිකම් සහතික ගාස්තු	රු. 500.0

12-122/9

වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සත්ව බද්ද පැනවීම

වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එල්. රණසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත සඳහන් ආකාරයට වාහන හා සත්ව බද්ද නියම කිරීම 2024.11.19 දින තීරණ අංක 1016 යටතේ මම තීරණය කරමි.

එසේම ;

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තියේ 03 වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේදී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම එහි II තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරමි.

I වන තීරුව		*II* වන තීරුව
		රු. ශ.
1.	i. මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
	ii. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	04 0
	iii. සෑම කරත්තයක් සඳහා	20 0
	iv. සෑම අත්කරත්තයක් සඳහා	10 0
	v. සෑම රික්ෂෝවක් සඳහා	7 50
	vi. සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	vii. සෑම ඇතෙකු සඳහා	50 0

2. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ

12-122/10

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් ඒ ඒ ව්‍යාපාර ඉදිරියෙන් දක්වා ඇති අනු ප්‍රමාණයන්ගෙන් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට එකී පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණ අංක 2024/11/20/01 යටතේ මෙයින් තීරණය කරමි.

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර ගාස්තු

	වෙළඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
1.	බේකරියක් පැවැත්වීම	500 0	750 0	1,000 0
2.	බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
3.	තේ, කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	ලැගුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	බාබර් සාප්පුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	මාළු වෙළඳාම	500 0	750 0	1,000 0
7.	මස් වෙළඳසැල්	500 0	750 0	1,000 0
8.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
9.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
10.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
11.	කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
12.	ගව ගාල	500 0	750 0	1,000 0
13.	හොටෙල්	500 0	750 0	1,000 0
14.	සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්, ආපන ශාලා, ලැගුම්හල් හා රෙස්ටුරන්ට්	පෙර වර්ෂයේ ආදායමේ 1%ක්		

12-174/1

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර ඇමතිවරයා විසින් අනුමත කර 1988.08.23 දිනැති අංක 520/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති

සම්මත අතුරු ව්‍යවස්ථාවල 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ 1 වන වගන්තිය යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලය මත අන්තරාදායක සහ අප්‍රසන්න වෙළඳාම් වශයෙන් පහත උපලේඛනයේ සඳහන් වෙළඳාම් ඇතුළත් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල මත තීරණ අංක 2024/11/20/02 යටතේ තීරණය කරමි.

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

උපලේඛනය

01. කරවල හෝ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය වෙළඳාමේ යෙදෙන ව්‍යාපාර බද්දට යටත් නොවන ස්ථාන
02. අල ඵෑණු වැනි ද්‍රව්‍ය අළෙවි කරනු ලබන ව්‍යාපාර බද්දට යටත් නොවන ස්ථාන
03. ආහාරමය ද්‍රව්‍ය අළෙවි කරනු ලබන ව්‍යාපාර බද්දට යටත් නොවන ස්ථාන
04. සේදුම්කාරක ද්‍රව්‍ය ඇසුරුම් නොකර අළෙවි කරනු ලබන කර්මාන්ත බද්දට යටත් නොවන ස්ථාන

12-174/1/1

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2025 වසරට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම පනතේ 150(1) වන වගන්තිය මගින් අකුරැස්ස ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2025 වර්ෂයේදී පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයන් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත වූ කර්මාන්ත බද්දක් පහත උපලේඛනයේ ආකාරයට 2025 වර්ෂයේ දී පනවා අය කිරීමටත් පවත්නා කර්මාන්තයක් සම්බන්ධයෙන් බද්ද 2025 අප්‍රේල් මස ඉක්මවීමට ප්‍රථම සහ 2025 වර්ෂයේ දී ආරම්භ කරන ලද කර්මාන්තයක් සම්බන්ධ බද්ධ ආරම්භ කර මාස 03ක් තුල අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබිය යුතු යැයි විධානය කිරීමට තීරණ අංක 2024/11/20/03 යටතේ මෙයින් තීරණය කරමි.

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු

	වෙළඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
01.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඇළුමිනියම් ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
03.	තේ කුඩු, කුළුබඩු පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
04.	පා පැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
05.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	වෙළඳාමේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි* රු. ශත
06.	යතුරු පැදි, ත්‍රීවිල් අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
07.	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
08.	ටයර්, ටියුබ් අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
09.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථාන	500 0	750 0	1,000 0
10.	ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බීරළු, ලී කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ගිණිකෙළි භාණ්ඩ නිපදවීම, විකිණීම	500 0	750 0	1,000 0
18.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	වායු සමීකරණ, ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ඉදල්, පාපිසි කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
21.	මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	රන්, රිදී ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	අවමංගල්‍ය සේවා සපයන ආයතන	500 0	750 0	1,000 0
26.	මළමිනී සකස් කරන ආයතන	500 0	750 0	1,000 0
27.	අයිස්ක්‍රීම් නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
28.	වාහන සර්විස් කරන ස්ථාන	500 0	750 0	1,000 0
29.	හුණු පිළිස්සීම හා ගබඩා කරන ස්ථාන	500 0	750 0	1,000 0
30.	කොප්පරා නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
31.	පොල්තෙල් සෑදීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
32.	කෘත්‍රිම දත් සකස් කරන ස්ථාන හෝ දත් ගලවන ස්ථාන	500 0	750 0	1,000 0
33.	ගල්වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ගල්මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කරන ස්ථාන	500 0	750 0	1,000 0
37.	ඇසිඩ් වර්ග නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
38.	ගිනිකෙළි භාණ්ඩ නිපදවීම, විකිණීම	500 0	750 0	1,000 0
39.	පොහොර වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ප්ලාස්ටික් ෆයිබර් ග්ලාස් නිපදවන ස්ථාන	500 0	750 0	1,000 0
41.	රන් රිදී ලෝහ ආලේප කරන ස්ථාන	500 0	750 0	1,000 0
42.	ලී මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	ශාඛ තෙල් නිස්සාරණය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
44.	කෘෂිකාර්මික උපකරණ අලෙවිය	500 0	750 0	1,000 0
45.	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන ආයතන	500 0	750 0	1,000 0
46.	සබන් හෝ පිරිසිදුකාරක නිෂ්පාදනය කිරීමේ ස්ථාන පැවැත්වීම	500 0	750 0	1,000 0
47.	දේශීය හෝ විදේශීය අමු ද්‍රව්‍යය යොදාගෙන නිමි හෝ අර්ධ නිමි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2025 වසරට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය මගින් අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල මත i වන උපලේඛනයේ සඳහන් ආකාරයේ බද්දක් ii වන උපලේඛනයේ සඳහන් ව්‍යාපාර සම්බන්ධයෙන් පෙර වසරේ ආදායම මත 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී බදු මුදල් 2025 ජූනි 30 වන දිනට ප්‍රථම අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවටත්, එකී පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල මත තීරණ අංක 2024/11/20/04 යටතේ තීරණය කරමි.

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

I වැනි උපලේඛනය

	ව්‍යාපාරයේ ආදායම	*ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01.	රු. 6,000 සිට රු. 12,000 දක්වා	90 0
02.	රු. 12,001 සිට රු. 18,750 දක්වා	180 0
03.	රු. 18,751 සිට රු. 75,000 දක්වා	360 0
04.	රු. 75,001 සිට රු. 150,000 දක්වා	1,200 0
05.	රු. 150,000 ට වැඩි	3,000 0

II වැනි උපලේඛනය

1. රෙදි පිළි, නිමි ඇඳුම් අලෙවි සැලක් පවත්වාගෙන යාම
2. සාප්පු බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම
3. පාවහන් අලෙවි සැලක් පවත්වාගෙන යාම
4. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
6. වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම
7. අපනයනය සඳහා තේ සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
8. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
9. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11. තීන්ත අලෙවි කිරීමේ, විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
12. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
13. පෙර පාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
14. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
15. පරිගණක පුහුණු පාඨමාලා පවත්වන ආයතනයක් පවත්වාගෙන යාම
16. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම
17. පැළ තවානක් (නර්සරි) පවත්වාගෙන යාම
18. ආයුර්වේද බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
19. ඉංග්‍රීසි බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් (ෆාමසියක්) පවත්වාගෙන යාම
20. දුරකතන සේවා සපයන සමාගමක් පවත්වාගෙන යාම.
21. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
22. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
23. සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
24. නීතිඥ, නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
25. විගණන හෝ ගණකාධිකාරී සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
26. බැංකුවක් පවත්වාගෙන යාම

27. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
28. ලීසිං සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
29. මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
30. ගෘහ නිර්මාණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
31. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
32. ඉංජිනේරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
33. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
34. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
35. ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යාම
36. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. පරිගණක හා උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38. ලී බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
40. උත්සව භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
41. ඇස් කණ්නාඩි සාප්පුවක් පවත්වාගෙන යාම
42. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
43. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. රේස් බුකියක් පවත්වාගෙන යාම
45. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
46. පින්තූර රාමු කිරීමේ හා වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
48. දුරකතන සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
49. ජංගම දුරකතන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
50. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
51. උකස් බඩු ගන්නා ආයතනයක් පවත්වාගෙන යාම
52. වීඩියෝ පටි, සංයුක්ත තැටි විකිණීමේ හෝ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
53. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
54. ලී වෙළඳ සලක් පවත්වාගෙන යාම
55. සිල්ලර වෙළඳ සලක් පවත්වාගෙන යාම
56. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. ගබඩාවක් ලෙස කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
58. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදාහැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
61. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. යතුරු පැදි/ත්‍රිරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. පා පැදි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. යතුරු පැදි , ත්‍රිරෝද රථ අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම
67. අරක්කු, බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
69. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
70. රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
71. මැණික් මිල දී ගන්නා ස්ථාන හා මැණික් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
73. සුපිරි වෙළඳ සලක් (ෆුඩ් සිටි) පවත්වාගෙන යාම
74. දුරකථන පෙර ගෙවුම් කාඩ් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
75. තේ කම්හලක් පවත්වාගෙන යාම
76. අන්තර්ජාල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
77. සුරතල් මසුන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
78. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. කුළු බඩු, හාල්, සීනි කිරිපිටි තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

80. යෝගට් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. පොහොර වෙළඳ සලක් පවත්වාගෙන යාම
82. අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. දත් බඳින, ගලවන ස්ථානයක් පවත්වාගෙන යාම
86. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. මුද්‍රණාලයක් පැවැත්වීම
88. ගෑස් ගබඩා කිරීම හා විකිණීම
89. එළවළු, පළතුරු වෙළඳාම
90. බලපත්‍රයකට යටතේ නොවන හෝ කාර්මාන්ත බද්දට අදාල නොවන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

12-174/3

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2025 වසරට වෙළඳ ප්‍රචාරක දැන්වීම් - දෘශ්‍ය පරිසර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වැනි වගන්තිවලින් අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල මත 1988.08.23 දිනැති අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව 2002.11.01 වැනි දින අංක 1261 *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල ප්‍රචාරක දැන්වීම් සම්බන්ධ 39 වන අතුරු ව්‍යවස්ථාව යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභා බල සීමාවේ ප්‍රචාරක දැන්වීම් (බැනර් ද ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025.01.01 දින සිට පනවා අය කිරීමට එකී පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල මත තීරණ අංක 2024/11/20/05 යටතේ තීරණය කරමි.

උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් විස්තරය සඳහා ගාස්තුව	*අවසර පත්‍රය* *රු. ශත*
01. පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමකට සෑම වර්ග අඩියකටම වර්ෂයකට	100 0
02. පුද්ගලයකු විසින් ගෙන යනු ලබන හෝ ගමන් කරනු ලබන වාහනයක සවි කොට ඇති පුවරුවක හෝ ආධාරකයක් මගින් ප්‍රචාරය කරනු ලබන දැන්වීමකට මසකට (රෙදි බැනර් ආදිය) :	
(*අ*) වර්ග මීටර් 0.5 කට වැඩි නොවන සෑම වර්ග මීටර් 0.1ට	10 0
(*ආ*) වර්ග මීටර් 0.5 කට වැඩි වන විට සෑම වර්ග වර්ග මීටර් 0.1ක් සඳහා	50 0
03. කිසියම් පෞද්ගලික හෝ පොදු නිවසක හෝ ගොඩනැගිල්ලක, බිත්තියක, වහලක, හෝ තාප්පයක මහජනතාවට පෙනෙන පරිදි කිසියම් වෙළඳ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය වීමට සැළැස්වීම සඳහා සෑම වර්ග මීටරයකටම	25 0

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

12-174/4

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(*අ*) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, *හෝ*

(*ආ*) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, *හෝ*

(*ඇ*) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කිරීමට සුදුසු යැයි එකී පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල මත තීරණ අංක 2024/11/20/06 යටතේ තීරණය කරමි.

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

12-174/5

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2025 වසරට වරිපනම් බදු පැනවීම

(*අ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපලකම 2024 වර්ෂයේදී පිලිගනු ලැබූ වාර්ෂික වටිනාකම් 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පැළිගැනීමටත්,

(*ආ*) එකී පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් සියයට අටක (8%) වරිපනම් බද්දක් 2025 වර්ෂයේ දී පනවා අය කිරීමට, *සහ*

(*ඇ*) එකී පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යටෝක්ත වාර්ෂික වරිපනම් බද්ද 2025 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට සුදුසු යැයි එකී පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල මත තීරණ අංක 2024/11/20/07 යටතේ තීරණය කරමි.

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

12-174/6

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2025 වසරට කසල ශෝධන ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (ආ) 122,126 වන වගන්තිය යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළාත් පාලන විෂය භාර ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2002.11.01 වැනි දින අංක 1261 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 9 වන අතුරු ව්‍යවස්ථාව යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභා සීමාව තුළ කසල ශෝධනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනය පරිදි ගාස්තු අය කිරීම සුදුසු යැයි එකී පනතේ 9(3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණ අංක 2024/11/20/08 යටතේ මෙයින් තීරණය කරමි.

උපලේඛනය

මාසික ජනනය වන කසල ප්‍රමාණය (කි.ග්‍රෑ.)	*මාසික කසල ශෝධන ගාස්තුව රු. ශත*
01. 0-100	500 0
02. 100-150	750 0
03. 150-200	1,000 0
04. 201-300	1,500 0
05. 301-500	2,500 0
06. 501-1000	3,500 0
07. 1000 ට වැඩි වන ටොන් 01 සඳහා	750 0

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

12-174/7

අකුරැස්ස ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989/03/10 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි වගා කළ ඉඩම්වලින් හෙක්ටයාර් 01කට නොඅඩු එහෙත් හෙක්ටයාර් 5ට අඩු ඉඩමක් මත රු. 50 ක අනු ප්‍රමාණයක් අනුව වූ අක්කර බද්දක් 2025 වර්ෂයට අය කිරීමට සහ,

(*ආ*) 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත බද්ද 2025 මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 දිනයන්වලින් අවසන් වන කාර්තු 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට යෝජනා කරමි.

එකී යෝජනාව පහත පරිදි සංශෝධනය කරමි :

සංශෝධිත යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි වගා කළ ඉඩම්වලින් හෙක්ටයාර් 01 කට නොඅඩු එහෙත් හෙක්ටයාර් 5 ට අඩු ඉඩමක් මත රු. 50 ක අනු ප්‍රමාණයක් අනුව වූ අක්කර බදු මුදල් අය කිරීමේ දී සභාව විසින් දැරිය යුතු පිරිවැය හා එම බදු මුදල් ගෙවන ජනතාවට ලැබෙන සෘජු ප්‍රතිලාභයක් නොමැතිවීම සැලකිල්ලට ගෙන 2025 වර්ෂයට අක්කර බදු අය කිරීම සිදු නොකිරීමට සුදුසු බවට තීරණ අංක 2024/11/20/09 යටතේ තීරණය කරමි.

ඩබ්ලිව්. ආර්. ප්‍රභාත් නිමේෂ,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
අකුරැස්ස.

12-174/8

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. පී. අලුත්ගේ වන මා විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින තීරණ අංක 982 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අලුත්ගේ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 08 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම්, ආර්. පී. අලුත්ගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිහිටියා වූ ද ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් එකක් මත 2025 වර්ෂය සඳහා රු. 10.00 ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවට මම තීරණය කරමි.

තවද, ඉහත කී පනතේ 134 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එක හෝ එකට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් එක් එක් ඉඩම් හෙක්ටයාරය මත 2025 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

තවද, 2025 වර්ෂයේ පහත උපලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත අවසාන දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද මිල්ලනිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උප ලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ අක්කර බදු මුදල රු. 10.00 ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද, මිල්ලනිය ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බව ද මම තීරණය කර සිටිමි.

12-135/1

මිල්ලනිය ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු ගාස්තු පැනවීම

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. පී. අලුත්ගේ වන මා විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස 08 වන දින තීරණ අංක 983 යටතේ පහත දැක්වෙන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අලුත්ගේ,
ලේකම්,
මිල්ලනිය ප්‍රාදේශීය සභාව හා
මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල හා කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 08 වැනි දින,
මිල්ලනිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. පී. අලුත්ගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මිල්ලනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මිල්ලනිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2251 හා 2021.10.22 දිනැති *ගැසට්* පත්‍රය යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2025 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණ වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද මිල්ලනිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල මිල්ලනිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද මිල්ලනිය ප්‍රාදේශීය සභාව විසින් ලබාදිය යුතු බවට මම තීරණය කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම් සඳහා හිමිකම් ලබන දිනය*
පළමු කාර්තුව	2025 මාර්තු 31 දිනට පෙර	ජනවාරි 31
දෙවන කාර්තුව	2025 ජුනි 30 දිනට පෙර	අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2025 සැප්තැම්බර් 30 දිනට පෙර	ජූලි 31
23.	කටුකම්මි නිපදවීම	500 0	750 0	1,000 0
24.	කම්බි ඇණ නිපදවීම	500 0	750 0	1,000 0
25.	කාබන් කඩදාසි හෝ යතුරු ලියන රිබන් නිපදවීම	500 0	750 0	1,000 0
26.	බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් නිපදවීම	500 0	750 0	1,000 0
27.	ජී. අයි. බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
28.	වායු සමන යන්ත්‍ර, ශීතකරණ, අධි ශීතකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
29.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම හා අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
30.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
31.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
32.	රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම	500 0	750 0	1,000 0
33.	සංවායත බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
34.	මෝටර් වාහන එකලස් කිරීම	500 0	750 0	1,000 0
35.	රේඩියේටර් නිපදවීම	500 0	750 0	1,000 0
36.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
37.	වියලි කෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
38.	විදුලි බුබුළු නිෂ්පාදනය සහ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
1.	ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳවා තබාගන්නා ස්ථාන	500 0	750 0	1,000 0
2.	ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	උත්සවශාලා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	එළවළු/පළතුරු විකුණන ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ගල්වලවල්/ගල් ඇඹරුම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	තේ, කෝපි කඩ හා කෙටි ආහාර විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	නොමිලේ ආහාර බෙදාහැරීම හෝ පිළිගැන්වීම	500 0	750 0	1,000 0
8.	පෞද්ගලික ළිං	500 0	750 0	1,000 0
9.	මස් විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	මාළු විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	රෑපලාවන්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ලැඟුම්හලක්/නවාතැන්පලක්/නිවාඩු නිකේතන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
14.	සිල්ලර වෙළඳසැල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	හෝටල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර අයකිරීමේ යෝජනාව

අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මම විසින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව එම පනතේ බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා වශයෙන් 2025 වර්ෂයේ අදාළ පරිසර ආරක්ෂණ බලපත්‍ර අයකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින තීරණ අංක 25 (viii) යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ටී එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2000 අංක 53 සහ 1988 අංක දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ අයගම ප්‍රාදේශීය සභාවේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාව සතු බලතල ප්‍රකාරව 2025 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සියලුම පරිසර ආරක්ෂණ බලපත්‍ර මත රු. 4,500.00ක බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සහ පහත උපලේඛනයේ පරිදි කර්මාන්ත ගාස්තුවක් අය කිරීමට මම තීරණය කරමි.

උපලේඛනය

ආයෝජනය *රු.*	*පරීක්ෂා කිරීමේ ගාස්තු උපරිම* *රු. ශත*
2,50,000 හෝ ඊට අඩු	3,000 0
2,50,001 සිට 5,00,000	3,750 0
5,00,001 සිට 10,00,000	5,000 0
10,00,000 වැඩි	10,000 0

12-156/8

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ජල ගාස්තු පැනවීම

අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව එම පනතේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා වශයෙන් 2025 වර්ෂයට අදාළ ජල ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින තීරණ අංක 25 (ix) යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ටී එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

අයගම ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 (ඈ) වගන්තිය යටතේ අයගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ඇල්වතුර, කැල්ල, යකහටුකන්ද, ඉන්දලවත්ත, උක්වත්ත කන්ද, පහලවත්ත, රත්මල්තැන්න, ඇල්ලහේන 700-1, 700-2 බුබුල, ගැටගහ දොල යන ජල මාර්ගවලින් ලබා ගන්නා ජලය සඳහා පහත උපලේඛනයේ පරිදි ජල ගාස්තු පනවා අය කිරීමටත් ලේඛනයේ නම සංශෝධනය කිරීම සඳහා රුපියල් 500.00ක මුදලක් අයකිරීමටත් තීරණය කරමි.

උපලේඛනය

ජල සේවාව	*මාසික අයකිරීම* *රු. ශත*
අයගම ජල සේවාව	200 0
අයගම වාණිජ්‍ය ජල සේවාව	350 0
යකහටුවෙල ජල සේවාව	200 0
පාසල අසල ජල සේවාව	200 0
නිහතමානීගම ජල සේවාව	200 0
ඉන්දලවත්ත ජල සේවාව	200 0
ඇල්ලහේන ජල සේවාව	50 0
පහලවත්ත ජල සේවාව	200 0
සමරුගම ජල සේවාව	200 0
සරත්පුරය ජල සේවාව	200 0
අයගම සතිපොළ ජල සේවාව	150 0

12-156/9

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව එම පනතේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා වශයෙන් 2025 වර්ෂයට අදාළ විනෝද බදු ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින බලතල තීරණ අංක 25 (x) යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ටී එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

විනෝද බදු ආඥාපනතේ අංක 06 වගන්තියට අනුව අයගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ මුදල් අයකර පෙන්වනු ලබන චිත්‍රපට දර්ශනයක්, සර්කස් දර්ශනයක්, මැජික් දර්ශනයක්, සංගීත සංදර්ශනයක් හෝ ඕනෑම දර්ශනයක් වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් විනෝද බදු මුදල් හා (176 අධිකාරය) ප්‍රසිද්ධකර රඟදැක්වීම් ආඥාපනතේ 31 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුවක් 2025.01.01 වැනි දින සිට අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

01. ප්‍රාදේශීය සභා සීමාව තුළ පවත්වන සෑම දර්ශනයක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% විනෝද බදු මුදලක්,

02. තාවකාලික චිත්‍රපට දර්ශන, සර්කස් දර්ශන, මැජික් දර්ශන හෝ වෙන යම් වර්ගයක සංදර්ශනයක් සඳහා එක් දිනකට රු. 50ක් ද ඊට වැඩිවන සෑම දිනකටම රු. 25 බැගින් ද අය කිරීමට මම තීරණය කරමි.

12-156/10

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු පැනවීම

අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව එම පනතේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා වශයෙන් 2025 වර්ෂයට අදාළ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින තීරණ අංක 25 (xi) යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ටී. එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21 සහ 78 වැනි වගන්ති යටතේ අංක 520/7 හා 1988.08.23 දිනැති පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව 1990.08.16 වැනි දින කියවා සම්මත කර 1990.12.27 වැනි දින අංක 520/7 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් අයගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර ව්‍යවස්ථාව අනුව සහ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ (268 වැනි අධිකාරය) විධිවිධාන වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව,

(අ) 2025 ජනවාරි මස පළමු වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අයගම ප්‍රාදේශීය සභා සීමාව තුළ සිදුකරන සියලුම ඉදිකිරීම් සම්බන්ධයෙන් විධිමත් පරිදි ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතු බවට විධිවිධාන කිරීමට, සහ

(ආ) අනුමත කරනු ලබන සියලුම ගොඩනැගිලි සැලසුම් සඳහා සහ නිකුත් කරනු ලබන සියලුම අනුකූලතා සහතික සඳහා පහත උපලේඛනයේ පරිදි ගාස්තු අය කිරීමට අයගම ප්‍රාදේශීය සභාව තීරණය කරන ලදී.

01. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ උපලේඛනය

ගෙබිම සම්පූර්ණ වර්ග අඩි	*නේවාසික රු. ශත*	*ව්‍යාපාරික රු. ශත*
1 - 500 දක්වා	750 0	2,000 0
501 - 1000 දක්වා	1050 0	2,500 0
1001 - 2000 දක්වා	1,200 0	3,000 0
2001 - 3000 දක්වා	3,250 0	10,500 0
3001ට වැඩිවන සෑම වර්ග අඩි 500 ඒකකයක් හෝ ඉන් කොටසක් සඳහා	900 0	1350 0

* වීථි රේඛාවක් නිකුත් කිරීම සඳහා රු. 1,200.00 ක ගාස්තුවක් අයකරනු ලැබේ.

* වීථි රේඛාවක් අලුත් කිරීම සඳහා රු. 250.00 ක ගාස්තුවක් අයකරනු ලැබේ. (නිකුත්කළ දින සිට මාස 06ක කාලයක්)

* නිකුත් කල වීථි රේඛා සහතිකයක් අස්ථානගතවූ විට ඒ වෙනුවට ලබාදෙන මුද්‍රිත පිටපත හෝ ඡායා පිටපත සඳහා රු. 500.00ක ගාස්තුවක් අයකරනු ලැබේ.

* වීථි රේඛාවක් නිකුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව රු. 200.00 ක් වේ.

* පිඹුරුපත අනුමතකර ගැනීම සඳහා රු. 600.00ක ගාස්තුවක් අයකරනු ලැබේ.

* පිඹුරුපත අනුමත කිරීමට අමතරව සත්‍ය පිටපත් කරන ලද පිඹුරුපතක් අනුමැතියට යොමුකරන විට රු. 600.00 ක ගාස්තුවක් අයකරනු ලැබේ.

* පිඹුරුපත සඳහා අයදුම්පත්‍ර ගාස්තුව රු. 200.00ක් වේ.

* අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා රු. 1,000.00 ක ගාස්තුවක් අය කරනු ලැබේ.

* අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමෙන් පසුව නැවත සත්‍ය පිටපත් කරන ලද අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමට රු. 500.00ක ගාස්තුවක් අයකරනු ලැබේ.

* ගොඩනැගිලි අයදුම්පත්‍රය සඳහා ගාස්තුව රු. 500.00ක්

2. ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉදිකරන අනවසර ඉදිකිරීම් සඳහා අයකිරීම :

සංවර්ධනයේ ස්වභාවය			*අයකළයුතු ගාස්තු (බදු රහිත)*	
1.		අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරන ලද ඉඩම් බෙදීමක් සඳහා	ඉඩම් කැබලි 1 ක් සඳහා රු. 3,000 බැගින්	
2.		අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම්/එකතු කිරීම්/නැවත ඉදිකිරීම්	නේවාසික (ව. මී. 1කට)	නේවාසික නොවන (ව.මී. 1කට)
	i.	අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා)	රු. 100	රු. 250
	ii.	වහලය මට්ටම් දක්වා ඉදිකිරීම් ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර)	රු. 150	රු. 500

සංවර්ධනයේ ස්වභාවය			*අයකළයුතු ගාස්තු (බදු රහිත)*	
	iii.	වහලය සහිත බිත්ති ඉදිකිරීම	රු. 200	රු. 750
	iv.	පදිංචිය සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම	රු. 250	රු. 1,000
	v.	මායිම් තාප්ප/රැඳවුම් බිත්ති ඉදිකිරීම	රු. 100 (දික් මීටරයක් සඳහා)	රු. 100 (දික් මීටරයක් සඳහා)
	vi.	විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම	බිම් පාදම ඉදිකිරීම රු. 1,50,000 වහල මුදුන ඉදිකිරීම රු. 100,000	
3.		අනුකූලතා සහතිකය ලබා නොගෙන පදිංචි වීම	දිනකට රු. 25	

12-156/11

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා යන්ත්‍රසූත්‍ර හා දේපළ කුළියට දීමේ ගාස්තු පැනවීම

අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව එම පනතේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා වශයෙන් 2025 වර්ෂයට අදාළව යන්ත්‍රසූත්‍ර හා දේපළ කුළියට දීම් සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින තීරණ අංක 25 (xii) යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ටී. එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අයගම ප්‍රාදේශීය සභාව සතු වාහන, යන්ත්‍ර සූත්‍ර 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන ආඥාපනත්, සහතිකපත් හා වත්කම් පරිහරණය හා කුලියට දීම, ගාස්තු පැනවීම උපලේඛනයේ දක්වා ඇති ආකාරයට 2025 වර්ෂය සඳහා අයකළ යුතු බව මම තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*යන්ත්‍ර සූත්‍ර හා දේපළ වර්ගය*	*මිල අයකිරීම රු. ශත*
01.	ට්‍රැක්ටර් කුළියට දීම (දිනකට)	10,000 0
02.	බැකෝලෝඩර් යන්ත්‍රය (පැයකට)	6,500 0
03.	මෝටර් ග්‍රේඩරය (පැයකට)	6,500 0

අනු. අංකය	යන්ත්‍ර සූත්‍ර හා දේපළ වර්ගය	මිල අයකිරීම රු. ශත
04.	ලොකු ටිපර් රථය (දිනකට)	18,000 0
05.	බට 01ක් සඳහා (GI)	75 0
	ජල බවුසරය - රු. 2,000 0 කම්කරුවන් සඳහා - රු. 650 0 } 3,500 0 දුර කි. මී. 1 ට වැඩි - රු. 500 0 (වැඩිවන සෑම කි.මී.කටම) ජලය සඳහා - රු. 350 0	
06.	අයගම ප්‍රාදේශීය සභාව සතු භූමි කුලියට දීම (දිනකට පාසල් ළමුන් සඳහා)	1,500 0
07.	සතිපොළ භූමිය හා බස්නැවතුම්පල අසල භූමිය කුලියට දීම (දිනකට)	2,000 0
08.	අයගම පිට්ටනිය කුලියට දීම (දිනකට) සංගීත සංදර්ශනයකට/සැණකෙළියට එක් දිනකට රු. 10,000.00 ලෙසත් ගෞතමදාස ක්‍රීඩා පිටියේ වෙන් කිරීම සඳහා වෙන් වූ ඇප මුදල රු. 15,000.00 ක් ලෙසත් ඇප මුදල නැවත ලබා දෙනු ලබන්නේ අදාළ ස්ථානයට කිසිදු ආපදාවක් වී නොමැත යන්න තහවුරු කිරීමෙන් පසුව බවත් යම් අලාභයක් සිදු කර ඇත්නම් එම අලාභය අදාළ ඇප මුදලින් අඩු කරනු ලබන බවටත් මම තීරණය කරමි.	3,000 0
09.	කලායතනය කුලියට දීම (දිනකට පුටු රහිතව)	4,000 0
10.	කලායතනය කුලියට දීම (දිනකට පුටු සහිතව)	7,000 0
11.	කලායතනය කුලියට දීම (දිනකට මුළුතැන්ගෙය රහිතව)	4,000 0
12.	කලායතනය කුලියට දීම (දිනකට මුළුතැන්ගෙය සහිතව)	5,000 0
13.	කලායතනය කුලියට දීම (දිනකට පාසල් ළමුන් සඳහා පමණි)	1,500 0
14.	ධම්මානන්ද ප්‍රාථමික විද්‍යාලය අසල භූමිය (දිනකට)	1,500 0

12-156/12

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව දැන්වීම් පුවරු ගාස්තු පැනවීම

අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව එම පනතේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා 2025 වර්ෂයට අදාළව දැන්වීම් පුවරු ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින තීරණ අංක 25 (xiii) යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ටී. එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අයගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 දිනැති අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අයගම ප්‍රාදේශීය සභා බල සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2025 වර්ෂය සඳහා අය කිරීමට තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*දැන්වීමේ ස්වභාවය*	*වර්ග අඩි ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			ප්‍රදර්ශන කාලය මාස 1 ට අඩු	*ප්‍රදර්ශන කාලය මාස 01ට වැඩි සහ මාස 06 ට අඩු*	*ප්‍රදර්ශන කාලය මාස 06 ට වැඩි මාස 12ට අඩු*
1.	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් (පෝස්ටර්)	1 ට අඩු	25 0	50 0	100 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 20 0 බැගින්		
2.	රෙදි හෝ ඩිජිටල් බැනර් සඳහා	1 ට අඩු	50 0	100 0	150 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 45 0 බැගින්		
3.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	200 0	500 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 150 0 බැගින්		
4.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන LED/LCD ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 0 බැගින්		
5.	ෆෝම් බෝඩ් හෝ පොලිතීන් මිශ්‍රිත බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250 0	500 0	850 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 250 0 බැගින්		
6.	ප්ලාස්ටික් හෝ ෆයිබර් යොදගත් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	400 0	600 0	1,200 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 250 0 බැගින්		
7.	විද්‍යුත් උපකරණ යොදගෙන කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750 0	900 0	1,250 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 450 0 බැගින්		
8.	විද්‍යුත් සංඛ්‍යාංක (ඩිජිටල්) ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	1,000 0	1,250 0	1,500 0
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 800 0 බැගින්		

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළව නිකුත් කරනු ලබන ආකෘති පත්‍ර සහ සහතිකපත් හා පරීක්ෂණ ගාස්තු පැනවීම

අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව එම පනතේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා 2025 වර්ෂයට අදාළව ආකෘති පත්‍ර සහ සහතිකපත් හා පරීක්ෂණ ගාස්තු සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වැනි දින තීරණ අංක 25 (xiv) යටතේ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. ටී එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අයගම ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන ලේකම් වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අයගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වර්ෂය සඳහා පුරනැඟුම ව්‍යාපෘතිය මගින් නිකුත් කර ඇති ආකෘතිපත්‍ර හා නිකුත් කරනු ලබන සහතික පත්‍ර සහ පරීක්ෂණ ගාස්තු පහත උපලේඛනයේ දක්වා ඇති ආකාරයට 2025 වර්ෂය සඳහා අය කළ යුතු යැයි තීරණය කරමි.

උපලේඛනය

ගෙවීම් විස්තරය		*අයකරන මුදල* *රු. ශත*
අනෙකුත් සියලුම අයදුම්පත්‍ර (ජල/හට්/පුටු/භූමිය කුලියට දීම/ඉඩම් අනු බෙදීම්/ වරිපනම් ලේඛනයේ නම ඇතුළත් කිරීම/සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම/ වෙළෙඳ බලපත්‍රය/යන්ත්‍ර සූත්‍ර කුලියට දීම/අනතුරුදායක ගස් පරීක්ෂාව/ පා පැදි බලපත්‍රය/ශාලා කුලියට දීම/ වැලි ප්‍රවාහනය කිරීම/ගවමස් ප්‍රවාහනය කිරීම		200.00
කොස් ගසක් පරීක්ෂා කිරීමට	-	1,500.00
නැදුන් ගසක් පරීක්ෂා කිරීමට	-	1,000.00
මහෝගනී ගසක් පරීක්ෂා කිරීමට	-	1,000.00
හොර ගසක් පරීක්ෂා කිරීමට	-	1,000.00
වෙනත් ගස් පරීක්ෂා කිරීමට	-	500.00

12-156/14

අයගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අයගම ප්‍රාදේශීය සභා නගර සීමාව තුළ ජංගම මාළු වෙළෙඳාම තහනම් කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාදායකය විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් සංස්ථාපනය කරන ලද අයගම ප්‍රාදේශීය සභාව වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වන දින තීරණ අංක 25 (xv) යටතේ පහත උපලේඛණය මගින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි අයගම නගර සීමාව තුළ බලපත්‍රලත් ස්ථානවල හැර ජංගම මාළු වෙළඳාම සපුරා තහනම් බවට යෝජනා කොටස ස්ථිර කරමි.

කේ. ඒ. ටී එම්. කුඩාආරච්චි,
අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
අයගම ප්‍රාදේශීය සභාව,
අයගම.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අයගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයගම නගර මධ්‍යයේ සිට අයගම - ඉඩංගොඩ ප්‍රධාන මාර්ගයේ දුර ප්‍රමාණයෙන් කිලෝමීටර 01ක් වන පහලවත්ත ග්‍රාමයේ ඒ. එල්. ප්‍රේමරත්න යන අයගේ නිවස දක්වා ද, අයගම-කලවාන ප්‍රධාන මාර්ගයේ දුර ප්‍රමාණය කිලෝ මීටර් 01ක් වන අයගම ර/නිවි රාහුල විද්‍යාලය දක්වා ද, අයගම-ගවරගිරිය ප්‍රධාන මාර්ගයේ දුර ප්‍රමාණය කිලෝ මීටර් 01ක් වන පිංතැන්න ග්‍රාමයේ පිංතැන්නවත්ත නාම පුවරුව දක්වා වූ ප්‍රමාණය හා අයගම නගරය කේන්ද්‍ර කරගනිමින් එකී සීමාව ඇතුළත පිහිටි සියලුම අතුරු මාර්ගයන්, වීථි හා මංමාවත් ඇතුළත් වන පරිදි වූ වර්ග ප්‍රමාණයන් සීමාව ඇතුළත අයගම ප්‍රාදේශීය සභාව විසින් පනවා සම්මත කර වැළඳගෙන ඇති අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව බලපත්‍ර ලබාදී ස්ථානවල හැර, අනෙකුත් කිසිදු ස්ථානයක හෝ මං මාවතක හෝ වීථියක තනි පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ එක්ව හෝ සාමූහිකව හෝ පා ගමනින් යෙදෙමින් හෝ අත්කරත්ත භාවිතයෙන් හෝ පාපැදිවල යෙදෙමින්, යතුරුපැදිවල යෙදෙමින් හෝ ත්‍රීරෝද රථවල යෙදෙමින් හෝ වෙනත් ඕනෑම ආකාරයේ මෝටර් වාහනවල යෙදෙමින් හෝ ජංගම මාළු වෙළෙඳාමේ කාර්යයක යෙදීම, යෙදවීම හෝ අනුබලදීම, වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණයෙන් ම තහනම් කරනු ලබන අතර, එසේ තහනම නොතකා ක්‍රියා කරන්නන් හට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත හා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136(1)(අ) ප්‍රකාරව මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කර නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමටත්, එකී අධිකරණය මගින් ලබා දෙනු ලබන දඬුවමකට හෝ දඩයකට හෝ දඬුවම හා දඩය යන දෙයාකාරයටම හෝ ලක්කිරීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීත ව්‍යවස්ථාදායකය විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් සංස්ථාපනය කරන ලද අයගම ප්‍රාදේශීය සභාවේ වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 05 වන දින පැවති තීරණ ගැනීමට සහයවීමේ කමිටු රැස්වීම් නිර්දේශයන්ට අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකරව අයගම ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණ අංක 25 (xv) යටතේ තීරණය කරමි.

12-156/15

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය සමග කියවිය යුතු හා එකී පනතේ 146(1) වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 112(1) යටතේ බලාත්මකකොට ඇති පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 631/2 හා 1990.10.08 දිනැති *ගැසට් පත්‍රය* මගින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තාවූ, කඹුරුපිටිය ප්‍රාදේශී සභා බල ප්‍රදේශය තුළ පිහිටි, සියලු නිවාස, ගොඩනැගිලි, ඉඩම් හා ගෙපත් යන නිශ්චල දේපළවලට අදාළව 2015 වර්ෂයේ තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම මත සියයට හතක (7%) අනු ප්‍රමාණයට යටත්ව 2025 වර්ෂය සඳහා වාර්ෂික වරිපනම් බදු පනවා අය කිරීමට තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

එසේම ඉහත කී පනතේ 134(6) වැනි වගන්තිය අනුව එකී වරිපනම් බදු 2025 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්වලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරිකවලින් ගෙවීමට හැකියාව ඇති බවත්, එසේ ගෙවීමේ දී 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ දී අදාළ වරිපනම් බදු ගෙවන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද ලබා ගත හැකි බව වැඩිදුරටත් දැනුම් දෙමි.

තව ද ඔබ විසින් ඉහත සඳහන් කර ඇති දිනයන් අවසාන වන විට අදාළ වරිපනම් බදු ගෙවීමට අපොහොසත් වන්නේ නම් හෝ පැහැර හරිනු ලබන්නේ නම් කාර්තුවේ වටිනාකමට සියයට දහයක (10%) අධි ගාස්තුවකට යටත් වේ. එමෙන්ම වරිපනම් බදු ගෙවීම පැහැර හරිනු ලබන සෑම තැනැත්තෙකුට ම අයත් එහෙත් තම ජීවන වෘත්තිය කරගෙන යාමට අදාළ නොවන සියලු චංචල දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය යටතේ සභාවට බලතල පැවරී ඇති බව ද තවදුරටත් දැනුම් දෙමි.

ලේන්දූව ලොකුගේ ජයමිණී සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-158/1

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී පනතේ 149 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147(1) (ඇ) වගන්තිය යටතේ සාදන ලද 1988.08.23 දිනැති අංක 520/7 අංක දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතරු ව්‍යවස්ථාව 1990.04.06 දින අංක 605 දරන *ගැසට් පත්‍රය* මගින් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇති අතර, ඒ අනුව කඹුරුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ව්‍යාපාර ස්ථාන හා පරිශ්‍රයන් පවත්වාගෙන යන සෑම තැනැත්තෙකු විසින් ම පහත උපලේඛනයෙහි අංක I වන තීරයේ යම් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II වන තීරයේ සඳහන් අනුප්‍රමාණයන්ට අනුකූල වන ආකාරයට බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් තිරණ අංක 112(II) යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලක්, ආපනශාලාවක්, නවාතැන් පොළක් සඳහා ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී අදාළ වර්ෂයට පෙර

වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂයට නියම කළ යුතු බවත්, ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2025.03.31 වැනි දිනට පෙර අදාළ ස්ථානයන් පවත්වාගෙන යනු ලබන අයවලුන් විසින් ලබාගත යුතු බවටත් තවදුරටත් නිවේදනය කරමි.

ලේන්දූව ලොකුගේ ජයමිණි සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*	
ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750ට නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු.751 ට වැඩි එහෙත් රු.1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන විට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ලැඟුම් නිවාස	500 0	750 0	1,000 0
02. හෝටල්	500 0	750 0	1,000 0
03. බේකරියක් හා බේකරි කෑම අලෙවි සැල්	500 0	750 0	1,000 0
04. තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
05. කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
06. පිහිනුම් තටාක	500 0	750 0	1,000 0
07. මස් විකිණීම	500 0	750 0	1,000 0
08. බත් කඩ හා ආපනශාලා	500 0	750 0	1,000 0
09. පලතුරු විකිණීම	500 0	750 0	1,000 0
10. සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11. ලොන්ඩරි	500 0	750 0	1,000 0
12. මාළු විකිණීම	500 0	750 0	1,000 0
13. බාබර් සාප්පු හා රූපලාවන්‍යාගාර	500 0	750 0	1,000 0
14. සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
15. ආහාර නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0

12-158/2

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය යටතේ කර්මාන්ත බද්ද පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල

ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 112(III) යටතේ බලාත්මක කොට ඇති පරිදි කඹුරුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම එකී පනතේ 150 වන වගන්තියේ (1) (2) උප වගන්ති අනුව දක්වා ඇති පහත උපලේඛනයෙහි I තීරුවේ සඳහන් කර්මාන්තයේ වාර්ෂික වටිනාකමට අනුරූපව II වැනි තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දට යටත් යම් තැනැත්තෙකු එකී කර්මාන්ත බද්ද 2025 වර්ෂයේ ජුනි 30 වැනි දිනට පෙර කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද, එකී මුදල ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (4) වැනි උප වගන්තිය ප්‍රකාරව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව තවදුරටත් දැනුම් දෙමි.

ලේන්දූව ලොකුගේ ජයමිණි සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට* රු. ශත
01.	ලී මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	දැව වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ලුණු ඇසුරුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ලිහිසි තෙල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	තේ කොළ පැකට් කිරීමේ හා වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	වී මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	නිමි ඇඳුම් හා රෙදිපිළි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ළදරු උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	අටපිරිකර හා පූජා භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	දුරකථන අලුත්වැඩියාව හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට* රු. ශත
14.	ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ප්ලයිවුඩ් ලී විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පාවහන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පාවහන් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	තුනපහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	මැෂින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ගෑස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	බැටරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	බුලත්/පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	කොම්යුනිකේෂන් ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පරණ යකඩ මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	වැහිපීලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ස්ටිකර් වැඩ හා ඩිජිටල් ප්‍රින්ටින් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	පටිගත කිරීමේ හා සී. ඩී. තැටි විකිණීම, වීඩියෝ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	සිංහල බෙහෙත් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	පිත්තල බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ෆයිබර් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	පාසල් උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	පාපැදි ඇලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	පොල් තෙල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන විට* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට* රු. ශත
39.	ගල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ඇණ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	ග්‍රොසරි බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ප්ලාස්ටික් බඩු නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	විදුලි කාර්මික වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	උත්සව භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	කොහු ඉදල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	සුරතල් මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	පලංචි කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	පැණි හකුරු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	කෘෂි රසායන ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	මුළුතැන්ගෙයි උපකරණ නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	පැකට් බඩු නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
62.	වොල්කනයිසින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	රෙදි කැබලි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	විදුලි උපකරණ හා විදුලි උපකරණ කොටස් අලෙවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	පොහොර විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	කුරුඳු බොයිඩරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	සුදු යකඩ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ ස්ථානයක් (ෆාමසි) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	පුවත් පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	ඇස් කණ්නාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	පරිගණක අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	රෙදි පාපිසි මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	ගරාජයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	මැටි වලං විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	ජෝතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	වීදුරු හා ඇළුමිනියම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	මැටි ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	බ්‍රේක් ලයිනර් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	බිත්තර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන විට* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට* *රු. ශත*
86.	ටී. වී. උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	බිම්මල් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	යතුරු පැදි හා ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-158/3

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ ව්‍යාපාර බද්ද පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 147 වැනි වගන්තිය හෝ එකී පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ කඹුරුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මත මෙහි පහත උපලේඛන 01 හි I තීරුවේ නිරූපිත යම් ආදායම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව වූ උප ලේඛන 02 හි සඳහන් පරිදි ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2025 වර්ෂයේ ජූනි 30 දිනට පෙර කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 112(IV) යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

තව ද, එකී මුදල ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තයේ (4) වන උප වගන්තිය ප්‍රකාරව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව තවදුරටත් දැනුම් දෙමි.

ලේන්දූව ලොකුගේ ජයමිණී සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
2. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*
	2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*ගෙවිය යුතු බද්ද රු. ශත*
3.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
6.	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

උපලේඛනය 02

01. රටබීම/මත්පැන් අලෙවිසැලක් පවත්වාගෙන යාම
02. උකස් බඩු ගැනීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
03. සැපයුම්කරුවන් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
04. රියදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
05. නීතිඥ සේවය සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
06. වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
07. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
08. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
09. රථ වාහන හා යතුරු පැදි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
10. පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
11. රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
12. නොතාරිස් හා මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
13. දුරකථන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. ලොතරැයි අලෙවි නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
15. උත්සව ශාලා හා නවාතැන්පලක් පවත්වාගෙන යාම
16. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
17. පානීය ජලය බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
19. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
20. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
21. තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
22. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
23. ප්‍රචාරක ආයතනයක් (ඇඩ්වර්ටයිසින්) පවත්වාගෙන යාම
24. පරිගණක පුහුණු පාසලක් පවත්වාගෙන යාම
25. සුපිරි වෙළඳ සංකීර්ණයක් පවත්වාගෙන යාම
26. පුද්ගලික ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම
27. කුරුඳු සැකසීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
28. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
29. සත්ත්ව සායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
30. පෞද්ගලික විගණන හෝ ගණකාධිකාරී සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
31. වැහිපීලි හා උපාංග අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
31. ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම
33. මාර්ගස්ථ ක්‍රමයට භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම
35. භාණ්ඩ ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම

36. කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
37. ගෘහ නිර්මාණ සේවාව/වාස්තු විද්‍යා සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
38. ප්‍රාදේශිකයක් පවත්වාගෙන යාම
39. විශේෂඥ වෛද්‍ය චැනල් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
40. මැණික් මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41. යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
42. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
43. රේස් බුකියක් පවත්වාගෙන යාම
44. දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
45. දුම් පරීක්ෂණ ආයතනයක් පවත්වාගෙන යාම
46. යෝගට් හා සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
47. වෛද්‍ය සේවාව සපයන ආයතනයක් පවත්වාගෙන යාම (ඩිස්පැන්සරියක්)
48. වාහන/යතුරුපැදි සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. ක්‍රීඩා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
50. මෙරට ද්‍රව්‍යය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. එළවළු සිල්ලර/ තොග වෙළඳම් සිදුකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. සූර්ය පැනල සවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. පොලිතීන් හා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. අවමංගල්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම

12-158/4

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1984 අංක 37 විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතින් දෙවන වගන්තියේ (1) වැනි උප වගන්තිය ප්‍රකාරව චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහා ම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10%ක විනෝද බද්දක් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, මීට අමතරව ඉහත සන්දර්ශනය වෙනුවෙන් පහත සඳහන් බලපත්‍ර ගාස්තුවක් ද, ගෙවිය යුතු බවට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව් ලේකම්ගේ තීරණ අංක 112(V) යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

ලේන්දූව ලොකුගේ ජයමිණී සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

		රු. ශත
01.	මුදල් අයකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	රු. 1,000 0
02.	මුදල් අය නොකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	රු. 500 0
03.	මුදල් අයකරන සර්කස් සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	රු. 1,000 0
04.	නාට්‍ය සංදර්ශනයක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු	රු. 500 0

12-158/5

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය හා වෙනත් බඳු - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි වගන්තිය ප්‍රකාව කඹුරුපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එක් එක් දැන්වීමකට අදාළ ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අය කළ යුතු බවට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 112(VI) යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

ලේන්දුව ලොකුගේ ජයමිණි සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		එක් මාසයක් තුළ *රු. ශත*	*වර්ෂයක් තුළ* *රු. ශත*
01.	ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා - වර්ග අඩි 01 ට	-	50 0
02.	ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා - වර්ග අඩි 01 ට (පෞද්ගලික සමාගම්)	-	75 0
03.	රෙදි හෝ ඩිජිටල් මුද්‍රිත බැනර් උපයෝගී කරගනිමින් දැන්වීම් ප්‍රදර්ශනය සඳහා - වර්ග අඩි 01 ට	30 0	40 0
04.	බිත්ති හෝ ගොඩනැගිලි උපයෝගී කර ගනිමින් දැන්වීම් ප්‍රදර්ශනය සහ ගමන් කරන වාහනයකට සවිකර ඇති දැන්වීමක් සඳහා - වර්ග අඩි 01කට	-	40 0
05.	කුඩා කටවුටි සඳහා වර්ග අඩි 01ට	-	20 0
06.	ප්‍රචාරක ස්ටිකර් දැන්වීමක් සඳහා වර්ග අඩි 01ට		30 0
07.	ස්ථිර දැන්වීම් පුවරුවක් දෙපැත්ත ප්‍රදර්ශනය සඳහා වර්ග අඩි 01ට	-	100 0

12-158/6

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

අක්කර බදු අය කිරීම - 2025 වර්ෂය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහත කී පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කඹුරුපිටිය ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක 2024 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යෝක්ෂණය 2025 වර්ෂයේ සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමටත්;

(ආ) 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1988 අගෝස්තු මස 23 දිනැති අංක 520/7 දරන *ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද 1989/03/10 වැනි දින *ගැසට් පත්‍රය* මගින් කඹුරුපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (රු. 50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක ම සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (රු. 10.00) බැගින් වූ අක්කර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකිරීමට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 112(VII) යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

(ඇ) එසේම ඉහත කී පනතේ 134 (6) වැනි වගන්තිය අනුව එකී අක්කර බදු 2025 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්වලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරිකවලින් ගෙවීමට හැකියාව ඇති බවත් එසේ ගෙවීමේ දී 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ දී අදාළ අක්කර බදු ගෙවන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද, ලබා ගත හැකි බව වැඩිදුරටත් දැනුම් දෙමි.

(ඈ) තව ද, ඔබ විසින් ඉහත සඳහන් කර ඇති දිනයන් අවසාන වන විට අදාළ අක්කර බදු ගෙවීමට අපොහොසත් වන්නේ නම් හෝ පැහැර හරිනු ලබන්නේ නම් කාර්තුවේ වටිනාකමට සියයට දහයක (10%) අධි ගාස්තුවකට යටත් වේ. එමෙන් ම අක්කර බදු ගෙවීම පැහැර හරිනු ලබන සෑම තැනැත්තෙකුට ම අයත් එහෙත් තම ජීවන වෘත්තිය කර ගෙන යාමට අදාළ නොවන සියලු චංචල දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය යටතේ සභාවට බලතල පැවරී ඇති බවද තවදුරටත් දැනුම් දෙමි.

ලේන්දූව ලොකුගේ ජයමිණී සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-158/7

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

ඇතැම් ඉඩම් විකිණීම මත බදු - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ඉඩමක් වෙන්දේසිකරුවෙකු, තැරැව්කැවෙකු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුයෝජිතයන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකින් හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන්නේ නම්, එම ඉඩමේ විකුණුමෙන් ලත් මුදලින් සියයට එකක (1%) සමාන බද්දක් වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයන්

හෝ අනුයෝජිතයින් විසින් ගෙවිය යුතු බව ද, එසේ ගෙවීම පැහැර හරින්නේ නම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියේ (2) (1) වගන්තිය ප්‍රකාරව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 112(x) යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

ලේන්දූව ලොකුගේ ජයමිණි සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-158/8

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු නියම කිරීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් පොදු උපයෝගී සේවා සහ සුබසාධන සේවා හා වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීම වෙනුවෙන් 2025 වර්ෂය තුළ දී පහත උපලේඛනයේ පරිදි ගාස්තු අය කිරීමට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණ අංක 112(xiv) යටතේ මා විසින් තීරණය කොට ඇති බව මෙයින් නිවේදනය කරමි.

ලේන්දූව ලොකුගේ ජයමිණි සඳමාලි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 18 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	සේවාව	*ගාස්තුව* *රු. ශත*
1.	ඔප්පු සාරාංශ අයදුම්පතක්	600 0
2.	නොපවරා ගැනීමේ හා ගොඩනැගිලි සීමා සහතිකයක්	750 0
3.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු - නගර සීමාව	1,000 0
4.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු - නගර සීමාවෙන් පිටත	750 0
5.	අනතුරුදායක ගස් ඉවත් කිරීම (කොස් ගසක් සඳහා)	750 0
6.	අනතුරුදායක ගස් ඉවත් කිරීම (වෙනත් ගසක් සඳහා)	350 0
7.	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තු - නගර සීමාව	1,000 0
8.	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තු - නගර සීමාවෙන් පිටත	750 0
9.	වෙනත් සහතික පත්‍ර නිකුත් කිරීම	200 0
10.	ටෙන්ඩර් අයදුම්පත් ගාස්තු	250 0
11.	කර්මාන්ත ගිවිසුම් පත්‍ර ගාස්තු	1,500 0
12.	පා පැදි බලපත්‍ර ලිපි ද්‍රව්‍ය ගාස්තු	6 0
13.	පුස්තකාල දඩ දිනකට	1 0
14.	තාවකාලික වෙළෙඳ කුටි වෙනුවෙන් එක් දිනකට වර්ග අඩියක් සඳහා	10 0
15.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	150 0
16.	පරිසර බලපත්‍ර අලුතින් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු	250 0

	සේවාව	*ගාස්තුව* *රු. ශත*
17.	නළ ජල සම්පාදන ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු	200 0
18.	අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් සඳහා භූමියේ නිශ්චිත ස්ථානයක් ලබා දීම (දිනකට)	2,000 0
19.	ජෙනරේටර් යන්ත්‍රය බදු දීම දිනකට	3,500 0
	අමතර ධාවනය වන පැය 01ක් සඳහා (ඉන්ධන/ප්‍රවාහනය රහිතව)	400 0
20.	ආදාහනාගාර සේවා ගාස්තුව :	
	බල ප්‍රදේශය තුළ	9,500 0
	බල ප්‍රදේශයෙන් පිටත	11,000 0
21.	ජේ. සී. බී. යන්ත්‍රය පැයකට	5,000 0
22.	අවිධිමත් ලෙස කසල බැහැර කිරන්නන් සඳහා දඩ මුදල	3,500 0
23.	පෙර පාසල් අයදුම්පත්‍ර ගාස්තු :	1,250 0
24.	දිවා සුරැකුම් මධ්‍යස්ථානයට ඇතුළත් වීමේ ගාස්තු	1,500 0
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගාස්තු (මසකට) :	
	අවුරුදු 1 ත් 2ත් අතර දරුවෙකු සඳහා	10,000 0
	අවුරුදු 2 ත් 3 ත් අතර දරුවෙකු සඳහා	9,000 0
	අවුරුදු 3 ත් 5ත් අතර දරුවෙකු සඳහා	8,000 0
	අවුරුදු 5ට වැඩි දරුවෙකු සඳහා	6,000 0
25.	මාර්ග පළුදු කිරීම :	
	කොන්ක්‍රීට් පාර ව. මී 1ක් සඳහා	3,191.76
	තාර පාර ව. මී. 1ක් සඳහා	1,670.97
	පස් පාර ව. මී. 1 සඳහා	736.80
	කුට්ටිගල් පාර ව. මී. 1ක් සඳහා	2,862.00
26.	ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීමේ ගාස්තුව (වාර්ෂික)	900 0
27.	කසල ලබා ගැනීම මාසික ගාස්තු - ගෘහස්ථ (වරිපනම් බල ප්‍රදේශයෙන් බැහැර)	1,000 0
28.	කසළ ලබා ගැනීම මාසික ගාස්තුව - ව්‍යාපාරික (එක් බාස්කට් එකකට දිනකට)	50 0
29.	ගොඩනැගිලි අයදුම්පත්‍ර දීර්ඝ කිරීමේ ගාස්තුව	1,500 0
30.	පුස්තකාල අයදුම් පත්‍ර ගාස්තු	50 0
31.	පස් තලන යන්ත්‍රය බදුදීම (පැ. 08කට රියැදුරු සහිතව/ඉන්ධන රහිතව)	10,000 0
32.	ජල බවුසරය (ලී. 4000) (ප්‍රවාහන ගාස්තු රහිතව) (ප්‍රවාහනය පළමු කි. මී. රු. 500.00, වැඩිවන කි. මී. 1 ට රු. 350.00 බැගින්)	4,000 0
33.	ලොකු ජල බවුසරය ලබාදීම (ලීටර් 6,000) (ප්‍රවාහන ගාස්තු රහිතව) (ප්‍රවාහනය පළමු කි. මී. රු. 700.00 වැඩිවන කි. මී. 1 ට රු. 350.00 බැගින්)	6,000 0
34.	ලී. 2000 ප්ලාස්ටික් ටැංකි බදු දීම (දිනකට)	600 0
35.	ලොකු ට්‍රැක්ටරය ට්‍රෙලරය සමග බදුදීම (දිනකට)	10,000 0
36.	ටිපර් රථය ලබා දීම (පැය 8 කට)	16,000 0
37.	ගොඩනැගිලි අනුකූලතා සහතික පත්‍ර ගාස්තු	3,000 0
38.	පැරණි ලේඛන පරීක්ෂා කිරීම සඳහා එක් වර්ෂයක් වෙනුවෙන්	25 0
39.	දිනකට එක් ප්ලාස්ටික් පුටුවක් බදුදීම	15 0
40.	කොඩිකණුවක් බදු දීම (දිනකට)	100 0
41.	ශබ්ද විකාශන යන්ත්‍ර යුගලයක් බදුදීම (1ක් රු. 750 බැගින් දිනකට)	1,500 0
42.	ඇම්ප් සඳහා	3,000 0
43.	පොදු සුසාන භූමිය තුළ මෘත ශරීරයක් මිහිදන් කිරීම වෙනුවෙන්	200 0

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය, කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්.ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා පොළොන්නරුව ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන් ම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමඟ කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ II වැනි තීරුවේ නිරූපිත ප්‍රමාණයේ බලපත්‍ර ගාස්තුවක් නියමකර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම ආයතනය විසින් අනුමතකර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපනශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට (1%) කට සමාන මුදල් ප්‍රමාණයක් හෝ ඉහත කී උපලේඛනයේ II වැනි තීරුවේ නිරූපිත ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදලකට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් නියමකර අය කිරීමටත් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - I යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. පී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි නමුත් රු.1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන විට*
	රු. ශත	*රු. ශත*	*රු.ශත*
01. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. කිරි පට්ටි හා කිරි වෙළෙඳාම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. මුහුදු මාළු, වැව් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරය	*II වැනි තීරය*		
කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි නමුත් රු.1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන විට*
	රු. ශත	*රු. ශත*	*රු.ශත*
12. සිසිල් බීම හෝ පළතුරු බීම, අයිස් පැකට්, යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. පෞද්ගලික වෙළෙඳපොලවල් හා බලයලත් ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. සංචාරක වෙළෙඳාම පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. කොණ්ඩා සැකසීමේ සැලුන් හල් හා බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. පුද්ගලික ජල සේවාව පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. ඝාතන මඩු පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

2025 වර්ෂයේ බදු පැනවීමේ ගාස්තුව 2025 වර්ෂයේ ජනවාරි මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු ය.

12 - 115/1

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල යටතේ පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 152 වන වගන්තිය යටතේ ව්‍යාපාර බද්දක් ගෙවීමට යටත් වන යම් ව්‍යාපාරයක් නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් කර්මාන්තයක් (වෙළඳාමක්) කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක් එක් කර්මාන්තය (වෙළඳාම) පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක් කර්මාන්ත (වෙළඳාම්) බද්දක් 2025 වර්ෂය සඳහා නියමකර අයකරගත යුතු බව සහ ඒ කර්මාන්ත (වෙළඳාම්) බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - II යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	I වැනි තීරය *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරය* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි නමුත් රු. 1,500 නොඉක්මවන විට*	*වාර්ෂික වටිනාකම රු.1,500 නොඉක්මවන විට*
		රු. ශත	*රු. ශත*	*රු.ශත*
01.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	බිම්මල් නිෂ්පාදනයකර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
04.	හස්ත කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	රස කැවිලි, මුරුක්කු, තුනපහ වර්ගඇතුළු විවිධ ආහාර ද්‍රව්‍ය ඇසුරුම්කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
06.	කොහු ඉදල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	රෙදිපිළි බතික් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	හඳුන්කුරු, සබන් හා ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගඩොල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	විසිතුරු මසුන් ඇති කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 115/2

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල දරන කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල යටතේ පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත් වන යම් කර්මාන්තයක් (වෙළඳාමක්) නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබූ ආදායම, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා නියම කර අයකරගත යුතු බව සහ ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - III යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

	I වැනි තීරය	*II වැනි තීරය*
	2024 වර්ෂයේ දී ව්‍යාපාර ආදායම	*රු. ශත*
i.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
ii.	රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
iii.	රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
iv.	රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
v.	රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
vi.	රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12 - 115/3

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පරීක්ෂණ හා සේවා ගාස්තු අයකිරීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් අවශ්‍යතාවයන් වෙනුවෙන් අදාළ කාර්යය ඉටුකර ගැනීමේ දී පහත ගාස්තු අය කිරීම විය යුතු බවට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - IV යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*කාර්යය*	*ගාස්තුව රු. ශත*
1.	ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු	400 0
2.	නොපවරාගැනීමේ සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු	400 0
3.	දීර්ඝකාලීන ඉඩම් බලපත්‍ර නිකුත් කිරීමේ ස්ථාන පරීක්ෂණ ගාස්තු	800 0
4.	වරිපනම් නම් වෙනස් කිරීමේ ස්ථාන පරීක්ෂණ ගාස්තු	750 0
5.	වැලි හා බොරළු මාර්ගය හරහා පළුදු කිරීමේ ගාස්තු	1,000 0
6.	වැලි හා බොරළු පාරක උරහිස පමණක් පළුදු කිරීමේ ගාස්තු	500 0
7.	වරිපනම් සංශෝධනය කිරීමේ පෝරම ගාස්තු	250 0
8.	ගොඩනැගිලි සීමා අයදුම්පත් පෝරම ගාස්තු	150 0
9.	ගොඩනැගිලි ඉදිකිරීම් අයදුම්පත් පෝරම ගාස්තු	350 0
10.	ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේ පෝරම ගාස්තු	200 0
11.	අනුකූලතා අයදුම්පත්‍ර ගාස්තු	350 0
12.	සංවර්ධන බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	150 0

අනු. අංකය	*කාර්යය*	*ගාස්තුව රු. ශත*
13.	පරිසර බලපත්‍ර ඉල්ලුම් කිරීමේ පෝරම ගාස්තු	100 0
14.	පරිසර බලපත්‍ර දීර්ඝ කිරීමේ පෝරම ගාස්තු	50 0
15.	අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා අවසර පත්‍ර ගාස්තු (දිනකට)	1,000 0
16.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	100 0
17.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - එක් අයිතමයක් සඳහා	1,500 0

17. **ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තු හා සභා ගාස්තු :**

පෙරසැරි ගාස්තු

ගෙබිමේ ප්‍රමාණය (ව.මී.)	*නේවාසික (ව.මීටර් 1කට)*		*නේවාසික නොවන(ව.මී. 1කට) (රු.)*
	තනි පුද්ගල (රු.)	*මහල් නිවාස (රු.)*	
$0m^2$ - $400m^2$	20 0	25 0	25 0
$401m^2$ - $1,000m^2$	22 0	27 0	27 0
$1001m^2$ -$1500m^2$	25 0	30 0	30 0
$1501m^2$ - $2000m^2$	25 0	32 0	32 0
$2000m^2$ ට වැඩි	වැඩිවන සෑම ව. මී. 90ක් සඳහාම රු. 2000 0 බැගින්	වැඩිවන සෑම ව. මී. 90ක් සඳහාම රු. 2000 0 බැගින්	වැඩි වන සෑම ව. මී. 90ක් සඳහාම රු. 2000 0 බැගින්
ප්‍රාදේශීය සභා ගාස්තු සෑම වර්ග අඩි 1කට	1.50	2.00	3.00

සංවර්ධන බලපත්‍රයේ කාලය වසරකින් දීර්ඝ කිරීම :

ගෙබිම් ප්‍රමාණය	*ගාස්තුව රු.*
$0m^2$ - $1000m^2$	5,000 0
1,000 0 වැඩි	10,000 0

ඉහත ගාස්තු සම්පූර්ණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ම අදාළ වේ.

18. ඉඩම් අනු බෙදුම් පෙරසැරි ගාස්තු :

පෙරසැරි ගාස්තු ඉඩමේ ප්‍රමාණය (ව.මී.)		*ගාස්තුව රු. ශත*
150 m^2- 300 m^2	කැබලි 1ක් සඳහා	1,000 0
301 m^2 - 600 m^2	කැබලි 1ක් සඳහා	800 0
601 m^2 - 900 m^2	කැබලි 1ක් සඳහා	600 0
900 m^2 ට වැඩි	කැබලි 1ක් සඳහා	500 0
සභා ගාස්තු සම්පූර්ණ ඉඩම සඳහා		800 0

19. **මායිම් තාප්ප / ආරක්ෂක බැම් ඉදිකිරීමේ පෙරසැරි ගාස්තුව හා සභා ගාස්තුව**

පෙරසැරි ගාස්තුව - දික් මීටර් 01ක් සඳහා රු. 100.00

සභා ගාස්තුව - රු. 800.00

20. **සන්නිවේදන කුළුණු, ඇන්ටනා කුළුණු හා සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේ පෙරසැරි ගාස්තුව හා සභා ගාස්තුව**

පෙරසැරි ගාස්තුව - රු. 40,000.00

සභා ගාස්තුව - රු. 1500.00

21. **වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන පිහිනුම් තටාක හා සූර්යය පැනල සඳහා වන පෙරසැරි ගාස්තු හා සභා ගාස්තු :**

පෙරසැරි ගාස්තු :

ඉදිකිරීමේ ප්‍රමාණය (ව.මී.)	ගාස්තුව රු. ශත
$0m^2$ - $300m^2$	6,000 0
$301m^2$ - $500m^2$	15,000 0
$501m^2$ -$1000m^2$	30,000 0
$1000m^2$ ට වැඩි	30,000 + ට වැඩි වන සෑම වර්ග මීටර් 100ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 1000.00 බැගින්
සභා ගාස්තු	
සම්පූර්ණ ඉදිකිරීම සඳහා	1,000 0

22. **අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා වන පෙරසැරි ගාස්තුව හා සභා ගාස්තුව :**

* පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල :

පෙරසැරි ගාස්තුව				
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළයුතු ගාස්තුව*			
1. ඉඩම් අනු බෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 1000.00			
2. ගොඩනැගිලි ඉදි කිරීම	*ගෙබිමේ ප්‍රමාණය (ව. මී.)*	*නේවාසික*		*නේවාසික නොවන රු.*
		තනි පුද්ගල රු.	*මහල් නිවාස රු.*	
	$0m^2$ - $400m^2$	4,000.00	5,000.00	5,000.00
	$400m^2$ ට වැඩි	රු. 4,000 + $400m^2$ ට වැඩි වන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15.00 බැගින්	රු. 5,000 + $400m^2$ ට වැඩි වන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින්	රු. 5,000 + $400m^2$ ට වැඩි වන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්
3. සන්නිවේදන කුළුණු, ඇන්ටෙනා කුළුණු හා සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම	ඉදිකිරීම සඳහා රු. 5,000 0			
4. මායිම් තාප්ප හා රැඳවුම් බැම්ම	දික් මීටර් 1 කට රු. 25.00 බැගින්			
සභා ගාස්තුව :				
ගෙබිමේ ප්‍රමාණය	*නේවාසික*			*නේවාසික නොවන රු.*
	තනි පුද්ගල රු.	*මහල් නිවාස රු.*		
සෑම වර්ග අඩි 1 ක් සඳහා	1.50	2 0		3 0

* පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ හැර පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් අනෙකුත් ප්‍රදේශවල

පෙරසැරි ගාස්තුව :				
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*			
1. ඉඩම් අනු බෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 800.00			
2. ගොඩනැගිලි ඉදිකිරීම	*ගෙබිමේ ප්‍රමාණය (ව. මී.)*	*නේවාසික*		*නේවාසික නොවන රු.*
		තනි පුද්ගල රු.	*මහල් නිවාස රු.*	
	$0m^2$ - $400m^2$	2,000.00	3,000.00	5,000.00
	$400m^2$ ට වැඩි	රු. 2,000 + $400m^2$ ට වැඩිවන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින්	රු. 3,000 + $400m^2$ ට වැඩිවන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින්	රු. 5,000 + $400m^2$ ට වැඩිවන සෑම ව. මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින්
3. සන්නිවේදන කුළුණු, ඇන්ටෙනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම	ඉදිකිරීම සඳහා රු. 5,000 0			
4. මායිම් තාප්ප හා රැඳවුම් බැම්	දික් මීටර් 1කට රු. 25.00 බැගින්			
සහා ගාස්තුව :				
ගෙබිමේ ප්‍රමාණය	*නේවාසික*			
	තනි පුද්ගල රු.	*මහල් නිවාස රු.*		*නේවාසික නොවන රු.*
සෑම වර්ග අඩි 1 ක් සඳහා	1.00	1.50		2.00

23. ආවරණ අනුමැතිය ලබාදීම සඳහාවන සේවා ගාස්තු (පෙරසැරි ගාස්තුවලට අමතරව) :

සංවර්ධනයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු (බදු රහිත)*	
1. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදු කරන ලද ඉඩම් බෙදීමක් සඳහා	කැබලි 1ක් සඳහා රු. 3,000 0 බැගින්	
2. අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම්/එකතු කිරීම්/නැවත ඉදිකිරීම්	*නේවාසික (ව. මී. 1 කට)*	*නේවාසික නොවන (ව. මී. 1 කට)*
i. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා)	රු. 200 0	රු. 500 0
ii. වහල මට්ටම දක්වා ඉදිකිරීම් ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර)	රු. 300 0	රු. 1,000 0
iii. වහලය සහිත බිත්ති ඉදිකිරීම	රු. 400 0	රු. 1,500 0
iv. පදිංචි වීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම	රු. 500 0	රු. 2,000 0
3. මායිම් තාප්ප/රැඳවුම් බිත්ති ඉදිකිරීම	රු. 200 0 (දික් මීටරයක් සඳහා)	රු. 500 (දික් මීටරයක් සඳහා)
4. විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම	බිම් පාදක ඉදිකිරීම වහල මුදුන ඉදිකිරීම	රු. 1,50,000 0 රු. 1,00,000 0

24. පසුවිපරම් හා නිරීක්ෂණ වාර්තාව සඳහා ගාස්තු :

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)*	*ගාස්තුව රු.*
	900m^2 - 2000m^2	3,000 0
ගොඩනැගිලි ඉදිකිරීම	2001m^2 - 5000m^2	5,000 0
	5000m^2 ට වැඩි	10,000 0

25. භාවිතය වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු :

	ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)	*ගාස්තුව රු.*
පෙරසැරි ගාස්තු	45m^2 දක්වා	1,000 0
	46m^2 - 90m^2	1,500 0
	91m^2 - 180m^2	1,750 0
	181m^2 - 270m^2	2,000 0
	271m^2 - 450m^2	2,500 0
	451m^2 - 675m^2	2,750 0
	676m^2 - 900m^2	3,000 0
	900m^2 ට වැඩි	900m^2 ට වැඩි වන සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු. 500 0 බැගින්
අවසර පත්‍රය සඳහා ගාස්තු	වර්ග මීටරයක් සඳහා රු. 750 0	
i. නේවාසික භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදු ගැනීම		
ii. නේවාසික නොවන අනෙකුත් භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදු ගැනීම	වර්ග මීටරයක් සඳහා රු. 500 0	

වෙනත් අවශ්‍යතාවයන් මත තාර හෝ කොන්ක්‍රීට් හෝ කොන්ක්‍රීට් ගල් ඇතිරූ පාරවල් පළුදු කිරීමේ දී සභාවේ කාර්මික නිලධාරියාගේ ඇස්තමේන්තුව මත ප්‍රතිසංස්කරණය කිරීමේ ගාස්තු අයකරනු ලබයි.

12 - 115/4

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

විනෝද බද්ද අය කිරීම - 2025 වර්ෂය

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 වන අධිකාරිය) 3 වැනි වගන්තිය ප්‍රකාර පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වන චිත්‍රපට දර්ශනයක්, සැණකෙළියක්, මුදල් අය කරනු ලබන සෑම සංදර්ශනයක් සඳහා ම පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු ගෙවා පොදු රැඟුම් බලපත්‍රයක් ලබාගත යුතු බවටත්,

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවැත්වෙන එවැනි සංගීත සංදර්ශනයක්, විනෝද මේලා හෝ සැණකෙලියක්, අනෙකුත් සංදර්ශන හෝ ආධාර චිත්‍රපට සහ මුදල් අය කරනු ලබන සෑම සංදර්ශනයක් සඳහාම අලෙවි කරන ලද ප්‍රවේශ පත්‍රවල

මුද්‍රිත වටිනාකමින් සියයට දොළහක (12%) විනෝද බද්දක් ගෙවිය යුතු බවටත් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - IV යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය	
දින ගණන	*අයකරන බලපත්‍ර ගාස්තුව*
එක් දිනක වැඩසටහනක් සඳහා	රු. 1000.00
දිනකට වැඩි දින 03 ක් දක්වා වැඩසටහනක් සඳහා	රු. 2000.00
දින 03කට වැඩි වැඩසටහනක් සඳහා	රු. 3000.00

12-115/5

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

වරිපනම් පැනවීම - 2025 වර්ෂය

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල දරන කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව,

(අ) 2015 වර්ෂයේ තමන්කඩුව ප්‍රාදේශීය සභාව මගින් තක්සේරු කරන ලද දූනට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් 161 ගණන්ගොල්ල ග්‍රාම නිලධාරි වසමට අයත් කුඹුරු ඉඩම් හැර සියලුම දේපළවලින් 4% (සියයට හතරක) ප්‍රතිශතයක් වූ වරිපනම් බදු මුදලක් 2025 වර්ෂය සඳහා අය කිරීමටත්,

(ආ) 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත වාර්ෂික වරිපනම් බද්ද, 2025 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවටත්,

(ඇ) 2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු මුදල 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත්, එම වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත්, ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ගාස්තු ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් හිමි විය යුතු බවට පෙළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - VI යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ඊ පුස්තකාල, මහජන පුස්තකාල හා පෙරපාසල් සේවා ගාස්තු

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල දරන, කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, ප්‍රාදේශීය සභාව මගින් සේවා සැපයීම සඳහා පිහිටුවන ලද මහජන පුස්තකාල හා ඊ පුස්තකාල සේවා ගාස්තු වශයෙන් පහත සඳහන් පරිදි ගාස්තු මුදලක් අය කිරීමටත්, පෙ. ව. 8.00 සිට ප. ව. 04.45 දක්වා විවෘතව තැබීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - VII යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

පුස්තකාල අයදුම්පත්‍රය	රු. 10 0
වර්ෂයක් සඳහා පුස්තකාල සාමාජික ගාස්තු (ළමා)	රු. 100 0
පුස්තකාල සාමාජික ගාස්තු (වැඩිහිටි)	රු. 200 0
පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට (එක් පොතකට)	රු. 1 0
පරිගනක පුහුණු (අන්තර්ජාලය සහිත පැයකට)	රු. 50 0
පරිගනක පුහුණු (අන්තර්ජාලය රහිත පැයකට)	රු. 20 0
ඡායා පිටපත්	
A4 තනි පැත්ත	රු. 10 0
A4 දෙපැත්ත	රු. 15 0
යතුරු ලියන	
A4 තනි පැත්ත	රු. 100 0
A4 දෙපැත්ත	රු. 150 0
පෙර පාසැල් සේවා	
පෙර පාසල් ඇතුළත් වීමේ අයදුම්පත්‍රය	රු. 20 0
පෙර පාසල් ඇතුළත් වීමේ ගාස්තු	රු. 500 0
එක් දරුවකුගෙන් මසකට අය කරන මුදල	රු. 400 0

12 - 115/7

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

සුසානභූමි හා ආදාහනාගාර ගාස්තු අය කිරීම - 2025 වර්ෂය

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සුසාන භූමියක මෘත දේහයක් භූමදානය

කිරීම/ තැන්පත් කිරීම හා ස්මාරක ඉදිකිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු මුදලක් අය කිරීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - VIII යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

		රු. ශත
1.	මෘත දේහයක් භූමදානය කිරීම සඳහා	250 0
2.	මෘත දේහයක් තැන්පත් කිරීම සඳහා (වර්ග අඩි 01 ක් සඳහා)	75 0
3.	ස්මාරකයක් ඉදිකිරීම සඳහා (වර්ග අඩි 01 ක් සඳහා)	100 0

12 - 115/8

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

වාහන කුළියට දීමේ ගාස්තු - 2025 වර්ෂය

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍ර හා වාහන කුළියට දීමේ දී පහත සඳහන් පරිදි ගාස්තු මුදලක් අය කිරීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - IX යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*වාහන වර්ගය*	*ඉන්ධන රියදුරු සහිතව මීටර් පැයකට/හෝ කිලෝමීටරයකට (රු.)*	*අවම පැය/ කිලෝ මීටර් ගණන*
01	මෝටර් ග්‍රේඩරය	මීටර් පැයකට රු. 8,000 0	පොළොන්නරුව ප්‍රාදේශීය සභා හා නගර සභා බල ප්‍රදේශයෙන් පිටත සේවාවක් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවන් හි දී පමණක් අවම මීටර් පැය 4 කට මුදල් ගෙවීම සිදු කළ යුතු ය.

අනු. අංකය	*වාහන වර්ගය*	*ඉන්ධන රියදුරු සහිතව මීටර් පැයකට/හෝ කිලෝමීටරයකට (රු.)*	*අවම පැය/ කිලෝ මීටර් ගණන*
02	බැකෝ ලෝඩරය (JCB)	මීටර් පැයකට රු. 7,000 0	පොළොන්නරුව ප්‍රාදේශීය සභා හා නගර සභා බල ප්‍රදේශයෙන් පිටත සේවාවක් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවන් හි දී පමණක් අවම මීටර් පැය 4 කට මුදල් ගෙවීම සිදු කළ යුතු ය.
03	ටිපර් රථය	ධාවනය කරන කිලෝ මීටරයකට රු. 150 0 බැගින්	අවම කිලෝමීටර් 100
04	ට්‍රැක්ටර් ගලිය	එක් වාරයකට රු. 4,000 හා කිලෝමීටරකට රු. 150	
05	ජල බවුසරය	එක් වාරයකට රු. 2,000 හා කිලෝමීටරකට රු. 150	
06	කොන්ක්‍රීට් මික්ෂරය	පැය 1ක් සඳහා රු. 700 දිනකට රු. 4,800 ඇප තැන්පතුව රු. 5,000	
07	පෝකර් යන්ත්‍රය	පැය 1ක් සඳහා රු. 750 දිනකට රු. 6,400 ඇප තැන්පතුව රු. 5,000	

- ප්‍රවාහනය සඳහා අමතර ගාස්තු අය නොකරන අතර වාහනය කාර්යාලයෙන් පිටත් වූ වේලාවේ සිට කුළියට ලබාදුන් පැය ගණන ගණනය කරනු ලැබේ.

12 - 115/9

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

ක්‍රීඩාපිටි හා රැස්වීම් ශාලා කුළියට දීමේ ගාස්තු - 2025 වර්ෂය

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, පොළොන්නරුව ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා පිටි හා රැස්වීම් ශාලා කුළියට දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - X යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01.	බැදිවැව රැස්වීම් ශාලාව - වායුසමීකරණ සහිතව පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා ගාස්තුව - (ඇප තැන්පත් මුදල රු. 5,000 0)	රු. 15,000 0

02.	බැඳිවැව සමුද්‍රාගම ක්‍රීඩාපිටිය (දින 1ක් සඳහා)	රු. 3,000 0
03.	පළුගස්දමන පොදු ක්‍රීඩාපිටිය (දින 1ක් සඳහා)	රු. 3,000 0

12 - 115/10

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය - ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, 2016.03.30 දින අංක 1960/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව 2016.11.29 වැනි දින උතුරුමැද පළාත් සභාවේ පිළිගන්නා ලද අතුරු ව්‍යවස්ථාවන් යටතේ 2018.12.07 වැනි දින අංක 2101 දරන *ගැසට් පත්‍රය* මගින් පොළොන්නරුව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාව අනුව පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - XI යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1. විද්‍යුත් මාර්ගයෙන් ප්‍රචාරක කටයුතු කිරීමේ ද, දැන්වීම් පුවරුවක් සඳහා වර්ෂයකට වර්ග අඩියක් සඳහා රුපියල් 250 ක් ද,
2. ස්ථිර විශාල දැන්වීම් පුවරුවක්/වර්ෂයක කාල සීමාවක් සඳහා වර්ග අඩියකට රුපියල් රු. 150 ක් ද,
3. මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (Gentries) වර්ෂයකට වර්ග අඩියක් සඳහා රු. 100 ක් ද,
4. ව්‍යාපාරික ස්ථානයකට යාබදව එම ව්‍යාපාරික ස්ථානයට අදාළව ප්‍රදර්ශනය කරන ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ෂයකට වර්ග අඩියකට රුපියල් 100 ක් ද,
5. ප්‍රාදේශීය සභාව මගින් ඉදිකර ඇති දූකුම් පැළලිවල දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් හෝ මාසයකට අඩු කාල සීමාවක් සඳහා වන දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියක් සඳහා රු. 25 ක් ද වශයෙන්.

12 - 115/11

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය - කසළ අපහරණ ගාස්තු අයකිරීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල දරන කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කර්මාන්ත හා ව්‍යාපාරික ස්ථාන වලින් ඉවතලන කසළ ඉවත් කිරීමේ සේවාව ලබා දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - XII යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

			රු. ශත
01.	ගෘහස්ථ කසළ	මසකට	200 0
02.	සිල්ලර වෙළෙඳසැල්	මසකට	500 0
03.	එළවළු වෙළෙඳසැල්	මසකට	1,000 0
04.	හෝටල්	මසකට	1,000 0
05.	වී මෝල්	මසකට	5,000 0
06.	කර්මාන්තශාලා	ගාස්තුව ඇස්තමේන්තුව මත වෙනස් වේ.	

12 - 115/12

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය - ඇතැම් ඉඩම් විකිණීම මත බදු අයකිරීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තියෙන් පැවරී ඇති බලය අනුව පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% (සියයට එකක්) ක බදු මුදලක් අය කිරීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - XIII යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 115/13

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය - දියමං පාලම ළමා උද්‍යානය ගාස්තු අයකිරීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් විජයබාහුපුර දියමං පාලම ළමා උද්‍යානයේ හංස බෝට්ටු සේවා ගාස්තු සහ වාහන නැවැත්වීමේ ගාස්තු පහත පරිදි අය කිරීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - XIV යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

හංස බෝට්ටු ප්‍රවේශ පත්‍ර ගාස්තු (එක් වාරයක් සඳහා එක් පුද්ගලයෙකුගෙන්)	-	රු. 100 0
වාහන නැවැත්වීමේ ගාස්තු (බයිසිකල්, මෝටර් බයිසිකල් සහ ත්‍රී රෝද රථ හැර)	-	රු. 100 0

12 - 115/14

පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය - වාහන හා සත්ත්ව බද්ද අය කිරීම

පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ඉටුකරන, පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 148 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පොළොන්නරුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පහත උපලේඛනයෙහි දක්වෙන ආකාරයට වාහන හා සත්ත්ව බද්දක් සහ රු. 150.00 ක සේවා ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම කර අයකර ගැනීමට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන කමිටුවේ තීරණ අංක PPS/2024/10/03/1243 - XV යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එම්. ආර්. ඩබ්. සී. කේ. රණවීර,
ලේකම් හා බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,
පොළොන්නරුව.

2024 ඔක්තෝබර් මස 03 වැනි දින,
පොළොන්නරුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවෙන සෑම වාහනයක් සඳහා සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	25 0
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැනහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැනහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 115/15

සීතාවක ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පීඩාකාරී වෙළඳාම්, අන්තරාදයක වෙළඳාම් හා පීඩාකාරී හා අන්තරාදයක වෙළඳාම් සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 උපවගන්තියට හා ඒ සමඟ කියවිය යුතු එකී පනතේ 9(3) වගන්තිය අනුව සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ සඳහන් පීඩාකාරී වෙළඳාම්, අන්තරාදායක වෙළඳාම් හා පීඩාකාරී සහ අන්තරාදයක වෙළඳාම් අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා 2025 වර්ෂයේ සිට අදළ විය යුතු බවට අංක 2024/11/18/4949 දරන තීරණය ගෙන ඇති බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. චන්දන පද්මසිරි,
ලේකම් හා සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
සීතාවක ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 18 වැනි දින,
සීතාවක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 උපවගන්තිය යටතේ සීතාවක ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව සීතාවක ප්‍රාදේශීය සභාව විසින් සම්පාදිත හා බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 50/2306 දරන 2022/11/17 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත පීඩාකාරී හා අන්තරාදයක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 05 වන වගන්තිය අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ සඳහන් පීඩාකාරී වෙළඳාම්, අන්තරාදයක වෙළඳාම් හා පීඩාකාරී සහ අන්තරාදයක වෙළඳාම් හා පීඩාකාරී සහ අන්තරාදයක වෙළඳාම් අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා 2025 වර්ෂයේ සිට අදළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මම තීරණය කරමි.

පළමුවන උපලේඛනය

පීඩාකාරී ව්‍යාපාර :

1. සම් විකිණීම
2. සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
3. කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
4. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
5. වේවැල් භාණ්ඩ නිපදවීම
6. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
7. ඉටිපත්දම් නිපදවීම
8. කපුරු නිපදවීම
9. ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
10. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම
11. සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
12. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
13. ධාන්‍ය හෝ මාෂභෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
14. කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම
15. එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම

දෙවන උපලේඛනය

අන්තරායදයක ව්‍යාපාර :

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
3. මුද්‍රණාලයක් පැවැත්වීම
4. දර ගබඩාවක් පැවැත්වීම
5. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
6. අයිස් ක්‍රීම් නිෂ්පාදනය
7. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම

8. ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
9. කොහු හෝ වෙනත් කෙදි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
11. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
12. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
13. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම
14. හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම
15. පාපැදි හෝ යතුරුපැදි අලුත්වඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම
16. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම
17. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩ ප්‍රමාණයක් ගබඩා කිරීම
18. දැව ගබඩා කිරීම
19. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
20. කිලෝ ග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩා කිරීම

තෙවන උපලේඛනය

ජීවිකාකරී හා අන්තරාදායක ව්‍යාපාර :

1. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳිකිරීම
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
3. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම
4. විද්‍යුත් ලෝහආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම
5. හුණු ගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළුහුණු ගබඩා කිරීම
6. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
7. මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
8. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
9. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
10. බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම
11. ගෑස් සිලින්ඩර් කිරීමේ ගබඩා කර තබා ගැනීම
12. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම
13. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම
14. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
15. වැල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම
16. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩ පළක් පැවැත්වීම
17. පෙට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජතෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
18. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම
19. වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම
20. විදුලි කර්මාන්ත වැඩ පළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම
21. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම
22. කාබනික පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
23. සම්පදම් කිරීම
24. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
25. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම
26. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම
27. සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම
28. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
29. සබන් නිෂ්පාදනය කිරීම
30. සත්ත්ව ඇටකටු ඇඹිරීම හෝ තබා ගැනීම
31. අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම
32. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
33. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
34. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
35. සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම
36. රසකැවිලි වර්ග නිපදවීම

37. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
38. දත් බුරුසු නිපදවීම
39. රා එකතු කිරීම
40. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම
41. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම
42. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
43. සෝඩා නිපදවීම
44. සම් භාණ්ඩ නිපදවීම
45. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
46. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළු බඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම
47. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
48. රෙදි සෝදන නිල් නිපදවීම
49. ලාකඩ නිපදවීම
50. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
51. පාසල් රටහුණු නිපදවීම
52. ටයර් නැවත පිරවීම
53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
54. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
55. පොහොර, හුණු පිටි, හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම
56. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
57. ගඩොල් හෝ උළු නිපදවීම ගබඩාකර තබා ගැනීම
58. කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
59. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම
60. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම
61. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම (සත්ව ගොවිපළවල් සඳහා පමණි)
62. ඇසුරුම් කරන ලද ශීත කළ කුකුල් මස් විකිණීම

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළ කිරීමේ දී යම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

12-134

මහනුවර මහා නගර සභාව

2025 වර්ෂය සඳහා බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු නියම කිරීම

මහනුවර මහා නගර සභාවේ කළමනාකරන කමිටුව මගින් 2024 වර්ෂයේ ඔක්තෝබර් මස 10 වැනි දින අංක 1590 දරන තීරණය මගින් පහත දැක්වෙන යෝජනාව සම්බන්ධයෙන් තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා පනවන ලද බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු මහනුවර මහා නගර සභාව නියම කරන දිනයකට පෙර මහනුවර මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
මහනුවර මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වන අධිකාරය) 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා සීමාවන් ඇතුලත තබා ගන්නා එක් බල්ලෙකුට රු. 5.00 ට වැඩි නොවූ වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් අය කිරීමට නීත්‍යානුකූල සහ බලය දී ඇති බැවින්, 2025 වර්ෂය සඳහා එසේ ලියාපදිංචි කරන එක් බල්ලෙකු සඳහා රු. 5.00 ක ලියාපදිංචි ගාස්තුවක් අය කිරීමටත්, ලේඛන සැකසීමේ ගාස්තු ලෙස රු. 100 වාර්ෂික ගාස්තුවක් අය කිරීමටත් එම ගාස්තුව 2025 මාර්තු 31 වැනි දිනට පෙර බල්ලන් තබා ගන්නා තැනැත්තා විසින් ගෙවිය යුතු බවටත් මහනුවර මහා නගර සභාව යෝජනා කරන්නීය.

12-206

කුරුවිට ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා පුස්තකාල සම්බන්ධ ගාස්තු පැනවීම

2024.11.21 වන දින ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහයවීමේ කමිටුවේ අංක 14 දරන කමිටු නිර්දේශය හා 2024.11.21 දින අංක 14 දරන ලේකම් තීරණය පරිදි අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වන කුරුවිට මහජන පුස්තකාලය, කිරිඇල්ල ශාඛා පුස්තකාලය, එල්ලාවල ශාඛා පුස්තකාලය සහ දොඩම්පේ ශාඛා පුස්තකාලවලට සම්බන්ධ පහත උපලේඛනයේ සඳහන් සියලු ගාස්තු කුරුවිට ප්‍රාදේශීය සභාව වෙත හෝ අදළ උපකාර්යාලයන් වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදන කරනු ලැබේ.

ඊ. කේ. ඉන්දික ප්‍රසාද් කුමාර,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2024 දෙසැම්බර මස 03 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු අංකය	*විස්තරය*	*පාසල් ළමුන් සඳහා රු. ශත*	*වැඩිහිටියන් සඳහා රු. ශත*
01	පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු	25 0	25 0
02	සාමාජික ගාස්තු	50 0	200 0
03	සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු	50 0	50 0
04	ප්‍රමාද ගාස්තු	2 0	5 0

12-160/1

කුරුවිට ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා ජල බවුසරය ලබාදීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

2024 නොවැම්බර් මස 21 වැනි දින ප්‍රතිපත්ති හා තීරණ ගැනීමට සහය වීමේ කමිටුවේ අංක 64 දරන කමිටු නිර්දේශය හා 2024 නොවැම්බර් මස 21 වැනි දින අංක 64 දරන ලේකම් තීරණය පරිදි පහත සඳහන් ගාස්තු අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජලය රහිත බවුසරය (ලීටර් 3000) සඳහා	රු. 2,300 0
ප්‍රවාහනය කි. මී. 01 ක් සඳහා	රු. 28 0
කම්කරු (පුහුණු) කුලිය (රියදුරු හා සහායක) දිනකට (පැය 8 ක් සඳහා)	රු. 2,300 0

ඊ. කේ. ඉන්දික ප්‍රසාද් කුමාර,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2024 දෙසැම්බර් මස 03 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-160/2

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන,හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3186 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ හොරණ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1455/14 හා 2006 ජූලි මස 25 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රය යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2023 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2025 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 6% ක වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තවද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද හොරණ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවන්නේනම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියෙහි තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල හොරණ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5% වට්ටමක්ද හොරණ ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*වර්ෂයේ සම්පූර්ණ මුදල එකවර ගෙවන්නේ නම් 10% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2025.03.31	2025.01.31	2025.01.31
දෙවන කාර්තුව	2025.06.30	2025.04.30	
තුන්වන කාර්තුව	2025.09.30	2025.07.31	
හතරවන කාර්තුව	2025.12.31	2025.10.31	

12-194/1

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන, හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3187 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ ද,ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථීර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2025 වර්ෂය සඳහා රුපියල් දහය (10/-) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට තීරණය කරමි.

තවද, පහත උපලේඛනයේ 01 වැනි තීරුවේ දැක්වෙන එක් එක් කාර්තුව වෙනුවෙන් ඒ ඉදිරියෙන් 02 තීරුවේ දැක්වෙන අවසාන දිනයට පෙර එකී වාර්ෂික බද්ද හොරණ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත්,එකී වාර්ෂික අක්කර බද්ද 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් එකී වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද,එම උපලේඛනයේ 01 වැනි තීරුවේ සඳහන් කාර්තුව ඉදිරියෙන් 03 වැනි තීරුවේ දැක්වෙන දිනයට පෙර අදාළ මුදල, ප්‍රාදේශීය සභාව වෙත ගෙවන්නේ නම් කාර්තුවට අදාල මුදලින් සියයට පහක 5% වට්ටමක්ද ලබා දෙනු ලැබේ.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024.11.19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු අවසාන දිනය*	*5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*	*වර්ෂයේ සම්පූර්ණ මුදල එකවර ගෙවන්නේ නම් 10% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2025.03.31	2025.01.31	2025.01.31
දෙවන කාර්තුව	2025.06.30	2025.04.30	
තුන්වන කාර්තුව	2025.09.30	2025.07.31	
හතරවන කාර්තුව	2025.12.31	2025.10.31	

12-194/2

හොරණ ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2025 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා

149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3188 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි i වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා හොරණ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද, තවද,එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොලක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2024 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තු ලෙස 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750.00 නොඉක්මවන විට	*රු. 750.00 සිට රු. 1,500.00 දක්වා*	*රු. 1,500.00ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
02	සත්ත්ව පාලනය (මස්,කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
03	ඖෂධාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
04	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
06	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
07	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
08	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
09	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
10	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
11	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර ලබා ගැනීම	500 0	750 0	1,000 0
12	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයන් පැවැත්වීම	500 0	750 0	1,000 0
13	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
14	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
16	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750.00 නොඉක්මවන වීට	*රු. 750.00 සිට රු. 1,500.00 දක්වා*	*රු. 1,500.00ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
17	බුරුසු වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
18	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
19	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
21	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
22	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
23	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24	පළතුරු ,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
25	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂබෝග, කුළුබඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
26	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
27	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
28	ලියන තීන්ත,අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
29	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
30	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
31	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
32	පාසැල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
33	ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර ගැනීම	500 0	750 0	1,000 0
34	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
35	ටයර්,ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
36	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
37	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
38	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
40	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
41	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
42	ධාන්‍ය හෝ මාංෂ බෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
43	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
44	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
45	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
46	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
47	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
48	ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
49	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
50	කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
51	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750.00 නොඉක්මවන විට	රු. 750.00 සිට රු. 1,500.00 දක්වා	රු. 1,500.00ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
52	අයිස්ක්‍රීම් නිෂ්පාදනය/යෝගට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
53	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
54	ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
55	කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
56	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
57	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
58	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
59	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
60	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
61	පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
62	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
63	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
64	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
65	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
66	ශීතකල මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
67	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
68	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
69	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
70	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
71	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
72	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම,සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
73	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
74	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානය	500 0	750 0	1,000 0
75	මෝටර් වාහන සේවා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
76	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
80	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
81	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
82	කිලෝ ග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
83	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
84	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
85	පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
87	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
88	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750.00 නොඉක්මවන සීට	රු. 750.00 සිට රු. 1,500.00 දක්වා	රු. 1,500.00ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
89	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
90	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
91	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
93	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
96	කොණ්ඩා කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
97	රූපලාවන්‍යාගාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
98	ලොන්ඩරි,රෙදි සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
99	උත්සව ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
100	එළවළු සහ පලතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
101	ආහාර නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102	පෞද්ගලික අධ්‍යාපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103	සංචාරක වෙළඳාමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
104	අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
105	මහජන පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-194/3

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන, හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම,1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3189 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150 වැනි වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට මම තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750.00 නොඉක්මවන විට	රු. 750.00 සිට රු. 1,500.00 දක්වා	රු. 1,500.00ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
01	තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	තේ කොළ/කුළුබඩු/බෙහෙත් බඩු වර්ග,පහන්තිර පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	පාවහන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
08	හඳුන්කුරු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09	පොලිතීන් නිෂ්පාදනය සම්බන්ධ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10	කුෂන් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11	මෙට්ට නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13	රබර් මුද්‍රා/ අංක තහඩු හෝ නාම පුවරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14	සපත්තු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15	පපඩම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16	බීඩි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17	මෝටර් රථ පින්තාරු කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
18	ගමන් මළු/ජර්කීන්/වැහි කබා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19	කුලියට ඇඳුම් මැසීමේ ස්ථානයක් (ටේලර් සාප්පුවක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20	රබර් මැෂින්/ දුම් ගෙයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21	වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23	ඇඟළුම් ආම්පන්න නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24	බැනර් ඇඳීමේ/ස්ටිකර් නිෂ්පාදනය/ස්ක්‍රීන් ප්‍රින්ටින් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25	ලෝහ වර්ග උණු කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26	ස්ප්‍රිතු හා තෙල් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27	ලියුම් කවර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28	ටී.වී ඇන්ටනා විදුලි පරිපථ සැදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29	විසිතුරු භාණ්ඩ ,සෙල්ලම් බඩු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30	පොත්, ලිපි ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන,හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම,1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152(1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3190 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 152 වැනි උපවගන්තිය යටතේ හොරණ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර,එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2025 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 තීරුවෙහි නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවෙහි අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට මම තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

I වන තීරුව	*II වන තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර 2024 වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
1. රු.6,000 නොඉක්මවන අවස්ථාවක	අය කිරීමක් නැත
2. රු.6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට	90 0
3. රු.12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට	180 0
4. රු.18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට	360 0
5. රු.75,000 ඉක්මවන නමුත් 150,000 නොඉක්මවන විට	1,200 0
6. රු.150,000 ඉක්මවන විට	3,000 0

12-194/5

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන, හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 153(1) වගන්තිය ප්‍රකාරව, හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3191 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 153(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(*අ*) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(*ආ*) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ

(*ඇ*) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය දහයට එක (10 : 1) ට වඩා අඩු වන්නේ නම් එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක් (1%) වාර්ෂික බද්දක් පනවා අයකළ යුතු බවට මම තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශිය සභාවේ දී ය.

12-194/6

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන, හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම,1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 147 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට සිදු විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3192 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාර හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට මම තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශිය සභාවේ දී ය.

උපලේඛනය

I වන තීරුව	*II වන තීරුව*
I. මොටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	රු. 25.00
II. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු. 18.00
(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු. 4.00

I වන තීරුව	*II වන තීරුව*
III. සෑම කරත්තයක් සඳහා	රු. 20.00
IV. සෑම අත් කරත්තයක් සඳහා	රු. 10.00
V. සෑම රික්ෂෝවක් සඳහා	රු. 7.50
VI. සෑම අශ්වයකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	රු. 15.00
VII. සෑම ඇතෙකු සඳහා	රු. 50.00

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-194/7

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 154(1) වගන්තිය ප්‍රකාරව යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු, තැරව්කරුවෙකු හෝ ඔහුගේ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අනුකූලව ඉඩම විකිණීම මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3193 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 154(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු, තැරව්කරුවෙකු හෝ ඔහුගේ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%ට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ ඔහුගේ අනු නියෝජිතයා විසින් 2025 වර්ෂය සඳහා ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

12-194/8

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ආදාළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම හොරණ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති , 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ

කියවිය යුතු 122(1) වැනි වගන්තියෙන් මා හට පැවරී ඇති බලතල අනුව එම පනතේ 126(XXX) වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015/12/28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV අ කොටසේ පළ කරන ලද්දා වූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අය කිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3194 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව (රුපියල්)*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250.00	350.00	500.00
		3ට වැඩි	3ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1,000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1,000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750.00	850.00	1,000.00
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.500.00 බැගින්		

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කුලී ගමන් යාම වෙනුවෙන් ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථාන සඳහා අවසරපත්‍ර ලබාදීම මත ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය,කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්,ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 122(1) වගන්තියෙන් පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015/12/28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV අ කොටසේ පළ කරන ලද්දා වූ ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ මෙහි පහත I උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි 6.00 පැය සිට 20.00 පැය දක්වා කුලී ගමන් සඳහා ත්‍රී රෝද රථ නවතා තබන සෑම තැනැත්තෙකු මතම මෙහි II උපලේඛනයේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3195 යටතේ මම තීරණය කරමි.

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

I උපලේඛනය

	ස්ථානය	*එකවර නවතා තැබියහැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව*
1	කනන්විල - ආදර්ශ හංදිය	4
2	කුළුපන හංදිය - බටුවිට පාර	4
3	පොකුණුවිට හංදිය - වැලිකල පාර	7
4	හේනගම (ජනසෙත හංදිය)	3
5	පෙරෙංගියාවල හංදිය - උඩුව පාර	5
6	පුහුවල හංදිය - මිල්ලෑව පාර	5
7	වගවත්ත ටයර් කම්හල ඉදිරිපිට	3
8	අරුණගම හංදිය	3
9	වගවත්ත හංදිය - වගවත්ත පාර	5
10	මිදෙල්ලමුලහේන- ප්‍රධාන පාර	3
11	පෝරුවදණ්ඩ හංදිය - හඳපාන්ගොඩ පාර	5
12	කුඹුක - කදුරුඇන්ද පාර හංදිය	3
13	කුඹුක හංදිය - ගැලනිගම පාර	6
14	වීදියගොඩ හංදිය - ගෝනපල පාර	6
15	ඔලබොඩුව හංදිය - තලගල පාර	4
16	බටුවිට හංදිය- බටුවිට පාර	3
17	ඔලබොඩුව - වත්තේකඩේ හංදිය	2
18	තලගල හංදිය - ගෝනපල පාර	6
19	ගොඩපරගස් හංදිය - පුහුවල පාර	1
20	මාරගස්හේන හංදිය - ප්‍රධාන පාර	4
21	තලගල පාසල අසල	2

	ස්ථානය	*එකවර නවතා තැබියහැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව*
22	ඔලබොඩුව පාසල අසල	2
23	තල්ගහවිල සව්ගස් හංදිය පාර	3
24	කහටපිටිය වස්කඩුව වත්ත පාර	2
25	ඔලබොඩුව - මහවත්ත හංදිය	2
26	මහ උඩුව හංදිය - පෙරෙංගියාවල පාර	2
27	හඳපාන්ගොඩ හංදිය - පෝරුවදණ්ඩ පාර	5
28	මාපුටුගල හංදිය - ප්‍රධාන පාර	6
29	ගුරුගොඩ හංදිය - ප්‍රධාන පාර	5
30	ගෝනපල හංදිය - ප්‍රධාන පාර	3
31	කෝරලඉම -කොළඹ පාර	5
32	හොරගස් හංදිය - ප්‍රධාන පාර	3
33	මිල්ලෑව - ස්ටෝරුකඩේ හංදිය	4
34	යකහලුව - ප්‍රධාන පාර	2
35	කොටිගම්ගොඩ පාදුක්ක පාර - සමුපකාර ප්‍රාදේශිකය අසල	2
36	තලගල ඩික්සන් මයාගේ නිවස අසල	2
37	ඉංගිරිය -පානදුර පාර කිරිබෝක්කුව අසල	3
38	ඉංගිරිය බෝගස අසල (පානදුර පාර)	4
39	ඉංගිරිය බෝ ගස අසල (පාදුක්ක පාර)	2
40	ඉංගිරිය - පාදුක්ක පාර සමුපකාර මංදිරය ඉදිරිපිට	2
41	ඉංගිරිය -පානදුර පාර ස.තො.ස ඉදිරිපිට	3
42	ඉංගිරිය - රත්නපුර පාර ඉන්ධන පිරවුම්හල අසල	2
43	අරකාවිල - සවුගස්හංදිය පාදුක්ක පාර	3
44	ඉංගිරිය- පාදුක්ක පාර චම්පිකා සිනමා ශාලාව අසල	4
45	ඉංගිරිය -රෝහල අසල දොඹගස්කන්ද පාර	3
46	නම්බපාන හංදිය - ප්‍රධාන පාර	3
47	කඹැල්ලගොඩ හංදිය - කඳන්හේන පාර	3
48	ඉලිඹ හංදිය - තොටුපල පාර	5
49	බොරළුගොඩ - නිසලගිරි උයන පාර	3
50	බොරළුගොඩ - කර්මාන්තපුරය අසල	5
51	බොරළුගොඩ - කැකුලලියපාර	3
52	ගනේතැන්න හංදිය	2
53	කුඹුක පංසල හංදිය - ගැලනිගම පාර	3
54	කෝරලඉම - තේවත්ත පාර	3
55	කෝරලඉම- සිල්ව වැලිවත්ත පාර	3
56	මොරගහහේන - පොලීසිය පාර	5
57	මිරිස්වත්ත හංදිය	2
58	උඩුව - තක්ෂිලා සෙවන	3
59	කහටපිටිය - නාගස් හංදිය	3
60	කහටපිටිය-වෙලේකඩේ හංදිය	3
61	තලගල - මංගලාරාමය පංසල අසල	3
62	මොරගහහේන - පාසල ඉදිරිපිට	3
63	කුඹුක- වලව්ව වත්ත පාර	2
64	ඔලබොඩුව - ජාතික තරුණසේවා මාවත	1
65	ඉංගිරිය - සතිපොල අසල (මෛත්‍රී මාවත)	6
66	ඉංගිරිය - අක්කර 20 පාර	3
67	ඉංගිරිය - පරණ බස්නැවතුම්පල තුළ	5

	ස්ථානය	*එකවර නවතා තැබියහැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව*
68	කොටිගලහංදිය - කුරණ පාර	5
69	ඉංගිරිය - රයිගම්වත්ත බෝධිය අසල	15
70	ඉංගිරිය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල	2
71	අරකවිල - පොල්ගස්හංදියපාර	3
72	අරකවිල - කොස්හේන හංදිය පාර	5
73	ඉංගිරිය- පානදුර පාර (පොලිසිය අසල)	2
74	නම්බපාන- වෝටර්ලුවත්ත අතුරු පාර	3
75	මැද උෆරුගල - අතුරු මාර්ගය	4
76	පහල උෆරුගල - නයිපෙනය අසල	3
77	ඉංගිරිය - බණ්ඩාරනායක පාර පිවිසුම අසල	4
78	ඉංගිරිය - බෝධිනාගල යහලවත්ත පාර	6
79	ඉංගිරිය - රයිගම්වත්ත පහල ගේට්ටුව අසල	4
80	මහ ඉංගිරිය- නාච්චිමලය පාර	6
81	කිරිගල - පාසල අසල	4
82	ඉංගිරිය - ඉමගිර මංසන්දිය පාසල් මාවත	3
83	ඉංගිරිය - ඉසුරුපුරපාර	2
84	පෝරුවදණ්ඩ - බවුන්ඩර පාර හංදිය	2
85	රත්මල්ගොඩ- මැද ගේට්ටුවපාර අසල හංදිය	2
86	කිරිගල - පරණපොළ අසල	2
87	ඇදුරුගල - ඉන්ධන පිරවුම්හල අසල	2
88	මොරගහහේන හංදිය	15
89	මොරගහහේන - බස්නැවතුම්පල හංදිය	3
90	ඉංගිරිය - ශාන්ත පීතර ජනපදය පිවිසුම් මාර්ගය අසල	5
91	ඉංගිරිය පල්ලිය අසල - නව ගම්මානයට පිවිසුම් මාර්ගය	5
92	කුඹුක පාසල අසල - කොටුපත්ගොඩ පාර	5
93	ඔලබොඩුව - වස්කඩුව වත්ත පාර	3

II. උපලේඛනය

2025 වර්ෂය සඳහා එකවර බලපත්‍ර ලබා ගන්නා අවස්ථාවක	*මාස 06 ක කාලයක් සඳහා බලපත්‍රය ලබා ගන්නා අවස්ථාවක*
රු. 1,000.00	රු. 600.00

12-194/10

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාරික ස්ථානවලින් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගාස්තු අයකිරීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය,කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 122 (1) වගන්තියෙන් පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2011 ජූලි මස

05 දින අංක 1713/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (ඇ) කොටසේ පළකරන ලද්දා වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ බස්නාහිර පළාත් සභාවේ 2007 අංක 01 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තිය අනුව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ ව්‍යාපාරික ස්ථානවලින් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා 2025 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි මාසික ගාස්තුවක් පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3196 යටතේ මම තීරණය කරමි.එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

	ප්‍රමාණය	*මුදල (රු.)*
කි.ග්‍රෑ 5-10	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	500.00
කි.ග්‍රෑ 10-15	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	600.00
කි.ග්‍රෑ 15-20	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	750.00
කි.ග්‍රෑ 20-30	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	1,000.00
කි.ග්‍රෑ 30-50	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	1,500.00
කි.ග්‍රෑ 50-100	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	2,000.00
කි.ග්‍රෑ 100-150	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	3,000.00
කි.ග්‍රෑ 150-200	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	4,000.00
කි.ග්‍රෑ 200-300	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	6,000.00
කි.ග්‍රෑ 300-500	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	7,500.00
කි.ග්‍රෑ 500ට වැඩි	ප්‍රමාණයක් දිනකට ඉවත් කරන ආයතන සඳහා මසකට	10,000.00

මෙම ගාස්තුවලට රජයේ බදු එකතු වන බවද තවදුරටත් නිවේදනය කරමි.

12-194/11

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ප්‍රධාන මාර්ගයන් දෙපස පිටතින් ද්‍රව්‍ය රැගෙනවිත් තාවකාලිකව වෙළඳාමේ යෙදීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය,කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 122 (1) වගන්තියෙන් පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015/12/28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV අ කොටසේ පළ කරන ලද්දා වූ *සංචාරක වෙළඳාම සම්බන්ධ* අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි මාර්ග දෙපස පිටතින් ද්‍රව්‍ය රැගෙන විත් තාවකාලික වෙළඳාමේ යෙදෙන සෑම තැනැත්තෙකු මතම එම වෙළඳාමේ යෙදෙන එක් දිනක් සඳහා මෙහි I උපලේඛනයේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3197 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

I උපලේඛනය

වෙළඳාම සඳහා භාවිතා කරන බිම් ප්‍රමාණය	*ගෙවිය යුතු ගාස්තුව රු. ශත*
වර්ග අඩි 10 නොඉක්මවන අවස්ථාවක	30 .00
වර්ග අඩි 10 ඉක්මවන නමුත් වර්ග අඩි 100 නොඉක්මවන විට	50 .00
වර්ග අඩි 100 ඉක්මවන විට	100 .00

12-194/12

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ආදාහනාගාර සේවා සැපයීම පිළිබඳ ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 122 (1) වගන්තියෙන් පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015/12/28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV අ කොටසේ පළ කරන ලද්දා වූ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභාවට අයත් සෑම ආදහනාගාරයකම මෘත ශරීර ආදාහනය කිරීම වෙනුවෙන් මෙහි පහත 01 උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3198 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*මෘත ශරීරය තැන්පත් කර ඇති ස්ථානය*	*ගාස්තුව*
01	හොරණ ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය තුළ	රු.10,000.00
02	හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නොවන	රු.12,000.00

12-194/13

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ක්‍රීඩා භූමි කුලියට දීම සම්බන්ධව ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී.ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 122(1) වගන්තියෙන් පැවරී ඇති අතුරු

ව්‍යවස්ථා සෑදීමේ බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015/12/28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV අ කොටසේ පළ කරන ලද්දා වූ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා භූමි පරිහරණය කිරීම වෙනුවෙන් මෙහි පහත I උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3199 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

I. උපලේඛනය

අනු. අංකය	*භාවිතය*	*දිනකට අයකරන මුදල*	*ආපසු ගෙවන තැන්පත් මුදල*
01	ක්‍රීඩා කටයුතු සඳහා	රු.3,000.00	-
02	වෙනත් කටයුතු සඳහා	රු.5,000.00	රු.15,000.00

12-194/14

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට අදාළ සේවා සැපයීම සඳහා ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්,ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 122 (1) වගන්තියෙන් පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015/12/28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV අ කොටසේ පළ කරන ලද්දා වූ සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත I උපලේඛනයේ සඳහන් පරිදි සේවා සැපයීම වෙනුවෙන් එම උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3200 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

I. උපලේඛනය

අනු. අංකය	*සපයනු ලබන සේවාව*	*සේවාව සඳහා අයකරනු ලබන ගාස්තු*	*ඉල්ලුම්පත් සඳහා අයකරනු ලබන මුදල*
01	වීථිරේඛා සහ නොපරවා ගැනීමේ සහතික නිකුත් කිරීම.	රු.500.00	-
02	වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික නිකුත් කිරීම.	රු.100.00	-

අනු. අංකය	*සපයනු ලබන සේවාව*	*සේවාව සඳහා අයකරනු ලබන ගාස්තු*	*ඉල්ලුම්පත් සඳහා අයකරනු ලබන මුදල*
03	වරිපනම් ලේඛනවල උදෘත සනාථ කරන සහතික නිකුත් කිරීම.	රු.100.00	-
04	නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික නිකුත් කිරීම	රු.100.00	-
05	සභාව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සඳහා ඇතුළත්වීමේ ඉල්ලුම්පත් නිකුත් කිරීම.	—	-
06	සභාව විසින් පවත්වාගෙන යන පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත් නිකුත් කිරීම.	රු.100.00	රු.10.00
07	**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම.**		
	ඉල්ලුම් පත්‍ර i	-	රු.1,000.00
	ඉල්ලුම් පත්‍ර ii		රු.1,500.00
	ඉල්ලුම් පත්‍ර iii		රු.2,000.00
08	ඉඩම් අනුමත සැලසුම් පිටපත් නිකුත් කිරීම. (එක් පිටපතක් සඳහා)	රු.250.00	-
09	ඉඩම් අනුමත කිරීමේ බලපත්‍ර පිටපත් නිකුත් කිරීම (එක් පිටපතක් සඳහා)	රු.250.00	-
10	නිවාස සැලසුම් අනුමත පිටපත් නිකුත් කිරීම (එක් පිටපතක් සඳහා)	රු.500.00	-
11	සභාව විසින් නිකුත් කරන ලද වෙනත් ලියකියවිලිවල සහතික පිටපත් නිකුත් කිරීම (එක් පිටපතක් සඳහා)	රු.250.00	-

12-194/15

හොරණ ප්‍රාදේශීය සභාව

සේවා සැපයීම සඳහා වාහන කුලියට දීමේ ගාස්තු - 2025 වර්ෂය

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය,කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්,ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභාවට අයත් වාහන සහ යන්ත්‍ර එම සේවාවන් සැපයීම වෙනුවෙන් කුලියට දීමේදී පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3201 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශිය සභාවේ දී ය.

I උපලේඛනය

අනු. අංකය	*වාහනය/යන්ත්‍රය*	*එක් සේවාවක් සඳහා ගාස්තුව*	*පැයක් සඳහා ගාස්තුව*	*පැය අටක් සඳහා (එක් දිනයක් සඳහා ගාස්තුව)*
01	ගලි බවුසරය	හොරණ ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය තුළ - රු.14,000.00	-	-
		හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නොවන ප්‍රදේශයන් සඳහා - රු.14,000.00	-	-
		මීට අමතරව එක් කිලෝමීටරයක් සඳහා ප්‍රවාහන ගාස්තුව - රු.300.00	-	-

අනු. අංකය	*වාහනය/යන්ත්‍රය*	*එක් සේවාවක් සඳහා ගාස්තුව*	*පැයක් සඳහා ගාස්තුව*	*පැය අටක් සඳහා (එක් දිනයක් සඳහා ගාස්තුව)*
02	බැකෝ ලෝඩර් යන්ත්‍රය	-	රු.4,314.33	රු.34,514.64
03	මෝට්(ර්) ග්‍රේඩරය (120hp)	-	රු.5,721.95	රු.45,775.60
04	මාර්ග තලනය (Smooth 8-10 tons) Static	-	රු.2,447.48	රු.19,579.84
05	මාර්ග තලනය (Vibrating Roller) 10 tons	-	රු.4,476.33	රු.35,810.64
06	මාර්ග තලනය (Vibrating Roller) 1/2 - 1tons	-	රු.1,137.53	රු.9,100.24
07	චතුර බවුසරය (6000 L)	-	රු.2,882.26	රු.23,058.08
08	ට්‍රැක්ටරය සහ ට්ලරය (3 tons)	-	රු.1,335.61	රු.10,684.88

12-194/16

හොරණ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා රංග ශාලාව කුලියට දීම සම්බන්ධව ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. ජී. ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභාව විසින් පරිපාලන කටයුතු සිදු කරනු ලබන ඉංගිරිය රංග ශාලාව බාහිර පාර්ශ්වයන් වෙත වෙන්කර දීමේදී හොරණ ප්‍රාදේශීය සභාව වෙත පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3202 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශිය සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*අය කිරීමට නියමිත මුදල (රු.)*
01	**දර්ශන සඳහා**	
	I. දර්ශන සඳහා වෙන් කිරීමට එක් එක් වාරයක් සඳහා	15,000.00
	II. දර්ශන සඳහා වෙන් කිරීමට වාර 2ක් සඳහා	25,000.00

අනු. අංකය	*විස්තරය*	*අය කිරීමට නියමිත මුදල (රු.)*
	III. ප්‍රදේශයේ පාසල් උත්සව වෙනුවෙන් එක් දර්ශන වාරයක් සඳහා (ඉහත I, II සහ III සඳහා ශාලාවේ ශබ්දවාහිනී පද්ධතිය හා විදුලි ආලෝක පද්ධතිය ආදාළ නොවේ)	7,500.00
02	ඕනෑම කටයුත්තක් සඳහා රංග ශාලාවේ විදුලිය භාවිතා කරන්නේනම් ඒ සඳහා විදුලි ගාස්තුව ලෙස (පැය 1ක් සඳහා)	400.00
03	පොල්තෙල් පහන භාවිතා කරන්නේනම් ඒ සඳහා ගාස්තු (දිනකට)	500.00
04	පුහුණු වැඩසටහන් සඳහා	
	I. පැය 04 කට	7,500.00
	II. පැය 08 කට	10,000.00
05	පෙර පාසල් උත්සව සඳහා	
	I. එක් දිනක් සඳහා වෙන් කිරීම	10,000.00
	II. උත්සවයට පෙර පුහුණු කටයුතු වෙනුවෙන් වෙන් කර ගැනීමට (පැය 06 ක් සඳහා)	2,500.00
	III. ඊට වැඩිවන සෑම පැයක් සඳහාම	250.00
06	සියලු වෙන් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන තැන්පත් ගාස්තුව (පෙර පුහුණු සඳහා වෙන්කිරීම් හැර)	15,000.00

12-194/17

හොරණ ප්‍රාදේශීය සභාව

ඉංගිරිය කායවර්ධන මධ්‍යස්ථානය ක්‍රීඩා හා ව්‍යායාම කටයුතු සඳහා ලබා දීම වෙනුවෙන් ගාස්තු පැනවීම - 2025 වර්ෂය

හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය,කර්තව්‍ය ඉටුකරන හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම්,ඩී.ජී.ප්‍රසන්න සිරිසේන වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභාව විසින් පරිපාලන කටයුතු සිදු කරනු ලබන ඉංගිරිය කායවර්ධන මධ්‍යස්ථානය ක්‍රීඩා හා ව්‍යායාම කටයුතු සඳහා ලබා දීම වෙනුවෙන් හොරණ ප්‍රාදේශීය සභාව වෙත පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2025 වර්ෂයට පනවා අයකිරීමට 2024.11.19 දින තීරණ අංක 2024/11/19/3203 යටතේ මම තීරණය කරමි. එනම්,

ඩී. ජී. ප්‍රසන්න සිරිසේන,
ලේකම් හා හොරණ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 19 වැනි දින,
හොරණ ප්‍රාදේශිය සභාවේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*අයකරනු ලබන සාමාජික මුදල*	*වැඩිහිටියන් සඳහා*	*පාසල් ළමුන් සඳහා*
01	මාසිකව අය කරන මුදල	රු. 1,500.00	රු. 1,000.00
02	මාස 06ක් සඳහා එකවර ගෙවීමේදී අය කරන මුදල	රු. 6,000.00	රු. 4,000.00

12-194/18

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම - 2025

252 අධිකාරය මහා නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥා පනතේ 230 (1) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට වරිපනම් බදු පනවා අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන, නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම 252 වන අධිකාරය වන මහානගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥා පනතේ 230 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

වරිපනම් බදු පැනවීම හා අය කිරීම - 2025

දේපළ ස්වභාවය	*වාර්ෂික වටිනාකමෙන් අය කරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය*
වෙළඳ හෝ වාණිජ කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන සඳහා	30%
වෙළෙඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන සඳහා (මුඩු ඉඩම් හා හිස් ඉඩම් ද ඇතුළුව)	6%

2025 වර්ෂය වෙනුවෙන් පනවනු ලබන වරිපනම් බදු මුදල් පිළිවෙලින් 2025 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වන දිනයන්හි දී හෝ ඊට පෙර සමාන වාරික හතරකින් හෝ සම්පූර්ණයෙන් හෝ ගෙවිය යුතු බවත්, ගෙවීම් අවසාන වන දිනය සෙනසුරාදා ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයන් වන්නේ නම් ඊට පෙර ඇති කාර්යාලීය වැඩ කරන දිනය ඒ ඒ කාර්තු සඳහා වාරික ගෙවිය යුතු අවසන් දිනය ලෙසත් සැලකිය යුතුය.

සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා දෙහිවල ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ වරිපනම් කවුළුවලට පැමිණ අත්පිට මුදලින්,චෙක්පත් මඟින් හෝ බැංකු කාඩ්පත් මඟින් ගෙවීම් කළ හැකි අතර www.dmmc.lk. වෙබ් අඩවියට පිවිසීමෙන් මාර්ගගත (ඔන්ලයින්) ක්‍රමවේදය ඔස්සේද ගෙවීම් කළ හැකිය.

නියමිත දිනට ප්‍රථම වරිපනම් බදු ගෙවීමේදී වට්ටම් හිමි වන ආකාරය හා ගෙවීම් ප්‍රමාද වන කාලය සඳහා දඩ මුදල් (වරෙන්තු) අය කරන ආකාරය පහත වගුවෙන් නිරූපනය වේ.

- 2025 වර්ෂයට අදාළ වරිපනම් දැන්වීම් 2024 දෙසැම්බර් මාසය අවසාන වීමට ප්‍රථම දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් අදාළ දේපළ හිමියන් වෙත අදාළ පරිශ්‍රයටම ලැබීමට සලස්වන අතර එසේ නොලැබුණු දේපළහිමියන් විසින් එම දැන්වීම අප කාර්යාලයේ තක්සේරු අංශයට පැමිණ ලබා ගැනීමට ක්‍රියා කළ යුතු ය. දේපළ හිමියන් විසින් වරිපනම් දැන්වීම් නොලැබීම යන කරුණ මත පනවනු ලබන වරෙන්තු ගාස්තු ඉවත් කිරීමට සිදුකරනු ලබන ඉල්ලීම් ඉටු කළ නොහැකි බව ද දැනුම් දෙමි.

කාර්තුව	*මහා නගර සභා ආඥා පනතේ 230 (4) වෙනි වගන්තිය ප්‍රකාරව වට්ටම*		*මහා නගර සභා ආඥා පනතේ 255 වෙනි වගන්තිය ප්‍රකාරව වරෙන්තු ගාස්තුව*		
	මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බදු එකවර ගෙවන විට 10% වට්ටම	*කාර්තු වශයෙන් ගෙවන්නේ නම්, අදාළ කාර්තුවේ මුල් මාසය තුළ හෝ ඊට පෙර මුදල් ගෙවන විට 5% වට්ටම*	*නියමිත කාර්තුව ඇතුළත ගෙවිය යුතු වරිපනම් බදු නොගෙවන දේපළ සඳහා පහත පරිදි වරෙන්තු ගාස්තුවක් අයකරනු ලැබේ.*		
			කාර්තුව අවසන්වන දිනය	*වෙළඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිතා කරන දේපළ, මුඩු ඉඩම් හා හිස් ඉඩම්*	*වෙළඳ හෝ වාණිජ කාර්යයන් සඳහා භාවිතා කරන දේපළ*
පළමු කාර්තුව (ජනවාරි 01-මාර්තු 31)	2025 ජනවාරි 31 දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතුය	2025 ජනවාරි 31 හෝ ඊට පෙර ගෙවිය යුතුය	2025 මාර්තු 31	15%	20%
දෙවන කාර්තුව (අප්‍රේල් 01-ජුනි 30)		2025 අප්‍රේල් 30 හෝ ඊට පෙර ගෙවිය යුතුය	2025 ජුනි 30	15%	20%
තුන්වන කාර්තුව (ජූලි 01- සැප්තැම්බර් 30)		2025 ජූලි 31 හෝ ඊට පෙර ගෙවිය යුතුය	2025 සැප්තැම්බර් 30	15%	20%
හතර වන කාර්තුව (ඔක්තෝබර් 01- දෙසැම්බර් 31)		2025 ඔක්තෝබර් 31 හෝ ඊට පෙර ගෙවිය යුතුය	2025 දෙසැම්බර් 31	15%	20%

12-193/1

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු අයකිරීම - 2025

252 අධිකාරය මහා නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු අයකිරීම 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන, නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම 252 වන අධිකාරය වන මහානගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු අයකිරීම නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

වාර්ෂික වටිනාකම (රු.)	*වෙළෙඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන, මුඩු ඉඩම් හා හිස් ඉඩම් සඳහා ගාස්තු (රු.)*	*වෙළෙඳ හෝ වාණිජ කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන සඳහා ගාස්තු (රු.)*
50,000 දක්වා	1,250 0	2,000 0
50,001 සිට 250,000 දක්වා	1,500 0	2,500 0
250,001 සිට 500,000 දක්වා	2,000 0	3,500 0
500,001 සිට 1,000,000 දක්වා	3,000 0	5,500 0
1,000,000 ට වැඩි	4,500 0	8,500 0

★ ඉහත වගුවේ සඳහන් සේවාවන් වෙනුවෙන් අය කරනු ලබන සියළුම ගාස්තු සඳහා රජය විසින් කලින් කලට පනවනු ලබන ව්‍යාවස්ථාපිත බදු අය කරනු ලැබේ.

වරිපනම් බදු ගෙවීම් සාරාංශ වාර්තාවන් (ගෙවීම් ඉතිහාස වාර්තාවක්) නිකුත් කිරීම සඳහා ගාස්තු අයකිරීම

වරිපනම් බදු සම්බන්ධව ආයතනික පරිසණක දත්ත පද්ධතියෙන් ලබාදෙන වාර්තා සඳහා පිටුවකට රු.500.0 ක මුදලක් බැගින් අය කරනු ලැබේ. පූර්ව වර්ෂ 06 ක් දක්වා පමණක් වරිපනම් බදු ගෙවීම් සාරාංශ නිකුත් කරනු ලැබේ.

12-193/2

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

අයිතිකරුවන්ගේ නම් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අය කිරීම - 2025

252 අධිකාරය මහා නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව සහ 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ යොදා ඇති ව්‍යවස්ථා කොටසේ 4 වන වගන්තියෙන් ලැබී ඇති බලතල අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා අයිතිකරුවන්ගේ නම් ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු අය කිරීම 2025 වර්ෂයට 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන, නාගරික කොමසාරිස් එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම මහා නගර සභා ආඥා පනතේ 286 (අ) වගන්ති ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඇති ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් පහත සඳහන් ගාස්තු 2025 වර්ෂයේ දී පනවා අයකිරීම 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ යොදා ඇති අතර ව්‍යවස්ථා කොටසේ 4 වන වගන්තියෙන් ලැබී ඇති බලතල අනුව 2025.01.01 දින සිට ගාස්තු අය කිරීමට මම තීරණය කරමි.

අනු. අංකය	විස්තරය		ලියාපංදිචි ගාස්තුව(රු.)
01.	ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් (එක්දේපළ කට,එක් වරිපනම් අංකයක් සඳහා එක් අවස්ථාවක් වෙනුවෙන්)ලියාපදිංචි කිරීම වෙනුවෙන්		3,000
02	ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන් නව වරිපනම් අංක ඉල්ලුම් කිරීමේදී එක් අංකයක් සඳහා		1500 බැගින්
03.	පදිංචිකරු ලෙස නම ඇතුළත් කිරීම සඳහා		500
04.	i. උධෘත නිකුත් කිරීම සඳහා පූර්ව වර්ෂයකට ii. උධෘත නිකුත් කිරීම සඳහා පවතින වර්ෂයකට හිමිකම් සහතික නිකුත් කිරීමේ පදනම මත ගාස්තු පනවා අය කිරීම.*		200 බැගින් ⋆ සටහන් අංක 08 මගින් ඉදිරිපත් කර ඇත.
05.	අතිරේක තක්සේරු දැන්වීම් සඳහා එක් අංකයක් සඳහා		100 බැගින්
06.	ඔප්පු සාරාංශ පිටපතක් සඳහා (AT Forms)		500
07.	දේපළවල ස්වභාවය වෙනස් වීම හා ගැටළු විසඳීම සඳහා එක් අංකයකට		1500 බැගින්
08. ⋆	හිමිකම් සහතික ලබා ගැනීම සඳහා පහත සඳහන් පරිදි ගාස්තු පනවා අය කිරීම		ගාස්තු (රු)
	වාර්ෂික වටිනාකම මත	වෙළෙඳ හෝ වාණිජ නොවන කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන, මුඩු ඉඩම් සඳහා ගාස්තු (රු.)	වෙළෙඳ හෝ වාණිජ කාර්යයන් සඳහා භාවිත කරනු ලබන ස්ථාන සඳහා ගාස්තු (රු.)
	50,000 දක්වා	1,250	2,000
	50,001 සිට 250,000	1,500	2,500
	250,001 සිට 500,000	2,000	3,500
	500,001 සිට 1,000,000	3,000	5,500
	1,000,000 ට වැඩි	4,500	8,500
09	එක් දින සේවාව ලබා දීමේ ගාස්තුව එක් සේවාවකට ගාස්තුව රු. 15,690/- කි.		
	එක් දින සේවාවෙන් ලබා දෙන සේවා		එක් දින සේවාව සඳහා එක් අවස්ථාවකට ගාස්තුව
	ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් (එක් දේපළකට, එක් අංකයක් සඳහා එක් අවස්ථාවක් වෙනුවෙන්) ලියාපදිංචි කිරීම වෙනුවෙන්		රු. 6,220/-
	ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන් නව වරිපනම් අංක ඉල්ලුම් කිරීමේදී එක් අංකයක් සඳහා		රු. 3,260/-
	දේපළවල ස්වභාවය වෙනස් වීම.		රු. 3,260/-

⋆ ඉහත සඳහන් සේවාවන් වෙනුවෙන් අය කරනු ලබන සියළුම ගාස්තු සඳහා රජය විසින් කලින් කලට පනවනු ලබන ව්‍යවස්ථාපිත බදු මුදල් අයකරනු ලැබේ.

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා අය කිරීම

252 අධිකාරය මහා නගර සභා ආඥා පනතේ 286 (ආ) වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා ගාස්තු පනවා 2025 වර්ෂයට අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥා පනතේ 247 ඈ වගන්තියේ (1) උපවගන්තිය අනුව මහා නගර සභා බලතල ප්‍රකාරව, දෙහිවල ගල්කිස්ස මහා නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සුදුසු වන විටක හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ සභාවේ මතය අනුව යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක,

(අ) ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) ඒ ඉඩමෙන් ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය යෝජනා සම්මතයක් මඟින් සභාව විසින් නියම කරනු ලැබූ නියමිත අනුපාතයට වඩා අඩුනම් හෝ

(ඇ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩම් භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම බිංදුවයි එකක් (0.01%) ක වාර්ෂික බද්දක් පැනවීම.

252 අධිකාරය යටතේ මහා නගර සභා ආඥාපනතේ 247ඉ වගන්තියේ (01) උප වගන්තිය අනුව මහ නගර සභා බලතල ප්‍රකාරව, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් විකිණීමේ දී 2025 වර්ෂය සඳහා ගාස්තු පැනවීම.

මහා නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර් කෙනකු විසින් හෝ ඔහුගේ සේවකයකු විසින් නැතහොත් අනුයෝජිතයකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ *නැනහොත්* වෙනත් ආකාරයකින් විකුණනු ලැබුව හොත් විකිණීමෙන් ලැබුණු මුදලින් 1% කට සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ විසින් එසේ ඒ ඉඩම විකුණා ලත් මුදලින්, සභාවට ගෙවිය යුතුය.

12-193/4

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2025 වර්ෂය සඳහා වාහන ගාල්කිරීමේ ගාස්තුව

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශයේ 2025 වර්ෂය සඳහා වාහන ගාල්කිරීමේ ගාස්තු පනවා අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක ඉටු කරන, නාගරික කොමසාරිස් එම්.එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්ති ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2025.01.01 දින සිට වාහන ගාල්කිරීමේ ගාස්තු පනවා අය කිරීමට මම තීරණය කරමි.

252 වැනි අධිකාරය වූ, මහා නගර සභා ආඥාපනතෙන් දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභ සාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍යකරන ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු, මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවටත්, 2025 ජනවාරි මස 01 වැනි දින සිට මෙම සේවා ගාස්තු අය කිරීමටත් මම තීරණය කරමි.

දෙහිවල ගල්කිස්ස මහා නගර සභා සීමාව තුළ පහත සඳහන් ස්ථාන 2025 වර්ෂයේ වාහන නැවතුම්පළ ගාස්තු අය කිරීම සඳහා යොදා ගනු ලැබේ.

1. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව අසල අනගාරික ධර්මපාල මාවතේ දකුණුපස වරිපනම් අංක 146 සහ වරිපනම් අංක 96 අතර, වම් පස වරිපනම් අංක 165 සහ වරිපනම් අංක 95 අතර ඇතුලත්වන ප්‍රදේශයට අයත් මාර්ගය දෙපස

2. මුහුදුබඩ මාර්ගය (Marine Drive) - වැල්ලවත්ත පාළම අසල සිට ෆෙසර් මාවත දක්වා

3. රත්මලාන පොදු වෙළඳසැල ඉදිරිපිට

4. නුගේගොඩ හයිලෙවල් පාරේ ගුවන් පාලම යට

5. දෙහිවල මංසන්ධියේ ගුවන් පාලම යට

6. දකුණු කොළඹ ශීක්ෂණ රෝහල (කළුබෝවිල මහ රෝහල) අසල දකුණු මායිමේ පිහිටි සුනන්දාරාම පාරේ රෝහල් සීමාවට යාබදව

වාහන ගාල් කිරීමේ මිළ ගණන්

පැය ගණන / වාහන වර්ගය	1 දක්වා (රු.)	2 දක්වා (රු.)	3 දක්වා (රු.)	4 දක්වා (රු.)	5 දක්වා (රු.)	6 දක්වා (රු.)	7 දක්වා (රු.)	8 දක්වා (රු.)	9 දක්වා (රු.)	10 දක්වා (රු.)
යතුරු පැදිය	20	40	60	80	100	120	140	160	180	200
ත්‍රීරෝදරථය	40	80	120	160	200	240	280	320	360	400
කාර් /වෑන්	70	140	210	280	350	420	490	560	630	700
බස් /ලොරි	100	200	300	400	500	600	700	800	900	1000

විවිධ වර්ගයේ බලපත්‍ර නිකුත් කිරීමේ වාර්ෂික ගාස්තු

	විස්තරය	*ගාස්තුව (රු.)*
1	වෙන්දේසි /බ්‍රෝකර් බලපත්‍රයක් සඳහා	10,000
2	සංචාරක වෙළඳ බලපත්‍රයක් සඳහා	5,000
3	දේපළ උකස්කරයක් ලියාපදිංචි කිරීම සඳහා	1,000
4	සංදර්ශන බලපත්‍රයක් සඳහා	5,000

	විස්තරය	*ගාස්තුව (රු.)*
5	ගෝ ඝාතක බලපත්‍රයක් සඳහා - ගවයෙකු ට	7,500
	එළුවෙකු ට	7,500
6	ප්‍රසිද්ධ රැගුම් බලපත්‍රයක් සඳහා	2,000
7	මුහුදු වෙරළ බලපත්‍ර	1,000
8	ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සඳහා අවසර ලබා දීමේ ගාස්තු	2,000
9	සමාජ ශාලා බලපත්‍ර ගාස්තු	15,000
10	ජංගම වෙළඳාම් රථ මඟින්	5,000
11	ජංගම වෙළඳ බලපත්‍ර අයදුම් පත්‍රයක් සඳහා ගාස්තුව	200
12	උත්සව සමයේදී කෙටි කාලීනව ලබා දෙන ජංගම වෙළඳ බලපත්‍ර ගාස්තුව (දිනකට)	500

★ ඉහත සඳහන් සේවාවන් වෙනුවෙන් අය කරනු ලබන සියළුම ගාස්තු සඳහා රජය විසින් කලින් කලට පනවනු ලබන ව්‍යාවස්ථාපිත බදු අය කරනු ලැබේ.

12-193/5

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳව බදු පනවා අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්ය,කර්තව්‍ය ක්‍රියාත්මක ඉටු කරන,නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම මහා නගර සභා ආඥා පනතේ 245 (1) වගන්ති ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2025.01.01 දින සිට වාහන හා සතුන් පිළිබඳව බදු පනවා අය කිරීමට ගාස්තු මම තීරණය කරමි.

252 වැනි අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 245 (1) වගන්තිය අනුව මහා නගර සභා බලතල ප්‍රකාරව දෙහිවල - ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ තබා ඇති හෝ පාවිච්චි කරනු ලබන්නාවූ සියලු හා සතුන් වෙනුවෙන් මහා නගර සභා ආඥා පනතේ 04 වන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයක වාර්ෂික බද්දක් පනවා 2025.01.01.දින සිට ගාස්තු අය කිරීමට තීරණය කරමි.

(1)

		රු.
1.	මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක් මෝටර් බයිසිකලයක් කරත්තයක් අත් ට්‍රැක්ටරයක් රික්ෂෝවක් බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් ම සඳහා	25
	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා	
(අ)	එය වෙළඳ කටයුතු සඳහා පාවිච්චිකරන්නේ නම්	10
(ආ)	එය වෙළඳ කටයුත්තක් නොවන කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම්	05

(2) රෝදවල විශ්කම්භය අඟල් 26 ට නොවැඩි ළමා වාහන,චිල් බැරැක්ක, හුදෙක් පෞද්ගලික ස්ථාන තුළ පමණක් වෙළඳ කටයුතු සඳහා භාවිතා කරන අත් කරත්තයක් සහ වෙළඳ කටයුතු සඳහා භාවිතා නොකරන අත්කරත්තයක් මෙම ගෙවීම්වලින් නිදහස් වේ.

මේ උපලේඛනයේ වෙළඳ කටයුතු යන යෙදුමට යම් වෙළඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධව විකිණීම සඳහා වුවද අන්‍ය කාර්යයක් සඳහා වුවද යම් භාණ්ඩයක් හෝ බඩු හෝ ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ ගෙන යෑම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-193/6

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2025 වර්ෂය සඳහා පොළ ගාස්තු පැනවීම

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා ආඥා පනතේ 155 වගන්තිය හා උක්ත වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ 267 වගන්තිය ප්‍රකාරව වෙළඳපොළවල් සහ ඉස්තාල, කරත්ත, ගවයන් ආදිය තබා ගැනීම සඳහා, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ සාදනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන ප්‍රකාර රත්මලාන පොදු වෙළඳපොළෙහි වෙළඳාම් කිරීම සඳහා පහත සඳහන් පරිදි දෛනිකව ගාස්තු පනවා අයකිරීමත්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂය සඳහා පොළ ගාස්තු පනවා අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක ඉටු කරන,නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 155 වන වගන්තිය හා උක්ත වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ 267 වගන්තිය ප්‍රකාරව වෙළඳ පොළවල් සහ ඉස්තාල, කරත්ත, ගවයන් ආදිය තබා ගැනීම සඳහා, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ සාදනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන ප්‍රකාර රත්මලාන පොදු වෙළඳ පොළෙහි වෙළඳාම් කිරීම සඳහා පහත සඳහන් පරිදි දෛනික ගාස්තු පැනවීමටත්, එම පැනවූ ගාස්තු අය කිරීම, 2025.01.01 දින සිට පනවා අය කිරීමටත් තීරණය කරමි.

පොළ ගාස්තු දිනකට,

1.	සාප්පු බඩු වෙළඳාම සඳහා	රු. 200 0
2.	මාළු පමණක් වෙළඳාම සඳහා	රු. 200 0
3.	එළවළු ලෑල්ලක් සඳහා	රු. 100 0
4.	පළතුරු පමණක් විකිණීම සඳහා	රු. 100 0
5.	පළා වර්ග පමණක් විකිණීම සඳහා	රු. 50 0
6.	එළවළු පළතුරු පළා වර්ග මිශ්‍ර සිල්ලර බඩු සඳහා	රු. 50 0
7.	ඉහත අයිතම 1කට වඩා වැඩි ගණනක් නම්	රු. 350 0

★ ඉහත සඳහන් සේවාවන් වෙනුවෙන් අය කරනු ලබන සියළුම ගාස්තු සඳහා රජය විසින් කලින් කලට පනවනු ලබන ව්‍යාවස්ථාපිත බදු අය කරනු ලැබේ.

12-193/7

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

2025 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ, මහා නගර සභා ආඥාපනතේ, 247 (අ) (1) වගන්තිය අනුව සහ 247 (අ) (2) වගන්තිය අනුව, එකී ආඥාපනතේ හෝ එකී ආඥාපනත යටතේ සාදන ලද, අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට්* පත්‍රයේ, (IV) (ඇ) කොටසේ, පළාත් පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පනවා අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක ඉටු කරන නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම 252 වැනි අධිකාරය වූ, මහා නගර සභා ආඥාපනතේ, 247(අ) (1) වගන්තිය අනුව සහ 247 (අ) (2) වගන්තිය

අනුව, එකී ආඥා පනතේ හෝ එකී ආඥාපනත යටතේ සාදන ලද, අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ,* (IV) (ඇ) කොටසේ, පළාත් පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා වගන්ති ප්‍රකාරව එම ගාස්තු අය කිරීම,2025.01.01 දින සිට බලපත්‍ර ගාස්තු පනවා අය කිරීමට තීරණය කරමි. ඒ අනුව එවැනි යම් ස්ථානයක වාර්ෂික වටිනාකම මත මෙහි පහත දැක්වෙන පරිදි ගාස්තුව තීරණය කොට පනවා අය කර ගත යුතුය. මෙම ගාස්තු 2025.03.31 ට පෙර ගෙවිය යුතු ය.

I වන තීරය *වාර්ෂික වටිනාකම*	*II වන තීරය* *රු.*
රු.1,500 නොඉක්මවන විට	2,000
රු.1,500 ඉක්මවන නමුත් රු.2,500 නොඉක්මවන විට	3,000
රු.2,500 ඉක්මවන විට	5,000

නිකුත් කරන මාංශ වෙළඳාම සම්බන්ධ විශේෂ බලපත්‍රයක් වෙනුවෙන් ගාස්තුවක් මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට නියමකර අයකර ගැනීමටත් එම ගාස්තුව 2025.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කරමි.

* විශේෂ බලපත්‍ර ලබා ගැනීමේ දී වෙළෙඳ බලපත්‍රය ලබාගැනීමට අවශ්‍ය නොවේ.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

iv. මාංශ වෙළඳාම සඳහා වාර්ෂික විශේෂ බලපත්‍ර ගාස්තු :

	විස්තරය	*විශේෂ බලපත්‍ර ගාස්තු රු. ශත*
i.	සුපිරි වෙළඳ සැල් (Super markets) වල මාංශ වෙළඳාම සඳහා (මාංශ වර්ග ප්‍රදර්ශන ප්‍රදේශය - (Display area) දිග අඩි 10 සහ පළල අඩි 5 හෝ එයට වඩා වැඩි ප්‍රමාණය සඳහා	100,000 0
ii.	සුපිරි වෙළඳසල් (Supermarkets) වල මාංශ වෙළඳාම සඳහා (මාංශ වර්ග ප්‍රදර්ශන ප්‍රදේශය - (Display area) දිග අඩි 10 සහ පළල අඩි 5 ට වඩා අඩු ප්‍රමාණය සඳහා)	75,000 0
iii.	කුඩා ප්‍රමාණයේ සුපිරි වෙළඳසල් (Mini Supermarkets) වල පැකට් කරන ලද මාංශ වර්ග පමණක් වෙළඳාම සඳහා	50,000 0
iv.	ෆාම් ෂොප්වල ශීත කළ හෝ අධි ශීතකළ කුකුළු මස් පමණක් වෙළඳාම සඳහා (එක් වර්ගයක් සඳහා පමණි)	25,000 0
v.	ෆාම් ෂොප්වල ශීත කළ හෝ අධි ශීත කළ කුකුළුමස් දෙවර්ගය පමණක් වෙළඳාම සඳහා	35,000 0
vi.	මාංශ විකුණන වෙනත් ස්ථාන/ කුකුළු/එළ හරක්/එළු/ඌරු මස් වෙළඳාම සඳහා (ඉහත ගාස්තු අදාළ වන්නේ කුකුළු මස් වලට අමතරව මාංශ වර්ග කිහිපයක්, එම අමතර මාංශ වර්ග වලින් දිනකට කිලෝ 5 කට වඩා අඩුව තබා ගැනීමට සහ වෙළඳාම සඳහා සභාවේ ටෙන්ඩර් කඩවල වෙළඳාමට බල පෑමක් නොමැති අවස්ථාවල පමණි.)	75,000 0
vii.	එළුමස් පමණක් වෙළඳාම සඳහා	1,000,000 0
viii.	ඌරුමස් පමණක් වෙළඳාම සඳහා	1,200,000 0
ix.	ගවමස් පමණක් වෙළඳාම සඳහා	2,000,000 0
x.	ජංගම මාංශ වෙළඳාම	50,000 0
xi.	මාළු වෙළඳසැලක් සඳහා	25,000 0
xii.	ජංගම මාළු වෙළඳාම (පාපැදි කඳ)	5,000 0
xiii.	ජංගම මාළු වෙළඳාම (මෝටර් සයිකල්/ ත්‍රී රෝද රථ/ ලොරි)	25,000 0

2025 වර්ෂයේ අලුතින් ආරම්භ කරන මාංශ වෙළඳාම් කරන ස්ථාන සඳහා එම ස්ථානය ආරම්භ කරන ලද දිනයේ සිට 2025.12.31 දක්වා කාර්තු ගණනට බලපත්‍ර ගාස්තු අය කිරීම සැළකිල්ලට ගනු ලැබේ. ඉහත නියමිත පරිදි ගෙවීම් සිදුනොකරන ස්ථාන සඳහා දඩ මුදල් පහත පරිදි වේ.

1. එකවර දඩ මුදල රු. 750 කි.

2. ඊට අමතරව බලපත්‍රයක් නොමැති වෙළඳාම පවත්වාගෙන ගිය සෑම දිනයක් සඳහාම දිනකට රු. 200 බැගින් ගෙවිය යුතු ය.

252 වන අධිකාරය වන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 272(8) (උ) වන වගන්තිය ප්‍රකාරව සහ 252 වන අධිකාරය වන 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 267 වන වගන්තිය අනුව එකී ආඥාපනත යටතේ සාදන ලද අංක 541/17 හා 1989 ජනවාරි 20 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා XX වැනි කොටසේ 40 වන වගන්තිය ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා සීමාව තුළ පණ ඇති සතුන්/සිවුපා සතුන් විකුණන ස්ථාන සඳහා ගාස්තුවක් උපලේඛනයේ සඳහන් ආකාරයට නියමකර අයකර ගැනීමටත් එම ගාස්තුව 2025.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් තීරණය කරමි.

සුරතල් සතුන් අලෙවි කරන ස්ථාන	රු. 50,000 0
සුරතල් මසුන් අලෙවි කිරීම (ස්ථිර ස්ථාන)	රු. 15,000 0
සුරතල් මසුන් අලෙවි කිරීම ජංගම	රු. 5,000 0

12 - 193/17

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

මධ්‍ය පුස්තකාලය හා ශාඛා පුස්තකාලයන්හි 2025 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම්

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (ආ) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා මධ්‍ය පුස්තකාලය හා ශාඛා පුස්තකාලයන් හි 2025 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක ඉටු කරන, නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම, මධ්‍ය පුස්තකාලය හා ශාඛා පුස්තකාලයන් හි 2025 වර්ෂය සඳහා ගාස්තු පනවා 2025.01.01 සිට අය කිරීමට තීරණය කරමි.

1. සාමාජික ගාස්තු :

* බලප්‍රදේශය තුළ ජීවත් වන ස්ථිර පදිංචිකරුවන් සඳහා ග්‍රාම නිලධාරි සහතිකය සහ ඇපකරුවෙක් සහිතව වසර දෙකකට යටත්ව.

සාමාජික ගාස්තුව	රු. 100 0
* බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු නොවන හෝ පිටත පදිංචිකරුවෙකු හෝ විදේශිකයින් සඳහා නැවත නිකුත් කිරීමේ පදනම මත (Refundable Deposit) සාමාජිකත්වය ලබා ගැනීමේ තැන්පතු මුදල	රු. 5,000 0
සාමාජික ගාස්තුව (වසර දෙකකට යටත්ව)	රු. 100 0

2. සාමාජික අලුත් කිරීම

* පාඨකයන් සඳහා අලුත් කිරීමේ ගාස්තුව - වසර දෙකකට යටත්ව වැඩිහිටි සාමාජික අලුත් කිරීම් ගාස්තුව	රු. 100 0
ළමා සාමාජික අලුත් කිරීම් ගාස්තුව	රු. 50 0

3. A4 ප්‍රමාණයේ ඡායා පිටපත් සඳහා ගාස්තු අය කිරීම

* A4 එක් පැත්තක් සඳහා	රු. 6 0
* දෙපැත්තක් සඳහා	රු. 8 0

4. ප්‍රමාද ගාස්තු :

බැහැර දෙන පුස්තකාලය මගින් පාඨකයකු ලබා ගන්නා පොතක් දින දාහතරක කාල සීමාවට යටත් වෙයි. එම කාලය ඉකුත් වීමෙන් අනතුරුව පහත පරිදි ප්‍රමාද ගාස්තු අය කිරීම සිදු කරනු ලැබේ :

	රු. ශත
* දින 01 සිට දින 30 ක් දක්වා එක පොතකට (එක් දිනකට)	3 0
* දින 31 සිට දින 90 ක් දක්වා එක පොතකට	250 0
* දින 91 සිට දින 180 ක් දක්වා එක පොතකට	500 0
* දින 180 කට වැඩි දින සඳහා එක පොතකට	1,000 0

12 - 193/18

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

2025 වර්ෂය සඳහා ජන සෞඛ්‍ය සහ සණ අපද්‍රව්‍ය කළමනාකරණය

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (ආ) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා ජන සෞඛ්‍ය සහ සණ අපද්‍රව්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සේවා වෙනුවෙන් ගාස්තු පනවා 2025 වර්ෂයට අය කිරීම මා විසින් 2024.11.24 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක ඉටු කරන, නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම, ජන සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි 2025 වර්ෂය සඳහා ගාස්තු පනවා 2025.01.01 සිට අය කිරීමට තීරණය කරමි.

i. ගලිබවුසර් සේවාව සඳහා ගාස්තු :

අනු. අංකය	*විස්තරය*	*බවුසර් පරිමාව ලීටර්*	*බල ප්‍රදේශය තුළ (රු.)*	*බල ප්‍රදේශයෙන් පිටත (රු.)*	*ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩල ගාස්තු*
01	නිවාස	3000 L 4000 L	4,.000 4,500	6,500 7,500	ලීටර් 1000 සඳහා රු. 650/- බැගින්
02	නිවාස නොවන	3000 L 4000 L	5,000 6,000	8,000 9,000	

* බල ප්‍රදේශයේ පිහිටි ආගමික ස්ථාන සහ රජයේ පාසල් සඳහා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩල ගාස්තු පමණක් අය කර සේවා සපයනු ලැබේ.

* ඉහත සඳහන් සේවාවන් වෙනුවන් අයකරනු ලබන සියලුම ගාස්තු සඳහා රජය විසින් කලින් කලට පනවනු ලබන ව්‍යවස්ථාපිත බදු අයකරනු ලැබේ. තව ද ජලපවාහන මණ්ඩලය විසින් ඉදිරියේදී අය කරනු ලබන බැහැර කිරීමේ ගාස්තු සංශෝධනය කිරීම් අනුව අයකරනු ලබන ගාස්තු සංශෝධනය විය හැක. බල ප්‍රදේශයෙන් පිටත සේවා සැපයීමේ දී රු. 3,000 ක තැන්පතු මුදලක් අය කරන අතර දුර කිලෝමීටර 25 ට වඩා වැඩිවන අවස්ථාවල දී එසේ වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 140 බැගින් වූ අමතර ප්‍රවාහන ගාස්තුවක් ද අය කරනු ලැබේ. ඉහත ගාස්තු ඉන්ධන මිල සංශෝධනයන් අනුව ද වෙනස් විය හැකි ය. ගාස්තු ගෙවා තිබුණද සේවා සැපයීමට නොහැකි වන අවස්ථා වලදී ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු ප්‍රකාරව ගාස්තු අය කරනු ඇත.

ii. සුසාන භූමි ගාස්තු :

අනු. අංකය	*විස්තරය*	*බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් සඳහා (රු.)*	*බලප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සඳහා (රු.)*
01	මෘත දේහයක් අදාහනය සඳහා	6,000 0	9,000 0
02	මෘත දේහයක් භූමදනයන සඳහා	10,000 0	12,000 0
03	මෘත දේහයක් (දරුවලින්) අදාහනය සඳහා	15,000 0	20,000 0
04	මල්ශාලා මගින් වෙන්කරනු ලබන ආදාහනයක් සඳහා	10,000 0	15,000 0
05	අවුරුදු 3ට අඩු ළමා මරණයක් භූමිදානය සඳහා	නිදහස්	නිදහස්
06	මෘත දේහයක් අදාහනය සඳහා - අඩු ආදායම්ලාභීන් ලෙස රජයේ ප්‍රතිලාභ ලබන	3,500 0	6,500 0
07	මෘත දේහයක් භූමිදානය සඳහා - අඩු ආදායම්ලාභීන් ලෙස රජයේ ප්‍රතිලාභ ලබන	5,000 0	8,000 0

iii. වැදෑමහ අත්පා කොටස් හා විච්ඡේදනය කරන ලද මළ සිරුරු කොටස් භූමදානය කිරීමේ ගාස්තු

අනු. අංකය	*විස්තරය*	*රජයේ රෝහල් මගින් එවීමේදී අදාළ ගාස්තු (රු.)*	*පුද්ගලික රෝහල් මගින් එවීමේදී අදාළ ගාස්තු (රු.)*
01	රජයේ රෝහල්වලින් ලැබෙන වැදෑමහ බාල්දි 01 ක් සඳහා (කි.ග්‍රෑ. 33)	825 0	6,000 0
	රජයේ රෝහල්වලින් ලැබෙන වැදෑමහ කි.ග්‍රෑ 01 ක් සඳහා	25 0	185 0

අනු. අංකය	*විස්තරය*	*රජයේ රෝහල් මගින් එවීමේදී අදාළ ගාස්තු (රු.)*	*පුද්ගලික රෝහල් මගින් එවීමේදී අදාළ ගාස්තු (රු.)*
02	අත් පා කොටස් පෙට්ටි 01 ක් සඳහා	500 0	10,000 0
03	විච්ඡේදනය කරන ලද මළ සිරුරු කොටස් භූමදානය කිරීම සඳහා	1,000 0	12,500 0

iv. සිහිවටන කුටි වෙන් කිරීම සඳහා ගාස්තු :

අනු. අංකය	*විස්තරය*		*ගාස්තු (රු.)*
01	ගල්කිස්ස සුසාන භූමිය	පළමු තීරුව (ඉහළ)	55,000 0
		දෙවන තීරුව (මධ්‍යම)	45,000 0
		තෙවන තීරුව (පහළ)	35,000 0
		සිව්වන තීරුව (පහළම)	25,000 0
02	කොහුවල සුසාන භූමි	පළමු තීරුව (ඉහළ)	50,000 0
		දෙවන තීරුව (මධ්‍යම)	40,000 0
		තෙවන තීරුව (පහළ)	30,000 0
		සිව්වන තීරුව (පහළම)	20,000 0

V. අත්තිඩිය අවමංගල්‍ය ශාලාව වෙන් කිරීමේ ගාස්තු :

අනු. අංකය	*විස්තරය*	*බලප්‍රදේශය තුළ (රු.)*	*බලප්‍රදේශයෙන් පිටත (රු.)*
01	එක් දිනයක් සඳහා	6,000	8,500
02	තැන්පතු මුදල්	2,500	2,500

vi. සුසානභූමිවලට දූනට වෙන් කර ඇති සිහිවටන කුටි හා බිම් කොටස්වල පැවරීමේ කටයුතු වෙනුවෙන් පරිපාලන ගාස්තු :

අනු. අංකය	*විස්තරය*	*ගාස්තුව (රු.)*
01	බිම් කොටස්	5,000
02	සිහිවටන කුටි	3,000

vii. රාජ්‍ය ආයතන වල/ව්‍යාපාරික ස්ථානවල එදිනෙදා බැහැරලන කසල ඉවත් කිරීමේ ගාස්තු ට්‍රැක්ටර් ලෝඩ් 01ක් සඳහා

අනු. අංකය	*විස්තරය*	*ගාස්තුව*
01	දිරන/ඉඳුල් අපද්‍රව්‍ය	3,000
02	නොදිරන මිශ්‍ර අපද්‍රව්‍ය	7,500
03	නොදිරන වෙන් කරන ලද ප්‍රතිචක්‍රීයකරණ අපද්‍රව්‍ය	2,000
04	නොදිරන ප්‍රතිචක්‍රීයකරණය නොවන වෙන් කරන ලද අවශේෂ අපද්‍රව්‍ය	4,000

අනු. අංකය	*විස්තරය*	*ගාස්තුව*
05	මස් මාළු අපද්‍රව්‍ය	5,500 0
06	කර්මාන්ත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ හැකි	5,200 0
07	කර්මාන්ත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි	7,500 0

අංක 06 හා 07 යටතේ සඳහා කසල බැහැරලීමේදී උපද්‍රවකාරී අපද්‍රව්‍ය අඩංගු නොවිය යුතු යි.

viii. පහත සඳහන් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ට්‍රැක්ටර් ලෝඩ් 01 ක් සඳහා ගාස්තු

01	ගල්, වැලි, සිමෙන්ති, ගඩොල්, පාෂාණ කොටස් හා පස් මිශ්‍ර සුන්බුන් අපද්‍රව්‍ය	6,500 0
02	පස් අපද්‍රව්‍ය (පිරිසිදු)	3,500 0
03	පස් අපද්‍රව්‍ය (අපිරිසිදු) (කසල මිශ්‍ර හා අපජල අවශේෂ)	7,500 0
04	ගස්අතු අපද්‍රව්‍ය (සැහැල්ලු අතු කොටස්)	5,000 0
05	ගස් කඳන්/ කොටන් වට අඩි 1 හෝ ඊට වැඩි	7,500 0
06	පාෂාණ (ගල්)	5,000 0
07	හිස් ඉඩම්වල මිශ්‍ර අපද්‍රව්‍ය	12,000 0

අංක 07 කරුණ යටතේ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි සේවා ගාස්තුවක් ද අය කිරීමට සිදු වනු ඇත.

ix. මහල් (තට්ටු) ගොඩනැගිලිවල කසල නිශ්කාශන වාර්තා ලබා දීම සඳහා ගාස්තු අය කිරීම.

අනු. අංකය	*විස්තරය*	*නිශ්කාශන වාර්තා ලබාදීමේ ගාස්තුව (රු.)*	*ඉදිකිරීමෙන් පසු ක්ෂේත්‍ර පරීක්ෂා ගාස්තු (රු.)*
01	G+3 දක්වා	5,000 0	2,500 0
02	G+4 සිට G+6 දක්වා	7,500 0	3,500 0
03	G+7 සිට G+9 දක්වා	10,000 0	4,500 0
04	G+10 සිට G+12 දක්වා	12,500 0	5,500 0
05	G+13 සිට G+15 දක්වා	15,000 0	6,500 0
06	G+16 සිට G+18 දක්වා	17,500 0	7,500 0
07	G+19 සිට G+21 දක්වා	20,000 0	8,500 0
08	G+22 සිට ඉහළට	මහලකට 1,500 0 බැගින්	මහලකට 1,500 0 බැගින්

අංක 2 හා 3 යටතේ සේවා වෙනුවෙන් රජය විසින් කලින් කලට පනවනු ලබන ව්‍යවස්ථාපිත බදු අදාළ නොවන අතර, අංක 04, 05, 06, 07, 08 හා 09 යටතේ පවත්නා සේවා වෙනුවෙන් අයකරනු ලබන සියලුම ගාස්තු සඳහා රජය විසින් කලින් කලට පනවනු ලබන ව්‍යවස්ථාපිත බදු අයකරනු ලැබේ.

දෙහිවල - ගල්කිස්ස මහා නගර සභාව

ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අංශය යටතේ රංග ශාලා, සම්මන්ත්‍රණ ශාලා, උත්සව ශාලා, ක්‍රීඩාංගන සහ කායවර්ධන මධ්‍යස්ථාන සඳහා ගාස්තු අය කිරීම

252 අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 286 (ආ) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිවල-ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය සඳහා එස්. ද. එස්. ජයසිංහ සමරු රඟහල, උත්සව ශාලා, ක්‍රීඩාංගන, කාය වර්ධන මධ්‍යස්ථාන හා ප්‍රජාශාලා සඳහා ගාස්තු පනවා 2025 වර්ෂයට අය කිරීමට මා විසින් 2024.11.29 දිනැති තීරණ අංක 1824 යටතේ තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් සහ
බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිලධාරි.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
දෙහිවල, ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ බලතල කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක ඉටුකරන, නාගරික කොමසාරිස් එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම වන මම එස්. ද එස්. ජයසිංහ සමරු රඟහල, උත්සව ශාලා, ක්‍රීඩාංගන, කාය වර්ධන මධ්‍යස්ථාන හා ප්‍රජා ශාලා සඳහා 2025 වර්ෂයට පනවා 2025.01.01 සිට අය කිරීමට තීරණය කරමි.

ඇස්. ද ඇස්. ජයසිංහ සමරු රඟහල වෙන් කිරීමේ ගාස්තු 2025

A ශාලාව (ශ්‍රවණාගාරය)

සති අන්ත දින/ රජයේ නිවාඩු දින

(වායු සමීකරණ පහසුකම් සහිතයි)

උපලේඛන අංක 01

අනු අංකය	*විස්තරය*	*දිනකට අවම පැය*	*ශාලා ගාස්තුව රු. ශත*	*තැන්පත් මුදල රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*	*පෙර පුහුණුව හා සැරසිලි සඳහා පැය 4 කට රු. ශත*
01.*	නාට්‍ය, චිත්‍රපට හා විවිධ ප්‍රසංග,	04	57,000 0	75,000 0	10,000 0	45,000
	1. දර්ශන එකකට	08	82,000 0			
	2. දර්ශන දෙකකට					
	3. දර්ශන තුනකට	12	105,000 0			
02.*	සංගීත ප්‍රසංග	04	90,000 0	100,000 0	20,000 0	65,000 0
		08	145,000 0			
		12	190,000 0			

අනු අංකය	*විස්තරය*	*දිනකට අවම පැය*	*ශාලා ගාස්තුව* *රු. ශත*	*තැන්පත් මුදල* *රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*	*පෙර පුහුණුව හා සැරසිලි සඳහා පැය 4 කට* *රු. ශත*
03	අධ්‍යාපන හෝ වෙනත් සම්මන්ත්‍රණ	04	40,000 0	75,000 0	7,000 0	-
		08	58,000 0			
04	රජයේ පාසල් විසින් පවත්වනු ලබන විවිධ ප්‍රසංග නාට්‍ය දර්ශන	04	30,000 0	50,000 0	5,000 0	20,000 0
		08	45,000 0			
05	ජාත්‍යන්තර පාසල් විසින් පවත්වනු ලබන විවිධ ප්‍රසංග හා නාට්‍ය දර්ශන	04 08	40,000 0 62,000 0	50,000 0	7,000 0	30,000 0
06	පෙර පාසල් උත්සව	04	37,000 0	50,000 0	6,000 0	32,000 0
07	රාජ්‍ය ආයතන පවත්වනු ලබන සම්මන්ත්‍රණ/ උත්සව	04	30,000 0	50,000 0	5,000 0	-
08	ටෙලිනාට්‍ය/ චිත්‍රපට රූගත කිරීම් හා රැස්වීම්	08	35,000 0	50,000 0	4,500 0	-

* පෙර පුහුණුව සඳහා ශාලාව ලබා දෙනුයේ අදාළ උත්සවය මෙම ශාලාවේ සිදු කරන්නේ නම් පමණි.

පෙර පුහුණුව හැර ශාලාව ලබාදෙන අවස්ථාවන්හි දී උත්සවයකට පෙර පැයකුත් උත්සවයට පසු පැයකුත් සැරසිලි සහ සංවිධාන කටයුතු සඳහා ලබා දෙනු ලැබේ. එම කාලයට වඩා වැඩි කාලයක් ලබා ගන්නේ නම් පැය 01ක ට රු. 2,500/-ක් අය කරනු ලැබේ.

උපලේඛන අංක 02

ඇස්. ද ඇස්. ජයසිංහ සමරු රඟහල වෙන් කිරීමේ ගාස්තු - 2025

A ශාලාව (ශ්‍රවණාගාරය)

සතියේ දින
(වායු සමීකරණ පහසුකම් සහිතයි

01.*	නාට්‍ය, චිත්‍රපට, විවිධ ප්‍රසංග,					
	1. දර්ශන එකකට	04	43,000 0	75,000 0	7,500 0	38,000
	2. දර්ශන දෙකකට	08	62,000 0			
	3. දර්ශන තුනකට	12	79,000 0			

අනු අංකය	*විස්තරය*	*දිනකට අවම පැය*	*ශාලා ගාස්තුව රු. ශත*	*තැන්පත් මුදල රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*	*පෙර පුහුණුව හා සැරසිලි සඳහා පැය 4 කට රු. ශත*
02.*	සංගීත සංදර්ශන	04	72,000 0	100,000 0	16,000 0	55,000 0
		08	116,000 0			
		12	152,000 0			
03	අධ්‍යාපන හෝ වෙනත් සම්මන්ත්‍රණ	04	32,000 0	75,000 0	6,500 0	-
		08	46,000 0			
04	රජයේ පාසල් විසින් පවත්වනු ලබන විවිධ ප්‍රසංග හා නාට්‍ය දර්ශන	04	24,000 0	50,000 0	5,000 0	20,000 0
		08	36,000 0			
05	ජාත්‍යන්තර පාසල් විසින් පවත්වනු ලබන විවිධ ප්‍රසංග හා නාට්‍ය දර්ශන	04	32,000 0	50,000 0	6,500 0	28,000 0
		08	46,000 0			
06	පෙර පාසල් උත්සව	04	30,000 0	50,000 0	5,000 0	26,000 0
07	රාජ්‍ය ආයතන පවත්වනු ලබන සම්මන්ත්‍රණ/ උත්සව	04	25,000 0	50,000 0	5,000 0	-
08	ටෙලිනාට්‍ය/ චිත්‍රපට රූගත කිරීම් හා රැස්වීම්	08	35,000 0	50,000 0	4,500 0	-

* පෙර පුහුණුව සඳහා ශාලාව ලබා දෙනුයේ අදාළ උත්සවය මෙම ශාලාවේ සිදු කරන්නේ නම් පමණි.

* පෙර පුහුණුව හැර ශාලාව ලබා දෙන අවස්ථාවන්හි දී උත්සවයකට පෙර පැයකුත් උත්සවයට පසු පැයකුත් සැරසිලි සහ සංවිධාන කටයුතු සඳහා ලබා දෙනු ලැබේ. එම කාලයට වැඩි කාලයක් ලබා ගන්නේ නම් *පැය 01ක ට රු. 2,500/-*ක් අය කරනු ලැබේ.

උපලේඛන අංක 03

ඇස්. ද ඇස්. ජයසිංහ සමරු රඟහල වෙන් කිරීමේ ගාස්තු - 2025

B ශාලාව

සතියේ දින/සති අන්ත හා රජයේ නිවාඩු දින
(වායු සමීකරණ පහසුකම් සහිතයි)

			සතියේ දින			*සති අන්ත හා රජයේ නිවාඩු දින*		
අනු අංකය	*විස්තරය*	*දිනකට අවම පැය*	*ශාලා ගාස්තුව රු. ශත*	*තැන්පත් මුදල රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*	*ශාලා ගාස්තුව රු. ශත*	*තැන්පත් මුදල රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*
01	පුහුණු පංති							
	1. පාසල්	03	9,500 0	10,000 0	3,000 0	11,000 0	10,000 0	4,000 0
	2. වෙනත්	03	13,000		4,500 0	15,000 0		5,000 0

			සතියේ දින			*සති අන්ත හා රජයේ නිවාඩු දින*		
අනු අංකය	*විස්තරය*	*දිනකට අවම පැය*	*ශාලා ගාස්තුව* *රු. ශත*	*තැන්පත් මුදල රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*	*ශාලා ගාස්තුව* *රු. ශත*	*තැන්පත් මුදල රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*
02	ප්‍රදර්ශන හෝ අලෙවිය							
	1. පොත්	04	6,000 0	10,000 0	1,500 0	8,000 0	10,000 0	2,000 0
	2. වෙනත්	08	17,000 0		2,200 0	20,000 0		2,500 0
03	සම්මන්ත්‍රණ/දේශන	04	14,000 0	10,000 0	3,500 0	18,000 0	10,000 0	4500 0
		06	21,000 0			26,000 0		

* ශාලාව ලබා දෙන අවස්ථාවන්හි දී උත්සවයකට පෙර පැයකුත් උත්සවයකට පසු පැයකුත් සැරසිලි සහ ශාලාව ලබාදෙන අවස්ථාවන්හිදී උත්සවයකට පෙර පැයකුත් උත්සවයට පසු පැයකුත් සැරසිලි සහ සංවිධාන කටයුතු සඳහා ලබා දෙනු ලැබේ. එම කාලයට වඩා වැඩි කාලයක් ලබා ගන්නේ නම් පැය 01ක ට රු. 1,000/-ක් අය කරනු ලැබේ.

B ශාලාව

සතියේ දින/සති අන්ත හා රජයේ නිවාඩු දින
(වායු සමීකරණ පහසුකම් රහිතයි)

01	පුහුණු පංති							
	1. පාසල්	03	6,200 0	10,000 0	2,000 0	7,200 0	10,000 0	2,600 0
	2. වෙනත්	03	8,500 0		3,000 0	9,800 0		3,300 0
02	ප්‍රදර්ශන හෝ අලෙවිය							
	1. පොත්	04	3,900 0	10,000 0	1,000 0	5,200 0	10,000 0	1,300 0
	2. වෙනත්	08	11,100 0		1,400 0	13,000 0		1,700 0
03	සම්මන්ත්‍රණ/දේශන	04	9,100 0	10,000 0	2,300 0	11,700 0	10,000 0	3,000 0
		06	13,700 0			16,900 0		

* ශාලාව ලබාදෙන අවස්ථාවන්හි දී උත්සවයකට පෙර පැයකුත් උත්සවයකට පසු පැයකුත් සැරසිලි සහ සංවිධාන කටයුතු සඳහා ලබා දෙනු ලැබේ. එම කාලයට වඩා වැඩි කාලයක් ලබා ගන්නේ නම් *පැය 01ක ට රු. 1,000/-*ක් අය කරනු ලැබේ.

උපලේඛන අංක 05

ඇස්. ද ඇස්. ජයසිංහ සමරු රඟහල වෙන් කිරීමේ ගාස්තු - 2025

C ශාලාව

සතියේ දින/සති අන්ත හා රජයේ නිවාඩු දින
(වායු සමීකරණ පහසුකම් රහිතයි)

අනු අංක	*විස්තරය*	*දිනකට අවම පැය*	*ශාලා ගාස්තුව රු. ශත*	*තැන්පත් මුදල රු. ශත*	*වැඩි වන පැයකට රු. ශත*
01	රැස්වීම්	04	2,800 0	5,000 0	700 0
02	පුහුණුවීම්	02 04	800 1600	5,000 0	400 0
03	අලෙවිය හා වෙළඳ භාණ්ඩ ප්‍රදර්ශනය	01	1,000 0	5,000 0	-

උපලේඛන අංක 06

බඩෝවිට උත්සව ශාලාව වෙන් කිරීමේ ගාස්තු 2025

සතියේ දින/සති අන්ත හා රජයේ නිවාඩු දින
(වායු සමීකරණ පහසුකම් රහිතයි)

01	සම්මන්ත්‍රණ	08	5,000 0	10,000 0	500 0
02	උපකාරක පංති	08	2,000 0	10,000 0	200 0
03	විවිධ ආකාරයේ උත්සව කටයුතු	09	5,000 0	10,000 0	500 0

උපලේඛන අංක 07

ජනජය උත්සව ශාලාව වෙන් කිරීමේ ගාස්තු 2025

සතියේ දින / සති අන්ත හා රජයේ නිවාඩු දින
(වායු සමීකරණ පහසුකම් සහිතයි)

01	උත්සව අවස්ථා සඳහා	09	30,000 0	20,000 0	4,000 0

උපලේඛන අංක 08

ජයනද උත්සව ශාලාව කිරීමේ ගාස්තු 2025

සතියේ දින / සති අන්ත හා රජයේ නිවාඩු දින

			වායු සමීකරණ පහසුකම් සහිතව			*වායු සමීකරණ පහසුකම් රහිතව*		
අනු අංක	*විස්තරය*	*දිනකට අවම පැය*	*ශාලා ගාස්තුව* *රු. ශත*	*තැන්පත් මුදල* *රු. ශත*	*වැඩි වන පැයකට* *රු. ශත*	*ශාලා ගාස්තුව* *රු. ශත*	*තැන්පත් මුදල* *රු. ශත*	*වැඩි වන පැයකට* *රු. ශත*
01	අධ්‍යාපන හා වෙනත් සම්මන්ත්‍රණ, මංගල උත්සව, උපන්දින හා සුහද හමු	09	25,000 0	20,000 0	2,800 0	13,500 0	20,000 0	1,500 0

උපලේඛන අංක 09

ඇස්. ද ඇස්. ජයසිංහ ක්‍රීඩාංගණය වෙන් කිරීමේ ගාස්තු 2025

සතියේ දින හා සෙනසුරාදා දින පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා

අනු අංක	*විස්තරය*	*ගාස්තුව* *රු. ශත*	*තැන්පතු මුදල* *රු. ශත*
01.	සැහැල්ලු පන්දු ක්‍රිකට් කණ්ඩායම් 2 ක් සඳහා පමණි	9,500 0	10,000 0
02.	ක්‍රිකට් තරගාවලි (දිවා කාලය පමණි)	17,500 0	10,000 0
03.*	සැහැල්ලු පන්දු ක්‍රිකට් දිවා-රාත්‍රී (පැය 08 ක් සඳහා)	28,000 0	10,000 0
04.	ක්‍රීඩා පුහුණුව - පැය 3 ක් සඳහා (පාපන්දු සහ රගර් හැර) වැඩිවන පැය 1 ක් සඳහා	4,800 0 1,600	10,000 0
05	ක්‍රිකට් (ලෙදර්) (14 පහළ, දිවා කාලය සඳහා)	15,000 0	25,000 0
06.	අවුරුදු උත්සව/විවිධ ප්‍රසංග	17,500 0	15,000 0
07.	ප්‍රසිද්ධ රැස්වීම්	75,000 0	100,000 0
08. *	සංගීත සංදර්ශන/විනෝද සැනකෙළි	75,000 0	15,000 0
09.	වෙළඳ ප්‍රවර්ධන කටයුතු (ක්‍රීඩාංගනයෙන් වෙන් කරන ලද කොටසක් සඳහා)	50,000 0	15,000 0
10.	පාසල් ක්‍රීඩා තරගාවලි බල ප්‍රදේශයේ රජයේ පාසල් බල ප්‍රදේශයේ නොවන රජයේ පාසල් ජාත්‍යන්තර පාසල්	 9,500 0 17,500 0 25,000 0	10,000 0
11.	පෙර පාසල් උත්සව පෙර පුහුණුව පැය 4 ක් සඳහා	17,500 0 9,000 0	10,000 0

* කොන්දේසි සහිතයි

උපලේඛන අංක 10

සරණංකර සහ අත්තිඩිය ඒ. පී. ලියනගේ ක්‍රීඩාංගණය වෙන් කිරීමේ ගාස්තු - 2025

සතියේ දින හා සෙනසුරාදා දින පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා

1.	පාපන්දු තරඟ/රගර්	6,500 0	5,000 0
2.	ක්‍රිකට් සැහැල්ලු පන්දු දිවා (බල ප්‍රදේශයේ කණ්ඩායම් දෙකක් සඳහා)	6,500 0	5,000 0
3.	ක්‍රිකට් සැහැල්ලු පන්දු දිවා (බල ප්‍රදේශයේ නොවන කණ්ඩායම් දෙකක් සඳහා)	9,500 0	5,000 0
4.	අවුරුදු උත්සව	9,500 0	5,000 0
5.	සියලුම ක්‍රීඩා තරගාවලි	14,500 0	5,000 0
6.	ක්‍රීඩා පුහුණුව පැය තුනක් සඳහා වැඩිවන පැයකට	 3,900 0 1,000 0	5,000 0

අනු අංක	*විස්තරය*	*ගාස්තුව රු. ශත*	*තැන්පතු මුදල රු. ශත*
7.	විවිධ ප්‍රසංග	10,000 0	5,000 0
8.	ප්‍රසිද්ධ රැස්වීම්*	17,500 0	20,000 0
9.	සංගීත සංදර්ශන/විනෝද සැණකෙළි*	35,000 0	30,000 0
10.	වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු	30,000 0	10,000 0
11.	පෙර පාසල් උත්සව පෙර පුහුණුව අමතර පැයකට	10,000 0 1,500 0	5,000 0
12.	Food Festival	25,000 0	25,000 0

* දිවා රාත්‍රී තරග සඳහා ක්‍රීඩාංගණය ලබා දෙනුයේ ප.ව. 2.00 සිට ප.ව. 10.00 දක්වා පමණි.
ක්‍රීඩා පුහුණුව සඳහා පෙ.ව. 6.00 සිට පෙ.ව. 9.00 දක්වා ක්‍රීඩාංගණය ලබා ගන්නේ නම් පැය 03ක් සඳහා රු. 7,500/-ක් වේ.

උපලේඛන අංක 11

මවුන්ට් ක්‍රීඩාංගණය වෙන් කිරීමේ ගාස්තු 2025

සතියේ දින හා සෙනසුරාදා දින පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා

01.	ක්‍රීඩා පුහුණුව පැය තුනක් සඳහා වැඩිවන පැයකට	3,000 0 800 0	5,000 0
02.	විවිධ ප්‍රසංග/ අවුරුදු උත්සව	9,500 0	5,000 0
03.	ප්‍රසිද්ධ රැස්වීම්*	17,500 0	20,000 0
04.	සංගීත සංදර්ශන/විනෝද සැනකෙළි*	35,000 0	30,000 0
05	Food Festival *	25,000 0	25,000 0
06.	වෙළඳ ප්‍රවර්ධන කටයුතු	30,000 0	10,000 0
07.	පෙර පාසල් උත්සව පෙර පුහුණුව පැය හතරකට	8,000 0 750 0	5,000 0

* කොන්දේසි සහිතයි

උපලේඛන අංක 12

ගල්කිස්ස ළමා ක්‍රීඩාංගණය හා පැසිපන්දු ක්‍රීඩාංගණය වෙන් කිරීමේ ගාස්තු 2025

01.	පැසිපන්දු/මළල ක්‍රීඩා/නෙට්බෝල්/වොලිබෝල් සතියේ දින පැය හතරකට වැඩිවන පැයකට	4,500 0 800 0	10,000 0
02.	පැසිපන්දු/මළල ක්‍රීඩා/නෙට්බෝල්/වොලිබෝල් සති අන්ත දින පැය හතරකට වැඩිවන පැයකට	6,000 0 1,000 0	10,000 0

උපලේඛන අංක 13

ප්‍රේෂර් ක්‍රීඩාංගණය වෙන් කිරීමේ ගාස්තු 2025

සතියේ දින සහ සෙනසුරාදා දින

අනු අංකය	*විස්තරය*	*ගාස්තුව* *රු. ශත*	*තැන්පතු මුදල* *රු. ශත*
01.	රගර්, පාපන්දු තරග, සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩා තරගාවලි, අවුරුදු උත්සව, විවිධ ප්‍රසංග, ප්‍රසිද්ධ රැස්වීම් (පැය 8 ක් සඳහා) අමතර පැය එකක් සඳහා	6,500 0 650 0	10,000 0
02.	සංගීත සංදර්ශන/ විනෝද සැණකෙළි (පැය 8 ක් සඳහා)	15,000 0	50,000 0
03.	වෙළඳ ප්‍රවර්ධන කටයුතු (පැය 8 ක් සඳහා) *	10,000 0	50,000 0
04.	Food Festival *	25,000 0	25,000 0
05.	ප්‍රේෂර් ටෙනිස් පිටිය * පාසල් ළමුන් සඳහා පැයකට * වෙනත් පාර්ශව සඳහා පැයකට	800 0 1,900 0	5,000 0
06.	ප්‍රේෂර් ලෙදර් නෙට්එක පුහුණුව සඳහා පැයකට	800 0	5,000 0
07.	පෙර පාසල් උත්සව පෙර පුහුණුව පැය හතරකට	4,000 0 2,000 0	5,000 0
08.	ක්‍රිකට්/පාපන්දු හා රගර් පුහුණුව සඳහා පැයකට	700 0	5,000 0

* රාත්‍රී 10 දක්වා පමණි.

උපලේඛන අංක 14

අත්තිඩිය ගිණි නිවීම් ඒකකය අසල ක්‍රීඩාංගණය වෙන් කිරීමේ ගාස්තු 2025

සතියේ දින සහ සෙනසුරාදා දින

01.	සංගීත සංදර්ශන (පැය 8 ක් සඳහා)	35,000 0	25,000 0
02.	රියදුරු පුහුණුව (පැය 1 කට)	4,500 0	25,000 0
03.	රථ වාහන ගාල් කිරීම (පැය 06)	10,000 0	25,000 0
04.	ප්‍රසිද්ධ රැස්වීම්	10,000 0	15,000 0

උපලේඛන අංක 15

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව සතු කුඩා ප්‍රමාණයේ ඉහතින් සඳහන් නොවූ ක්‍රීඩාංගණ වෙන් කිරීමේ ගාස්තු 2025

සතියේ දින සහ සෙනසුරාදා දින

01.*	රගර්, පාපන්දු තරග, සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලි (පැය 8 ක් සඳහා) අමතර පැය එකක් සඳහා	5,000 0 500 0	5,000 0

අනු අංකය	*විස්තරය*	*ගාස්තුව* *රු. ශත*	*තැන්පතු මුදල* *රු. ශත*
02.	විවිධ ප්‍රසංග/අවුරුදු උත්සව/ප්‍රසිද්ධ රැස්වීම්	6,000 0	15,000 0
03.*	සංගීත සංදර්ශන/විනෝද සැණකෙළි (පැය 8 ක් සඳහා) අමතර පැය එකක් සඳහා	14,000 0 1,400 0	50,000 0
04.	වෙළඳ ප්‍රවර්ධන කටයුතු (සම්පූර්ණ දිනයක් හෝ එහි කොටසකට)	12,000 0	50,000 0
05.	පෙර පාසල් උත්සව (පැය 8 ක් සඳහා) පෙර පුහුණුව පැය හතරකට	5,000 0 1,600 0	5,000 0

* දිවා කාලය සඳහා පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වාත්, රාත්‍රී කාලය සඳහා ප.ව. 2.00 සිට ප.ව. 10.00 දක්වා ක්‍රීඩාංගනය වෙන් කරනු ලැබේ.

උපලේඛන අංක 15

කායවර්ධන මධ්‍යස්ථාන සාමාජික ගාස්තු අය කිරීම 2025

සතියේ දින සහ සෙනසුරාදා දින

අනු අංකය	*විස්තරය*	*ගාස්තුව මාසිකව* *රු. ශත*
01.	දෙහිවල ගල්කිස්ස මහා නගර සභා ප්‍රධාන කාය වර්ධන මධ්‍යස්ථානය	800 0
02.	සරණංකර කායවර්ධන මධ්‍යස්ථානය	400 0
03.	1, 2 හැර අනෙකුත් කාය වර්ධන මධ්‍යස්ථාන	200 0

* කොන්දේසි සහිතයි.

උපලේඛන අංක 17

ප්‍රජා ශාලා වෙන් කිරීමේ ගාස්තු 2025

අනු අංකය	*විස්තරය*	*ගාස්තුව* *රු. ශත*	*තැන්පත් මුදල* *රු. ශත*
01.	ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි සුභ සාධන හා වෙනත් ප්‍රජා අවශ්‍යතාවන් සඳහා (පැය 8 ක කාලයක් සඳහා)	400 0	2,000 0

* ඉහත අංක 01 සිට 16 දක්වා වන සියලු උප ලේඛනවල සඳහන් තැන්පතු මුදල හැර අනෙකුත් සියලු අයකිරීම් සඳහා රජය විසින් පනවනු ලබන ව්‍යවස්ථාපිත බදුද, ජල හා විදුලි ගාස්තු ඉදිරියේදී සංශෝධනයවීම් මත ඉහත සඳහන් ගාස්තු අයකිරීම් ද ඒ අනුව සංශෝධනය විය හැක.

පුත්තලම නගර සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 160 වන වගන්තියේ 1 වැනි උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන පුත්තලම නගර සභාවේ ලේකම් එල්. බී. ජී. ප්‍රීතිකා වන මම, එකී පනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 160 වන වගන්තියේ 1 උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.12 දිනැති අංක Puuc/2024/11/2490 අංක දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. ජී. ප්‍රීතිකා,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පුත්තලම නගර සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින,
පුත්තලම නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 160 වන වගන්තියේ 1 උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම යෝජනා කරමි.

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වන වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ පුත්තලම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2015 වර්ෂයේදී සිදුකළ තක්සේරුව මත පදනම් වූ, 2024 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වාර්ෂික වටිනාකම 2025 වර්ෂය සඳහා වූ සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත 255 වැනි අධිකාරය නගර සභා ආඥාපනතේ 27 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරුවෙහි සඳහන් නේවාසික ස්ථාන සඳහා වාර්ෂික වටිනාකමින් සියයට තුනක (3%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්, වෙළෙඳ හා වාණිජ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන වෙනුවෙන් ඉහත කී තක්සේරුවෙහි වාර්ෂික වටිනාකමින් සියයට අටක (8%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ 3 වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද, නගර සභාව ලබාදිය යුතු බවටත්, මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරය	*II* වැනි තීරය	*III* වැනි තීරය
කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2025 මාර්තු මස 31ට පෙර	2025 ජනවාරි මස 31
දෙවන කාර්තුව	2025 ජූනි මස 30ට පෙර	2025 අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2025 සැප්තැම්බර් මස 30ට පෙර	2025 ජූලි මස 30
හතරවන කාර්තුව	2025 දෙසැම්බර් මස 31ට පෙර	2025 ඔක්තෝබර් මස 31

පුත්තලම නගර සභාව

2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 162 හා 164 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන පුත්තලම නගර සභාවේ ලේකම් එල්. බී. ජී. ප්‍රීතිකා වන මම, එකී පනතේ 162 හා 164 වගන්තියේ (1) වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.12 දිනැති අංක Puuc/2024/11/2491 දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. ජී. ප්‍රීතිකා,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පුත්තලම නගර සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින,
පුත්තලම නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

255 වැනි අධිකාරය නගර සභා ආඥාපනතේ 162 හා 164 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ පුත්තලම නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ විස්තර කර ඇති හා එකී ආඥා පනතේ 27 වැනි වගන්තියේ 3 වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පුත්තලම නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2024 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන විට*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පළතුරු බීම අළෙවිය	500 0	750 0	1,000 0
02.	පළතුරු අළෙවිය	500 0	750 0	1,000 0
03.	විසිතුරු ප්ලාස්ටික් මල් අළෙවිය	500 0	750 0	1,000 0
04.	බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05.	තේ කඩයක් හෝ කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	බාබර් සාප්පුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	එළවළු අලෙවිය	500 0	750 0	1,000 0
08.	ධාන්‍ය ඇට වර්ග විකිණීම	500 0	750 0	1,000 0
09.	ලොන්ඩරියක් පැවැත්වීම	500 0	750 0	1,000 0
10.	ශීතකළ බීම වර්ග අළෙවි කිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව *II වැනි තීරුව*

අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන විට	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
11.	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	රස කැවිලි අළෙවිය	500 0	750 0	1,000 0
13.	යතුරු පැදි අළෙවිය	500 0	750 0	1,000 0
14.	පැකට් කළ වියළි ආහාර ද්‍රව්‍ය විකිණීම	500 0	750 0	1,000 0
15.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	වින්කලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ජංගම දුරකතන අළෙවිය හා අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
20.	ගෘහ විදුලි උපකරණ ගබඩා කිරීමේ, අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	එළවළු වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	බීම සඳහා ජලය අලෙවි කිරීම	500 0	750 0	1,000 0
23.	රබර් සීල් සහ ප්ලාස්ටික් පළඳනා සකස් කිරීම	500 0	750 0	1,000 0
24.	පොල්තෙල් සහ ෆාම් තෙල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	මැටි බඳුන් නිෂ්පාදන අළෙවි කිරීම	500 0	750 0	1,000 0
26.	විසිතුරු මල් සහ මල් වගා බඳුන්, මල් පොහොර විකිණීම	500 0	750 0	1,000 0
27.	ආයුර්වේදීය නිෂ්පාදන විකිණීම	500 0	750 0	1,000 0
28.	සාප්පු/මණිබඩු විකිණීම	500 0	750 0	1,000 0
29.	ඡායා පිටපත් කිරීම හෝ රෝනියෝ කිරීම	500 0	750 0	1,000 0
30.	දළ සේයාපට අළෙවිය	500 0	750 0	1,000 0
31.	මෝටර් රථ අමතර කොටස් විකිණීම	500 0	750 0	1,000 0
32.	පාපැදි අළෙවිය	500 0	750 0	1,000 0
33.	යකඩ බඩු වෙළඳසල්	500 0	750 0	1,000 0
34.	කොහු ආශ්‍රිත නිෂ්පාදන විකිණීම	500 0	750 0	1,000 0
35.	පාසල් උපකරණ, පොත්පත් හා ලිපිද්‍රව්‍ය අළෙවිය	500 0	750 0	1,000 0
36.	මනාලියන් හැඩ ගැන්වීම හෝ රූපලාවන්‍යාගාර	500 0	750 0	1,000 0
37.	ඇස් කණ්නාඩි විකිණීම	500 0	750 0	1,000 0
38.	පුවත්පත් අළෙවිය	500 0	750 0	1,000 0
39.	සිමෙන්ති භාණ්ඩ අළෙවිය	500 0	750 0	1,000 0
40.	රබර් ආශ්‍රිත නිෂ්පාදන අළෙවිය	500 0	750 0	1,000 0
41.	ගොඩනැගිලි ද්‍රව්‍ය අළෙවි කිරීම	500 0	750 0	1,000 0
42.	මාළු දැල් හා ධීවර ආම්පන්න අළෙවි කිරීම	500 0	750 0	1,000 0
43.	පෞද්ගලික දුරකථන සන්නිවේදන මධ්‍යස්ථාන	500 0	750 0	1,000 0
44.	විසිතුරු මසුන් අළෙවි කිරීම	500 0	750 0	1,000 0
45.	දර අළෙවි කිරීම	500 0	750 0	1,000 0
46.	ගෘහ භාණ්ඩ විකිණීම	500 0	750 0	1,000 0
47.	නිමි ඇඳුම් වෙළඳාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
			ස්ථානයේ වාර්ෂික වටිනාකම	
අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන විට*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
අන්තරායදායක ව්‍යාපාර :				
01.	ගිනිකෙළි භාණ්ඩ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
02.	පිහි ආයුධ වෙළෙඳාම	500 0	750 0	1,000 0
03.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04.	එළවළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05.	ගිනිපෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
06.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
07.	වැලි සේදීම	500 0	750 0	1,000 0
08.	පාවහන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
අප්‍රසන්න ව්‍යාපාර :				
01.	සත්ත්ව ආහාර විකිණීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02.	මස් විකිණීමේ පෞද්ගලික ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	මාළු විකිණීමේ පෞද්ගලික ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ශීත කළ මස් හෝ මාළු විකිණීම	500 0	750 0	1,000 0
05.	සුරුට්ටු දුම්කොළ ගබඩා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0

12 - 211/2

පුත්තලම නගර සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 අ වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන පුත්තලම නගර සභාවේ ලේකම් එල්. බී. ජී. ප්‍රීතිකා වන මම, එකී පනතේ 165අ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.12 දිනැති අංක Puuc/2024/11/2492 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. ජී. ප්‍රීතිකා,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පුත්තලම නගර සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින,
පුත්තලම නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 අ වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ පුත්තලම නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් යටතේ හෝ පුත්තලම නගර සභාව විසින් 2025 වර්ෂය තුළ අය කරනු ලබන කර්මාන්ත බද්ද, එකී ආඥාපනතේ 27 වැනි වගන්තියේ 3 උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත සෑම කර්මාන්තයක් විෂයෙහි එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක වාර්ෂික කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 165අ. වගන්තියේ (3) (1) වන උපවගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බද්ද නගර සභාවට ගෙවිය යුතු බවටත් මම යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	II වැනි තීරුව		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය — *කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන විට*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන විට*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. වඩුවැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම (යාන්ත්‍රික)	500 0	750 0	1,000 0
02. වඩුවැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම (අතින්)	500 0	750 0	1,000 0
03. විදුලි කාර්මික වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. පාවහන් නිපදවීම	500 0	750 0	1,000 0
06. කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. වේවැල් හෝ වේවැල් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09. යන්ත්‍ර මගින් සිමෙන්ති ගල් (බ්ලොක් ගල්) නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10. කොප්පරා නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
11. පොල් ලී නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. පිත්තල බඩු නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. යතුරු කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. රත්‍රං ආශ්‍රිත නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. රබර් ආශ්‍රිත නිෂ්පාදනාගාර	500 0	750 0	1,000 0
17. කජු සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. ලුණු ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. මෝටර් රථ හා යතුරු පැදි එකලස් කිරීම හා සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. යකඩ පෑස්සුම් හා නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. රසකැවිලි නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. මැටිබඳුන් නිෂ්පාදනය හා ඔප දැමීම	500 0	750 0	1,000 0
24. ඇළුමිනියම් කබඩ් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
25. හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	II වැනි තීරුව	
			පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	රු. 750 නොඉක්මවන විට	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන විට
		රු. ශත	රු. ශත	රු. ශත
26.	ගඩොල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
27.	ෆයිබර් ග්ලාස් මගින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
28.	බිත්තර සඳහා කිකිළියන් ඇති කිරීම	500 0	750 0	1,000 0
29.	අයිස් නිෂ්පාදන කර්මාන්ත ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	මස් සඳහා කුකුළන් ඇති කිරීම	500 0	750 0	1,000 0
32.	කිරි සඳහා සත්ත්ව ගොවිපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	මස් සඳහා සත්ත්ව ගොවිපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	කොහු ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	රෙදිපිළි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	මික්ෂර් පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ඡායාරූප ශාලා හා රසායනාගාර	500 0	750 0	1,000 0
38.	ත්‍රී රෝද රථ නවීකරණය කිරීම	500 0	750 0	1,000 0

12 - 211/3

පුත්තලම නගර සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 ආ වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන පුත්තලම නගර සභාවේ ලේකම් එල්. බී. ජී. ප්‍රීතිකා වන මම, එකී පනතේ 165ආ වන වගන්තියේ 1 වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.12 දිනැති අංක Puuc/2024/11/2493 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. ජී. ප්‍රීතිකා,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පුත්තලම නගර සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින,
පුත්තලම නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165ආ වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ පුත්තලම නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165ඇ වැනි වගන්තිය යටතේ කිසිම බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් පුත්තලම නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම එකී ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 27 වැනි වගන්තියේ 3 වන

උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තකු එකී ආඥාපනතේ 165 ආ වගන්තියේ (2) (1) වන උපවගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බද්ද නගර සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

I වැනි තීරුව *ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබීම්*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන විට	අයකිරීමක් නැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන විට	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12 - 211/4

පුත්තලම නගර සභාව

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 163(1) වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන පුත්තලම නගර සභාවේ ලේකම් එල්. බී. ජී. ප්‍රීතිකා වන මම, එකී පනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 163(1) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.12 දිනැති අංක Puuc/2024/11/2494 දරන තීරණය යටතේ ම විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. ජී. ප්‍රීතිකා,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පුත්තලම නගර සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින,
පුත්තලම නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 162 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 163(1) වැනි වගන්තිය යටතේ පුත්තලම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 27 වන වගන්තියේ 3 වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බද්දක් පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට ද,

255 වැනි අධිකාරය නගර සභා ආඥාපනතේ 162 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 163(1) වැනි වගන්තියේ සඳහන් එම ආඥාපනතේ තුන්වන උපලේඛනයේ විස්තර කර ඇත්තාවූ ද වාහන හා සතුන් සියල්ල *නැනහොන්* ඉන් යම් වාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් බද්දක් අය කිරීමට අදාළ විධිවිධාන යටතේ පුත්තලම නගර සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේ දී මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරයේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු වෙනුවෙන් ම එම උපලේඛනයෙහි II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එකී ආඥාපනතේ 163 වගන්තියේ (3) වන උපවගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී වාහන හා සත්ත්ව බද්දට යටත් සෑම තැනැත්තකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2025 වර්ෂය සඳහා වන මෙම බද්ද නගර සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව* *රු. ශත*
1.	මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
2.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාර් රථයක් *නැතහොත්* බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක් ම සඳහා	
	(අ) වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	10 0
	(ආ) එය වෙළෙඳ කටයුතු නොවන කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම්	5 0
3.	සෑම කරත්තයක් සඳහාම	20 0
4.	සෑම අත් කරත්තයක්/ රෝද තුනේ මෝටර් රථයක් සඳහා	10 0
5.	සෑම රික්ෂෝවක් සඳහාම	7 50
6.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහාම	15 0
7.	සෑම අලියෙකු සඳහා	50 0

(2.) රෝදවල විෂ්කම්භය අඟල් 26ට නොවැඩි ළමා වාහන, වීල් බැරැක්ක, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා භාවිතා කරන අත්කරත්ත සහ වෙළෙඳ කටයුතු සඳහා භාවිතා නොකරන අත්කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළෙඳ කටයුතු" යන යෙදුමට, යම් වෙළෙඳ ව්‍යාපාරයකට හෝ කර්මාන්තයකට සම්බන්ධ ව, විකිණීම සඳහා වුව ද අන්‍ය කාර්යයක් සඳහා වුව ද, යම් භාණ්ඩයක් හෝ බඩු ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය කිසිවක් හෝ ගෙනයෑම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 211/5

පුත්තලම නගර සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 165ඇ වන වගන්තියේ 1 වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන පුත්තලම නගර සභාවේ ලේකම් එල්. බී. ජී. ප්‍රීතිකා වන මම, එකී පනතේ 165ඇ වගන්තියේ 1 වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.12 දිනැති අංක Puuc/2024/11/2495 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. ජී. ප්‍රීතිකා,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පුත්තලම නගර සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින,
පුත්තලම නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

255 වැනි අධිකාරය නගර සභා ආඥාපනතේ 165ඇ. වගන්තියේ 1 වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභා ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) එම ඉඩම් විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ,

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය පහෙන් එකකට (1/5) අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහක (0.5%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පුත්තලම නගර සභාවට ගෙවිය යුතු බවට විධානය කළයුතු යැයි මම යෝජනා කරමි.

12 - 211/6

පුත්තලම නගර සභාව

2025 වර්ෂය සඳහා සේවා සඳහා ගාස්තු පැනවීම

255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 129 හා 130 වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටුකරන පුත්තලම නගර සභාවේ ලේකම් එල්. බී. ජී. ප්‍රීතිකා වන මම, එකී පනතේ 129 හා 130 වගන්තීන්හි විධිවිධාන ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.11.12 දිනැති අංක Puuc/2024/11/2496 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. බී. ජී. ප්‍රීතිකා,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පුත්තලම නගර සභාව.

2024 නොවැම්බර් මස 12 වැනි දින,
පුත්තලම නගර සභා කාර්යාලයේ දී ය.

තීරණය

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 129 හා 130 වගන්ති යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ පුත්තලම නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හා එකී ආඥාපනතේ 27 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පුත්තලම නගර සභා බල ප්‍රදේශය තුළ ජනතාවට හා ඉන් පිටත සේවාවන් සැපයීම වෙනුවෙන් ඉහත බලතල වලට අනුව පහත උපලේඛනයට අනුව එක් එක් අයිතමයන් සඳහා ගාස්තු පනවා 2025 වර්ෂය සඳහා මෙම ගාස්තු නගර සභාවට ගෙවිය යුතු බවටත් නියම විය යුතු බවටත්, මම යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*ශීර්ෂය*	*කාලය*	*ප්‍රමාණය*	*මුදල රු. ශත*
01.	**රෙදි/ රෙක්සීන් බැනර්**			
	රෙදි/ රෙක්සීන් බැනර් (වැඩසටහන්/ උත්සව)	දින 07ක් සඳහා	ච. අ. 01	50 0
	රෙදි/ රෙක්සීන් බැනර් (වාණිජ්‍යමය කටයුතු)	දින 03ක් සඳහා	ච. අ. 01	100 0
	රෙදි/ රෙක්සීන් බැනර් (වාණිජ්‍යමය කටයුතු)	දින 07ක් සඳහා	ච. අ. 01	150 0
	කොඩි/ පථාක	දින 01ක් සඳහා	එකක්	100 0

අනු. අංකය	ශීර්ෂය	කාලය	ප්‍රමාණය	මුදල රු. ශත
02	**ස්ථිර බෝඩ්/ ප්‍රදර්ශක පුවරු**			
	ස්ථිර බෝඩ්/ ප්‍රදර්ශක පුවරු (බිත්තියක, වහලයක, භූමිය මත)	මාස 01ක් සඳහා	ච. අ. 01	100 0
	ස්ථිර බෝඩ්/ ප්‍රදර්ශක පුවරු (බිත්තියක, වහලයක, භූමිය මත)	මාස 03ක් සඳහා	ච. අ. 01	100 0
	ස්ථිර බෝඩ්/ ප්‍රදර්ශක පුවරු (බිත්තියක, වහලයක, භූමිය මත)	මාස 06ක් සඳහා	ච. අ. 01	150 0
	ස්ථිර බෝඩ්/ ප්‍රදර්ශක පුවරු (බිත්තියක, වහලයක, භූමිය මත)	වර්ෂ 01ක් සඳහා	ච. අ. 01	200 0
	**නගර සභා භූමියක ස්ථිර බෝඩ්/ ප්‍රදර්ශක පුවරුවක් ප්‍රදර්ශනය කරන විට දී, ඉහත ගාස්තුවලට අමතරව බිම් කුලිය අය කළ යුතු යි.	වර්ෂ 01ක් සඳහා		10,000 0
03	ලෑල්ලක් හෝ අධාරකයක් මගින් වාහනයකට සම්බන්ධකර ප්‍රදර්ශනය කරන පුවරුවක් (වාණිජමය)	දින 01ක් සඳහා	ච. අ. 01	100 0
04	චිත්‍රපට දර්ශන ප්‍රචාරක පුවරු	දින 01ක් සඳහා	ච. අ. 01	250 0
05	ඩිජිටල් ජංගම ප්‍රදර්ශන පුවරු (Digital Projector Screen)	දින 01ක් සඳහා	එකක්	5,000 0
06	1. ඩිජිටල් වෙළඳ ප්‍රචාරක පුවරු	වර්ෂ 01ක් සඳහා	ච. අ. 01	500 0
	2. මුදල් අයකර කරන වෙළඳ ප්‍රචාරක ඩිජිටල් පුවරු සඳහා	වර්ෂ 01ක් සඳහා	ච. අ. 01	500 0
	**මීට අමතරව බිම් කුළි අය කළ යුතුයි	වර්ෂ 01ක් සඳහා		10,000 0
07	1. ගොඩනැගිලි අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තුව	-	එකක්	1,000 0
	2. පරීක්ෂණ ගාස්තුව	-	එකක්	3,000 0
08	1. අනුබෙදුම් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තුව	-	එකක්	1,000 0
	2. පරීක්ෂණ ගාස්තුව	-	එකක්	3,000 0
09	1. අනුකූලතා සහතික ලබා දීමේ අයදුම්පත්‍ර ගාස්තුව	-	එකක්	1,000 0
	2. පරීක්ෂණ ගාස්තුව	-	එකක්	3,000 0
10	වීථිරේඛා අයදුම්පත්‍ර ගාස්තුව	-	එකක්	1,100 0
11	වෙළඳ බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තුව	-	එකක්	200 0
12	දේපළ වරිපනම් අයිතිය මාරු කිරීමේ අයදුම්පත්‍ර ගාස්තුව (ATD)	-	එකක්	1,000 0
13	**නගර සභා දේපළවල බදු අයිතිය මාරු කිරීම**			
	i. අයදුම්පත්‍ර ගාස්තුව	-	ච. අ. 01 ක් සඳහා	1,000 0
	ii. ගිවිසුම් අලුත් කිරීමේ ගාස්තුව	වර්ෂ 01 ක් සඳහා	එකක්	5,000 0
14	**පරිසර බලපත්‍ර ලබා දීම**			
	i. පරිසර බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තුව	-	-	100 0
	ii. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව	වර්ෂ 01ක් සඳහා	-	1,375 0
	iii. පරීක්ෂණ ගාස්තුව :			
	(1) රු. ලක්ෂයට අඩු			1,000 0
	(2) රු. 100,001.00 සිට 200,000.00			1,500 0
	(3) රු. 200,001.00 සිට 500,000.00			2,500 0
	(4) රු. 500,001.00 සිට 1,000,000.00			5,000 0
	(5) රු. 1,000,001.00 සිට 1,500,000.00			7,500 0
	(1) රු. 1,500,000.00 ට වැඩි			10,000 0

අනු. අංකය	*ශීර්ෂය*	*කාලය*	*ප්‍රමාණය*	*මුදල රු. ශත*
15.	**මහජන පුස්තකාල ගාස්තු අය කිරීම**			
	i. පුස්තකාල අයදුම් පත්‍ර ගාස්තුව	-	එකක්	50.00
	ii. පුස්තකාල සාමාජික ගාස්තුව (පළමු වර්ෂයේ දී)	වර්ෂ 01ක් සඳහා	එකක්	100 0
	iii. සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව	වර්ෂ 01ක් සඳහා	එකක්	100 0
	iv. නගර සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සඳහා තැන්පත් ගාස්තුව	වර්ෂ 01ක් සඳහා		1,000 0
	v. පොත් සඳහා ප්‍රමාද ගාස්තු	දින 01 ක් සඳහා	එකක්	5 0
	** අස්ථානගත වන පොත් සඳහා ගාස්තු අය කිරීමේදී පොතේ වටිනාකම, ප්‍රමාද ගාස්තුව සහ නැවත සපයා ගැනීමේ ගාස්තුව ලෙස පොතේ වටිනාකමෙන් 25% ක් අය කෙරේ.			
16.	**නගර සභා ඉඩම් කුළියට දීම**			
	i. නගර සභා ඉඩම් කුළියට දීම (පොදු රැස්වීම් සඳහා)	දින 01ක් සඳහා	එකක්	5,000 0
	ii. නගර සභා පොදු ක්‍රීඩාංගනය හැර නගර සභා බල ප්‍රදේශයේ පවතින වෙනත් ක්‍රීඩාංගන හෝ පොදු ස්ථාන (වෙට්ටුකුලම ක්‍රීඩාංගනය/හුදා පල්ලිය ක්‍රීඩාංගනය/ඉජිතුමා ක්‍රීඩාංගනය/ වාන හන්දිය හා පිරිස් එක්රැස්විය හැකි ස්ථාන)	දින 01ක් සඳහා	එකක්	5,000 0
17.	**වෙරළ උද්‍යානය වොලිබෝල් ක්‍රීඩාංගනය**			
	i. වොලිබෝල් තරග	පැය 12ක් සඳහා	-	6,000 0
	ii. වොලිබෝල් තරග	පැය 6ක් සඳහා	-	3,000 0
	iii. වොලිබෝල් පුහුණු වැඩසටහන්/පුහුණු තරග	පැය 12ක් සඳහා	-	2,000 0
	iv. වොලිබෝල් පුහුණු වැඩසටහන්/පුහුණු තරග	පැය 6 ක් සඳහා	-	1,000 0
	v. වොලිබෝල් ක්‍රීඩාංගනය සඳහා තැන්පත් මුදල	දින 01 ක් සඳහා	-	5,000 0
18.	**වෙළෙඳ ප්‍රචාරණ** (Business Promotion)			
	i. කුඩයක්	දින 01ක් සඳහා	එකක්	500 0
	ii. තාවකාලික කුටි/කුඩාරම් මගින් වෙළෙඳ කලාපය තුළ (In the business zone) වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සඳහා			
	ව. අ. 6 x 6	දින 01ක් සඳහා	එකක්	1,000 0
	ව. අ. 10 x 10	දින 01ක් සඳහා	එකක්	3,000 0
	ව. අ. 10 x 20	දින 01ක් සඳහා	එකක්	6,000 0
	ව. අ. 20ට වැඩි	දින 01ක් සඳහා	එකක්	10,000 0
